## 2020/03/10 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/03/10 දින පෙ.ව. 9.00 ට  නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2020.03.10 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. අද 2020 මාර්තු මස 10 වැනිදා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම පවත්වන මේ අවස්ථාවට සහභාගි වී සිටින ගරු උප සභාපතිතුමා ඇතුලු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාම මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මම කවදත් බලාපොරොත්තු වෙන පරිදි සභාව ඉදිරියට කරගෙනයාමට ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමින් මගේ පිළිගැනීමේ කතාව අවසන් කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

**(අ)02. 2020.02.11 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2020.02.11 දින පැවති මහා සභාවේ සභා වාර්තාව, සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු **මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. ස්කවේටර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ඉල්ලීම යන මැයෙන් යූ.ජී. ශ්‍රීමාල් සුරංග මහතා විසින් යොමු කරන ලද 2020.02.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. ආගමික ස්ථාන සඳහා ජල පහසුකම් ලබා ගැනීම යන මැයෙන් ශ්‍රී සිත්තිවිනායගර් කෝවිල් කමිටුව විසින් ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා මගින් යොමු කරන ලද 2020.01.21 දිනැති ලිපිය සභාගත කරන ලදී.

03. උඩුගම නැගෙනහිර ඇටිකෙහෙල්කන්දපාර සඳහා සිළිංඩරයක් ලබා ගැනීම යන මැයෙන් ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් යොමු කරන ලද 2020.03.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. ටොෂිබා 2309 A ඡායා පිටපත් යන්ත්‍රයේ ටොනර් කාට්‍රිජ් ලබා ගැනීම සම්බන්ධව ගා/නාප්‍රා/ගි02 විසින් යොමු කරන ලද 2020.03.02 දිනැති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

05. භූගත වැලිකැණීමක් සම්බන්ධව විරෝධය දැක්වීම යන මැයෙන් කැටගොඩ පංවිල ජනතාව හා පාසල් ප්‍රජාව විසින් යොමු කරන ලද 2020.03.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

06. උඩුගම උප මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම යන මැයෙන් ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යොමු කරන ලද 2020.03.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

I. නාගොඩ නගරය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා ඒ අසළ ඇළ මාර්ගයට යාබඳව ඇති අලුත්ගහකන්ද ඉඩම රජයට පවරා ගෙන ඉදිරි සංවර්ධන කටයුතු කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

II. මිය ගිය අයාලේ යන ගවයා වල දැමීම සඳහා ස්කවේටර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් යූ.ජී. ශ්‍රීමාල් සුරංග මහතාට රු. 4000.00 ක මුදලක් ලබාදීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

III. නාගොඩ ප්‍රාදේශීය සභාවේ භාවිතා කරන ටොෂීබා 2309 A ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ලැබී ඇති උපදෙස් අනුව ටොෂීබා ඔර්ජිනල් ජෙනුවින් ටොන්ර් කාට්ලේජ පමණක් මිළදී ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

IV. දැනට පවතින දැඩි නියං තත්වය හේතුවෙන් ආපදාවට පත්වී ඇති බල ප්‍රදේශයේ ජනතාවට සහන සැළසීම සඳහා සභා අරමුදලින් රු. 200000.00 ක් වෙන් කිරීමටත්, ආපදාවට ලක්ව ඇති ජනතාවගේ ජල අවශ්‍යතා සපුරා දීම සඳහා ජල බවුසර් හා ජල ටැංකි ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රමාණවත් රියදුරන් නොමැති බැවින් සේවා අවශ්‍යතාවය මත 2020.03.13 දින සිට තාවකාලික රියදුරකු යොදවා ගැනීමටත්, යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

V. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

**අංක 01 සිට 36 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**<u>2020.03.10 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.2020 පෙබරවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 8443.15 |
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීරණ කොරිඩෝව | - රු. 514.50 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 1081.80 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 294.90 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 587.70 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1905.30 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 404.70 |
| 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 258.30 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1429.50 |

**02.ශ්‍රී/ස ලංකාබෙල් සමාගම**

0915701722 -උප සභාපති නිවසේ දුරකථන බිල්පත පියවීම - රු. 613.02

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.02.25) - රු. 61.30

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.01.17 – 2020.02.19) -රු. 6260.60

33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.01.17- 2020.02.19) -රු. 1720.29

**05. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. බරවාහන රියදුරු බලපත්‍රය අලුත් කිරීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය - රු. 2600.00

ii. උඩුගම බස්නැවතුම්පල කඩකාමර සඳහා වැසිකිලියක් ඉදිකිරීම කර්මාන්තයේ පරිපාලන වියදම් ලබා ගැනීම - රු.17507.00

**<u>06. අතිකාල දීමනා ගෙවීම</u>**

**<u>2020 ජනවාරි මස</u>**

| | | |
|---|---|---|
| එම්.එම්.හේවාවිතාන මිය | - කළමනාකරණ සහකාර | - රු. 896.00 |
| චන්දිමා සෙනවිරත්න මිය | - කළමනාකරණ සහකාර | - රු. 1855.53 |
| කේ.ජී.ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු. 942.00 |

**<u>2020 පෙබරවාරි මස</u>**

| | | |
|---|---|---|
| ඩිලානි චන්ද්‍රප්‍රභා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 1792.00 |
| එම්.එම්.හේවාවිතාන මිය | - කළමනාකරණ සහකාර | - රු. 2688.00 |
| චන්දිමා සෙනවිරත්න මිය | - කළමනාකරණ සහකාර | - රු. 927.76 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |

| | | |
|---|---|---|
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 9046.40 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8500.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8666.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු.10189.80 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 8082.40 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8592.80 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8589.00 |
| යූ.වී සිරිපාල මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2310.00 |
| යූ.වී. උපනාම මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1458.96 |
| අයි.ටී.ඉන්දික කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2320.20 |
| උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2062.40 |
| එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1788.40 |
| ඩී.සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 2873.85 |
| කේ.ජී.ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු. 2161.18 |
| කේ.පී.ඒ ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4176.36 |
| චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 6018.21 |
| රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4993.75 |
| එම්.එම්. මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2112.49 |

**07 .2020 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**2020 මාර්තු මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරි | - රු. 530.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1177.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 474.00 |

**2020 පෙබරවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 6000.00 |
| සී.දයාවංශ මිය | -ලේකම් | - රු. 550.00 |
| දිලිනි දිසානායක | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 926.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | -රු. 6790.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 2330.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1050.00 |
| යුරේකා මල්කාන්ති | - සංවර්ධන නිලධාරී | - රු. 500.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| නිරෝෂා සඳමාලි මිය | - පෙර පාසල් ගුරු | - රු. 1760.00 |
| දිල්රුක්ෂි කුමාරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 880.00 |

| | | |
|---|---|---|
| ශ්‍රියානි කිරින්දගේ මිය | - පුස්තකාලයාධිපති | - රු. 894.00 |
| ඩබ්.ඒ. ශාන්ත මයා | - සංවර්ධන නිලධාරී | - රු. 980.00 |
| ජී.ඉෂානි දීපිකා මිය | - පරිගණක ක්‍රියාකරු | - රු. 2640.00 |
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 880.00 |
| ඩී.ජී. තිලානි මේබලා මිය | - පෙරපාසල් ගුරු | - රු. 1760.00 |

**<u>2020 ජනවාරි මස ගමන් වියදම්</u>**
**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| එම්.එම්.හේවාවිතාන මිය | - කළමනාකරණ සහකාර | - රු. 1760.00 |

**08. චන්ද්‍රිකා දයාවංශ මිය, නාගොඩ ප්‍රාදේශීය සභාව**

නිවාඩු දිනයන්හි රාජකාරියේ යෙදීම වෙනුවෙන් වැටුප් ලබා ගැනීම - රු. 7029.75

**09. පී.ජී.අයි.ලක්මාලි මිය, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගාල්ල**

භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා වූ පැමිණීමේ දීමනා ගෙවීම - රු. 2754.00

**10.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**
**<u>2020 ජනවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 100 | - රු. 10400.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 33 ක් | - රු. 3432.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 30 ක් | - රු. 3120.00 |
| Lo 3592 ලොරි බවුසරය ඩීසල් ලීටර් 30 | - රු. 3120.00 |
| ඩෙංගු මර්ධන ධූමායන කටයුතු සඳහා පෙට්‍රල් ලීටර් 8 | - රු. 1046.00 |
| ඩෙංගු මර්ධන ධූමායන කටයුතු සඳහා ඩීසල් ලීටර් 40 | - රු. 4160.00 |
| **එකතුව** | **- <u>රු. 25328.00</u>** |

**11. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**
**<u>2020 ජනවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් | - රු. 62400.00 |
| DS Oil 2L | - රු. 1590.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 250 ක් | - රු. 26000.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 220 ක් | - රු. 22880.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 145 ක් | - <u>රු. 15080.00</u> |
| **එකතුව** | **- <u>රු.127950.00</u>** |

**12. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**
**<u>2020 පෙබරවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 115ක් | - රු. 11960.00 LL |
| 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 310 ක් | - රු. 32240.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 423 ක් | - රු. 43992.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 118 ක් | - රු. 12272.00 |
| තණකොල කපන යන්ත්‍රය පෙට්‍රල් ලීටර් 25 | - රු. 3425.00 |
| 2T Oil 1L | <u>- රු. 580.00</u> |
| - | |
| **එකතුව** | **- <u>රු.104469.00</u>** |

**13. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**14.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 මාර්තු මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2020 පෙබරවාරි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2310.00

**15.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක එල් 13814 ට අදාළව 2020.02.25 හා නඩු අංක එල් 16242 ට අදාළව කැඳවන ලද සහ 2020.03.20 දින කැඳවීමට නියමිත නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු -රු. 6000.00

**16. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා මාර්තු මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**17. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 පෙබරවාරි) - රු.13000.00

**18. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2020 පෙබරවාරි - රු. 5600.00

**19. ලයන් ෆොටෝ , කළුවැල්ල, ගාල්ල**

පෙරපාසල් ගුරුවරුන්ගේ රාජකාරි හැඳුනුම්පත් සකස් කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 2050.00

**20. බී.එස්.ඒ. ලහිරු ප්‍රභාත්, උඩුගම**

උඩුගම ක්‍රීඩාංගණයේ පැවැත්වූ සර්ක්ස් සංදර්ශනයට අදාලව විදුලි ගාස්තුව ලෙස තැන්පත් කල මුදලින් ඉතිරි මුදල් නැවත ගෙවීම - රු. 8058.10

**21. යූ.වික්‍රමසේකර, ලෝරන්ස් ෆැෂන්, උඩුගම**

පෙර පාසල් දරුවන් සඳහා නිල ඇඳුම් ලබා දීමේ බිල්පත - රු.262500.00

**22. ඊබේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම**

USB හා key board එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 650.00

23. අතුකෝරල ඉලෙක්ට්‍රිකල් සමාගම, පිටිගල

වොට් 23 සීඑෆ්එල් බල්බ් 20 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 8800.00

**24. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 18580.00

**25. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**

නිදහස් දුම්රිය ගාස්තු ගෙවීම

එම්.එම්.මහින්දදාස මයා ගාල්ල-අනුරාධපුරය - රු. 2915.00

කේ.කේ.අවන්ත පද්ම මයා ගාල්ල - බෙලිඅත්ත - රු. 1280.00
අයේෂ් ශානක මයා ගාල්ල - මැදවච්චිය - රු. 4200.00
මානෙල් අබේරත්න මිය ගාල්ල - නුවර - රු. 1700.00

**26. ලංකා හොස්ට් වෙබ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, කිරිබත්ගොඩ**
නාගොඩ ප්‍රා දේශිය සභා නිල වෙබ් අඩවියේ 2 GB Space සහ nagodaps.lk
ඩොමෙනියේ නම සඳහා මුදල් ගෙවීම - රු. 7000.00

**රජයේ ආධාර**
**පළාත් නිශ්චිත**
**27. යටලමත්ත ගොවි සංවිධානය, යටලමත්ත**
ඌරල ආරලිය පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමේ රැඳවුම් මුදල් ගෙවීම - රු. 9573.73
නාගොඩ වළකුඹුර 70 කන්ද මාර්ගය ප්‍රතිසංස්කරණ කිරීමේ කර්මාන්තයේ ගෙවීම - රු. 512578.44

**28. සිතමු පැරකුම් කාන්තා සමිතිය , ඌරල දකුණ, නැහිනිගල**
ඌරල මධ්‍යම හක්හිටියාගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ ගෙවීම - රු. 541476.00

**29. කුරුපනාව එකමුතු ජේෂ්ඨ පුරවැසි සංවිධානය, කුරුපනාව, නාගොඩ**

ඇඩ්ඩින් මයාගේ නිවස දෙස සිට ජයවීර මයාගේ නිවස දක්වා වූ ගඟ අද්දර මාර්ගය
සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු.654973.00

**කොතලාවල විහාරස්ථානයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් ගෙවීම් (දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා අතිගරු ජනාධිපතිතුමාපැමිණීම නිමිත්තෙන්)**
**30. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
ඉදිකිරීම් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා වූ බිල්පත - රු. 101948.00

**31. සාරස ලී වෙලදසැල, මාපලගම**
ඇල්බීසියා ලී මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 3525.00

**32. ශක්ති කොන්ක්‍රීට් වර්ක්ස්, මාපලගම**
ගඩොල් මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 10400.00

**33. විහඟ ග්ලාස් සෙන්ටර්, උඩුගම**
කුලී පදනම මත පලංචි හා වතුර ටැංකි ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 1600.00

**34. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
මැජික් බෙන්ඩ් ලබා දීම වෙනුවෙන් බිල්පත - රු. 1050.00

**35. සම්පත් ඇලුමිනියම්, ෆැබ්රිකේටර්ස්,**
දොරවල් දෙකක් මිළදී ගැනීම වෙනුවෙන් - රු. 32000.00

**36. යූ.පි.මනෝජ්,**
කම්කරු කුලී ගෙවීම් - රු. 16100.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 04 දක්වා ඇති ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සභාව පිලිගැනීම සුදුසු බව යෝජනා කරමි.**

**2020.03.10 දින පැවැත්වෙන මහ සභාව සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ විස්තරය**

**01. සභාපති , නාගොඩ ප්‍රාදේශීය සභාව**

සුළුඅක්මුදල් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 4185.00

**02. එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන් මයා,**

උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම

2020 ජනවාරි - රු. 5940.00

**03. නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා,**

මොරගල්මුල්ල එක්සත් අන්‍යොන්‍යාධාර සමිතිය මගින් ප්‍රා දේශීය සභාවට පවරා දීමට අදාළ පර්චස් 10 ක ඉඩම් කොටස සඳහා මුද්දර ගාස්තු සහ නොතාරිස් ගාස්තු ගෙවීම - රු. 13500.00

**04. ශ්‍රී ලංකා ටෙලිකොම්. පී.එල්.සී**

2020 ජනවාරි මස දුරකථන බිල්පත් පියවීම

0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 422.98

0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 6553.12

**2019 ඔක්තෝම්බර් මස දුරකථන බිල්පත් පියවීම**

0912231201 - සභාපතිතුමාගේ නිවස - රු. 3990.12

**ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සභාව පිළිගත යුතු බවට ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

.

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

I. කැප්පිටියාගොඩ සෙනවිරත්න මාවත අසළ නාන තොටුපල සංවර්ධනය කිරීම -රු.4650.00

**ඉහත සඳහන් තොටුපළ සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

II. තල්ගස්වල බදාදා සතිපොළ සංවර්ධනය කිරීම - රු. 1000000.00

**ඉහත සඳහන් බදාදා සතිපොළ සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

III. කොතලාවල රාජගිරි ලෙන් විහාරස්ථානයේ වැසිකිලි පද්ධතිය ඉදි කිරීම - රු. 426133.50

**ඉහත සඳහන් වැසිකිලි පද්ධතිය සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**ඉවත දමන ලද CFL බල්බ් විකිණීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | එම්.ඩී. චන්ද්‍රසේන, වැලිවිටිමෝදර, ගිංතොට | ඩබ්ලිව්.ප්‍රභාත් දුෂ්මන්ත, නයිදුව, මාවඩවිල | එම්.ජයන්ත කුමාර, අංහන්දිය, රත්ගම |
|---|---|---|---|
| ඉවත දමන ලද CFL බල්බ් | රු. 2.00 | රු. 2.50 | රු. 3.00 |

**ඉවත දමන ලද CFL බල්බ් විකිණීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ එම්.ජයන්ත කුමාර, අංහන්දිය, රත්ගම විසිනි. ඒ අනුව ඉවත දමන ලද CFL බල්බ් එම්.ජයන්ත කුමාර, අංහන්දිය, රත්ගම වෙත ලබා දීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

i. 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේ වෙන්දේසි කිරීමට තීරණය වූ හා වෙන්දේසි කරන ලද භාණ්ඩ ලේඛනය සහ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

ii. 2020.02.19 දින නාගොඩ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද පුස්තකාල උපදේශන කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 පෙබරවාරි මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරංශය සළකා බැලීම සඳහා මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 පෙබරවාරි මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරංශය සළකා බැලීම සඳහා මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 පෙබරවාරි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා මාර්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි අපේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා දිළිඳු කමින් වැඩිම ගම්මානය විදිහට හෝමදොල ගම්මානය තෝරාගෙන. හෝමදොලට පැමිණිලා අපි වෙනුවෙන් කරපු මෙහෙවරට ගෝඨාභය ජනාධිපතිතුමාට අපගේ හෝමදොල ගම්මානයේ ගෞරවයත් ප්‍රාදේශීය සභාවේ සියලුම දෙනාගේ ගෞරවයත් ප්‍රථමයෙන්ම පිරිනමනවා. ගරු සභාපතිතුමනි දෙවනුව ගරු සභාපතිතුමන්ට ස්තූතිය පුද කරන්න ඕන. මොකද සභාවෙ සල්ලි නැති වෙලාවක සභාවෙ අරමුදලින් නොවුනත්, අපට සල්ලි ලබාදීලා. හරියට වැසිකිලියක්වත් නොතිබුන හෝමදොල තියෙන දුෂ්කරම පන්සලට බාත්රූම් සහිතව ටොයිලට් එකක් ඉතාමත් හොඳ විදිහට සකස්කර දීම වෙනුවෙන් හා නිතර දෙවේලෙ ඒ පන්සලට ගිහිල්ල හොයල බලල කරපු ඒ වැඩකටයුත්තට සභාපතිතුමාට නිහතමානීව ගෞරවය පුදකරන්න කැමතියි. ඒ වගේම නිතර දෙවේලෙ ඒ ගැන සොයා බලල කටයුතු කරපු උප සභාපතිතුමාටත් මාගේ ගෞරවය මේ වෙලාවෙ පිරිනමනවා. ඒ වගේම විශේෂයෙන් ඒ දවස් ටිකේ නිදිවරාගෙන තමන්ගෙ රාජකාරියට එහා ගියපු යුතුකම් කොටසක් කළ කාර්යය මණ්ඩලයටත් ස්තූතිය පුද කරන්න ඕන. මන්ත්‍රීවරු කීහිපදෙනෙක් කීහිප අවස්ථාවක පන්සලට ගිහිල්ල ඒ ගැන සොයල බලල කටයුතු කළා. ඒ අවස්ථාවට සහභාගි වුන නොවුන සියලු මන්ත්‍රීතුමන්ලාට මේ වෙලාවෙ ගෞරවය පිරිනමනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි හෝමදොලට ලොකු අවස්ථාවක්, හෝමදොල කොට්ඨාසෙ මන්ත්‍රීවරයා විදිහට කාටවත් නොලැබුන අවස්ථාවක් අපට ලබාදුන්න ගෝඨාභය ජනාධිපතිතුමාට නැවත වතාවක් ස්තූතිය පුදකරන්න ඕන. අපේ ඉල්ලීමකට නොවුනත් මන්ත්‍රීවරයෙක් විදිහට මට ලොකු අවස්ථාවක් මගේ කාලය තුල ලැබුන ලොකු වාසනාවක්. ගරු ජනාධිපතිතුමා අපට ත්‍රී රෝද රථයකුත් ලබා දුන්නා. ඒකත් මේ අවස්ථාවෙ සිහිපත් කරනවා. ගරු ජනාධිපතිතුමා වැඩ කරන නායකයෙක් රටට අවශ්‍යම නායකයෙක් කියපු විදිහටම උඩුගම රෝහලට බවුසරයක් ලබා දුන්නා. ආවාස ගෙය සකස් කරල දුන්නා. ඒ වගේම සියලු රාජ්‍ය නිලධාරීන්ගෙන් වැඩ ගන්න නායකයෙක්. ඒකත් මේ වෙලාවෙ මතක් කරනවා. ගරු සභාපතිතුමනි නැවත වාරයක් ජනාධිපතිතුමාට ගෞරවය පුද කරනවා.

ඊලගට ගරු සභාපතිතුමනි අපි ගිය අධ්‍යයන චාරිකාව පිළිබඳව කතා කරන්න ඕන. සභාපතිතුමා ඉතාමත් හොඳ අවස්ථාවක් ලබා දුන්නා. ඒ වගේම මන්ත්‍රීවරු 20 ක් විතර සහභාගි වුනා. එහිදී ගෞරවයක් විදිහට මතක් කරන්න ඕන. අපේ මන්ත්‍රීවරියන් හතර දෙනෙක් සහභාගි වුනා. අපට ගෙදරදි අම්මා අක්කා නංගි වගේ කෑම බීම ටික සකස් කරල දුන්නා. තේ එක පවා ලගට ගෙනත් දුන්නා. සියලු දෙනත් එක්ක සහයෝගෙන් හොඳ ගමනක් ගියා. මම හිතන්නෙ සියලු දෙනාම සහභාගි වුනානම් ඉතා හොඳ අවස්ථාවක් අපට එතන පක්ෂ බේදයක් තිබුනෙ නැහැ. වැඩ මුලුවක් විදිහට සහභාගි වෙලා විනෝද වෙලා කටයුතු කළා. ගෞරවයක් විදිහට සභාපතිතුමා උප සභාපතිතුමා මන්ත්‍රීවරු මේ වෙලාවෙ මතක් කරන්න ඕන. ඉතාමත් හොඳ ගමනක් ගිහින් ආවා. ඒ වගේ චාරිකාවක් ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, නැවතත් අපට හෝමදොල ගමට යන්න වෙනවා. ජනාධිපතිතුමා එන අවස්ථාවෙ එතන කිසිසේත්ම පක්ෂ බේදයක් තිබුනෙ නැහැ. ගෞරවයක් විදිහට තරංග මන්ත්‍රීතුමා මතක් කරන්න ඕන. තරංග මන්ත්‍රීතුමා ඒ අවස්ථාවට කිහිප විටක් සහභාගිවෙලා මොකක්ද වෙන්න ඕන කියලා සොයලා බලලා කටයුතු කළා. ඒ වගේම ගරු සභාපතිතුමනි දූරියන් ගහ පිළිබඳව කතා කරද්දි හෙට ඒ ආත්තම්මා මෙතනට කැඳවලා තියෙනවා. එතනදි මම ඉල්ලීමක් කරන්නෙ කොහොම හරි ඒ දූරියන් ගහ ඉවත් කරල දෙන්න කටයුතු කරන්න කියලා. ගරු සභාපතිතුමාට අවසාන වශයෙනුත් මම ස්තූතිය ගෞරවය පුදකරනවා. හොමදොල ගමට ජනාධිපතිතුමා එනවයි කිව්ව අවස්ථාවෙ ඉදලා සභාපතිතුමා

සභාපතිතුමාගෙ කාර්යය ඉතාමත් හොඳින් හොයල බලල ඉෂ්ඨ කළා. වැඩ රාජකාරි බහුලව තිබුනත් උප සභාපතිතුමා කිහිප විටක්ම සහභාගිවෙලා හොයල බලල කටයුතු කළා. ඒ වගේම මන්ත්‍රීවරුත් අපි වෙනුවෙන් ඒ අවස්ථාවට සහභාගිවෙලා සහයෝගය දුන්නා. ඒ පිළිබඳව ස්තූතිය ගෞරවය පුදකරන ගමන් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මමත් මේ පිළිබඳව පහදා දීමක් කළ යුතුයි. පසුගියදා අපේ බලප්‍රදේශයට ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා පැමිණියා. එතුමා පැමිණියේ ගාලු දිස්ත්‍රික්කයේ සංවර්ධන කමිටු රැස්වීම පවත්වන්න. දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම පවත්වන කොට එතුමාගෙ දර්ශනයක් තියෙනවා. එය පවත්වන්න ඕන නගර ආශ්‍රිතව නෙවෙයි රට ඇතුලට ගම ඇතුලට ගිහිල්ල නොදියුනු බල ප්‍රදේශයක පවත්වන්න ඕන කියන අදහස මූලික කරගෙන තමයි 2014 වර්ෂයෙදි සංගණනය අනුව  ගාලු දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩුගම හෝමදොල ග්‍රාම නිලධාරි වසම තෝරගෙන තියෙන්නෙ. ඒ තොර ගැනීමට හේතුව තමයි මේ ප්‍රදේශයේ තියෙන විශාලම ග්‍රාම නිලධාරී කොට්ඨාසය. හෙක්ටයාර් 1600 ක ප්‍රමාණයක විශාලත්වයක් තියෙනවා. පවුල් හයසිය ගණනක් ජීවත් වෙනවා. එයින් පවුල් 311 ක් දමිළ ප්‍රජාව ජීවත් වෙන පවුල් කියල තමයි සඳහන් වෙලා තියෙන්නෙ. පොදු පහසුකම් නොමැතිවීම දරිද්‍රතාවය ඒ තෝරා ගැනීමට මූලික කරගෙන තියෙන්නෙ. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා තීරණය කළා ඒ ග්‍රාම සේවා වසමෙ ගාලු දිස්ත්‍රික්කයේ ඉන්න සියලුම රාජ්‍ය නිලධාරීන්, ලංකාවෙ අමාත්‍යාංශවල ඉන්න සියලුම රාජ්‍ය නිලධාරීන් ලේකම්වරු ගෙන්වලා එතුමාගේ තීරණ ක්‍රියාත්මක කිරීමට. මේ සංවර්ධන ක්‍රියාවලිය කරන්න ඔක්කොම දින 10 ක් හෝ 12ක් තිබුනෙ. නමුත් ඒ අවස්ථාවෙ ප්‍රාදේශීය සභාවට එච්චර බලපෑමක් වුනේ නැහැ. සේරම රාජ්‍ය නිලධාරීන්ගෙ මැදිහත් වීම තුළ තමයි ඒ කටයුතු සිදු වුනේ. විශේෂයෙන්ම ගාලු මහ දිසාපතිතුමා ඇතුලුව නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිසාපතිතුමිය තමයි මූලික වෙලා කටයුතු කළේ.

ඒ  බල ප්‍රදේශයට වාහනයක් ගියාම මාරුවෙන්න බැරි තත්වයක් තිබුනෙ. ඒ නිසා පොලීසිය අසල වාහන තියල ජනාධිපතිතුමා හැර අනිකුත් සියලු නිලධාරීන්  පොදු ප්‍රවාහන සේවයකින් ගෙනියන්න හිටියෙ. පන්සලට ගියාම පන්සලක්ද කියලා හිතුනා. දැන් පන්සලට ගියාම කොහොමද මේ වෙනස් වීම වුනේ කියලා හිතන්න බැහැ. ඒ පාර අයි රෝඩ් ව්‍යාපෘතිය යටතේ කරපු එකක් මගදි නතර කරල තිබුනා. ඒ බල ප්‍රදේශය තනිකර වල් බිහි වෙලා තිබුනෙ. ඒ දවස් 10 තුල පුදුම වෙනස් කිරීමක් කළා. ඒකට ත්‍රිවිධ හමුදාවෙ නිලධාරීන් සහභාගි වුනා විශේෂයෙන් නාවික හමුදාව තමයි පන්සල මේ තත්වයට අරගත්තෙ. පන්සලේ වැසිකිලියක් තිබුනෙ නැහැ. අපට භාර දුන්නා වැසිකිලිය ඉදිකරන්න. දවස් පහයි තිබුනෙ අපට වැසිකිලිය හදන්න. මම කිව්ව අපට මුදල් අවශ්‍ය පහසුකම් නැති නිසා බැහැ කියල. එතන හිටපු නිලධාරි මට කිව්වා සභාපතිතුමා අපි සල්ලි දෙනවා මේක කරන්න කියලා. මම අපේ නිලධාරීන් සමග මේ පිළිබඳව කතා කළා. අපේ නිලධාරීන් නොපැකිලිවම හරි සභාපතිතුමා අපි කරන්නම් අපිට පුලුවන් කියල වැඩේ පටන් ගත්තා. ඒ වෙලාවෙ ඉඳලම දිවා රෑ නොබලා වැඩකටයුතු කළා. අපේ කම්කරුවො නිලධාරි ඍජු ශ්‍රමය පදනම යටතේ අපි කළා ඒක ලොකු ජයග්‍රහනයක්. වීනෙ රෝහලක් හැදුවා පැය 48 කින් ඊටත් වඩා ජයග්‍රහනයක් කළා කියලයි මම හිතන්නෙ. හෝමදොල පන්සලේ සකස් කල ඒ වැසිකිලි පද්ධතිය පිළිබඳව මම ලේකම්තුමිය ඇතුලු නිලධාරින්ට, තාක්ෂණ නිලධාරි කම්කරුවො සේවකයො සියලු දෙනාට ඒ කරපු සේවයට මම ගරු කරනවා. ජනාධිපතිතුමා ආපුවම අපේ යෝජනා අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළාම ඒ වෙලාවෙම උඩුගම රෝහලට වතුර බවුසරයක් ලබා දීමට කටයුතු කළා. හාමුදුරුවන්ට ගමනාගමන පහසුකම් නැත කිව්වාම ත්‍රීරෝද රථයක් ලබා දීමට කටයුතු කළා. ඒ පන්සලට ගොඩක් දේවල් ලැබුනා. මේකෙ විශේෂත්වය තියෙන්නෙ පෙරදී සංවර්ධන කමිටු රැස්වීමක් තියෙන කොට ඉඩ කඩ මදි නිසා ටෙන්ට් ගහන්න ඕන.

ඒකට ලක්‍ෂ 18 ක් 20 ක් විතර වියදම යනවා. නමුත් මෙදා ඒ වියදම ශූන්‍යයි. හේතුව අතිගරු ජනාධිපතිතුමා ආවත් පන්සල දෙපැත්තෙ ගැහුවෙ ටෙන්ට් රෙදි සාමාන්‍ය පුටු තියල තිබුනෙ. ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමා වෙනසක් කළා. එතුමත් සවස තුන වෙනකම් සාමාන්‍ය පුටුවක වාඩිවෙල තමයි ප්‍රශ්න විසඳුවෙ. ජනාධිපති ලේකම්ගෙ ඉඳල රටේ ඉන්න ඉහළම රාජ්‍ය නිලධාරි එතන හිටියා. ඒ සියලු දෙනාම සතුටු වුනා මේ ගත්ත ක්‍රියාමාර්ගය පිළිබඳව. ඉතිං අපි ගරු කරනවා ඒ ලක්‍ෂ 17,20,25 වියදම් කළේ ගම වෙනුවෙන් පන්සල වෙනුවෙන් ගමේ සංවර්ධනය වෙනුවෙන් මේ අවස්ථාවෙ එම ප්‍රදේශයේ මහජන නියෝජිතයා හැටියට සමන් මන්ත්‍රීතුමා තමයි බොහොම සතුටු වෙන්නෙ.

ඊලගට අපර් හෝමදොල පාසලට ගොඩනැගිල්ලකට පස්සෙන්දම ඇවිල්ල ඇස්තමේන්තු සකස් කළා. ගෝනදෙනිය පාසලේ අඩුපාඩු දැකලා ඒකට අවශ්‍ය ගොඩනැගිල්ලක් දෙන්න යෝජනා වුනා. පස්සෙන්දම ඇස්තමේන්තු කරගෙන ගිහින් තියෙනවා. ඉතින් අනවශ්‍ය වියදම් වලින් තොර වෙලා, ඔයවැනි කටයුතු කළා. ඒ නිසා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමාට අපේ ගෞරව ප්‍රණාමය පුදකරනවා. ඒ වගේම මෙයට නායකත්වය දුන් අපේ දිස්ත්‍රික් නායක අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා ඇතුළු දේශපාලන අධිකාරියට ස්තූතිය පුදකරනවා. ඊලගට මම සභාපති හැටියට ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා. ඔබතුමා ජනාධිපතිවෙලා ආපු පළමු සංවර්ධන කමිටු රැස්වීම සිහි වෙන්න අපට නාගොඩ ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ප්‍රධාන නගර දෙක වන උඩුගම සහ නාගොඩ. නමුත් නාගොඩ තමයි ප්‍රධාන නගරය. ප්‍රාදේශීය සභාව, නාගොඩ ජාතික පාසල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැනි මේ සියළුම රාජ්‍ය ආයතන පිහිටි නමුත්. නාගොඩ නගරයේ නාගොඩ හන්දියේ වැසිකිලියක්වත් හදන්න ඉඩ නැති නිසා නාගොඩ නගරය සංවර්ධනය කිරීම සඳහා නාගොඩ නගරයට යාබදව තියෙන පෞද්ගලික ඉඩම් අපට අත්පත් කරල දෙන්න කියලා ඉල්ලීමක් කළා. ඒ වෙලාවෙම එතුමා ජනාධිපති ලේකම් ජයසුන්දර මැතිතුමාට නියෝග කළා. පළවෙනි යෝජනාව හැටියට අපගේ ඉල්ලීම ඉටු කිරීමට පියවර ගන්න කියලා. ඒ නිසා මම ඇත්තටම සතුටු වෙනවා. ජනාධිපතිතුමා මෙහි පැමිණිලා අපේ ඉල්ලීමට ඇහුන්කන් දීම පිලිබඳව. එම කටයුත්ත ඉදිරියෙදි කරයි කියල අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මම ගොවි මහතෙක් හැටියටත් නාගොඩ ගොවිජන සේවා සංවර්ධන කමිටුවෙ සභාපති හැටියටත් මම පළමුවෙන්ම සිහිපත් කරනවා. නාගොඩ ගොවිජන සේවා සංවර්ධන කමිටුවෙන් අප්‍රේල් 02 වෙනිදා අලුත් සහල් මංගල්‍යයක් පවත්වන්න අපි තීරණය කරලා තියෙනවා. මම මන්ත්‍රීතුමාලට වගේම සියලු දෙනාට මතක් කරනවා. ඔබේ ප්‍රදේශයේ කුඹුරු අස්වද්දල තියෙනවා නම් එහි අග්‍රකොටස වෙන් කරල අපට ලබා දෙන්න. පරණතානායම්ගොඩ සහන ගොවි සංවිධානය මගින් අප්‍රේල් 02 වෙනිදා අලුත් සහල් මංගල්‍යයක් සිදු කරන බව ඉතාමත් සතුටින් ඔබ සියලු දෙනාට සිහිපත් කරනවා. ඒ වගේම එදිනට අපගේ විහාරස්ථානයට ඔබගේ පැමිණීම ගෞරවයෙන් යුක්තව බලාපොරොත්තු වෙනවා.

ඊගලට ගරු සභාපතිතුමනි පුස්තකාල කමිටුව විසින් අපි යෝජනා කරපු ඒ යෝජනා මහා සභාවට ඉදිරිපත් කරල මහා සභාවේ අනුමැතිය ඇතිව තීන්දු තීරණ ගැනීම සඳහා තමයි අපි ඉදිරිපත් කළේ. ඒ පිළිබඳව ඔබතුමා ඒවෙලාවෙම මහසභාවෙන් විමසුවා නම් හොඳයි කියලා මම හිතනවා. මොකද පුස්තකාලවලින් අබලි ද්‍රව්‍ය විදිහට ඉවත් කරන පොත්පත් නැවත වෙනත් ආයතනයකට දෙන්න අපි තීරණය කළාට පුස්තකාලයේ සීල් එක යම් ක්‍රමවේදයකට ඉවත් කරල දෙන විදිහ සාකච්චා කරන්න තමයි අපි යොමු කළේ. ඒ වගේම ඒව විනාශ නොකර අබලි ද්‍රව්‍ය එකතු කරන තැනකට ලබාදීලා හෝ

කඩදාසි අපතේ යවන්නෙ නැතුව කටයුතු කරන්න කියන තීන්දු තීරණත් ඇති. ඒ වගේම පිටස්තර අයට පොත් ලබාදීම පිලිබඳව සාකච්ඡා කරලා තීරණ අරගත්තා. ඒ පිළිබඳව අවශ්‍යනම් යොමු කරල තීරණ ගන්න කියලා ඔබතුමාට සිහිපත් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම සිහිපත් කරන්න ඕන. මේ සභාවට ඇවිල්ලා මේ සභාවෙ වටපිට විතරක් දැකල හිටපු අපට ඔබතුමන්ගේ මූලිකත්වයෙන් සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත ඇතිව පසුගියදා අපට අම්පාර නගර සභාවෙ කසළ කළමනාකරණ ව්‍යාපෘතිය නිරීක්ෂණය කරන්න ඉඩ සලසා දීම පිළිබඳව මට හරි සතුටුයි. ඇත්තටම ගරු සභාපතිතුමනි, අම්පාර නගර සභාවට ගියාම එහි ග්‍රාම සේවා වසම් 10 කට කොපමන වැඩ කොටසක් කරල තියෙනවද කියලා අපි දැක්කා. ග්‍රාම සේවා වසම් 10 යි මන්ත්‍රීවරු 10 යි ඉන්නෙ. ඒ කරපු වැඩ පිළිබඳව අපි නිරීක්‍ෂණය කළා. ඒ වගේ වැව්, ඒ වගේ ජල ක්‍රීඩාංගන හදන්න අපට බැරිවුනත්, අපට පුලුවන් ප්‍රමාණයෙන් කසල කළමනාකරනය කරනවානම් වැදගත් වෙනවා. මොකද එතන තිබුන උපකරණවලට ලොකු වියදමක් දරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. කසල වෙන් කරල ඒ කටයුත්ත අපේ බල ප්‍රදේශයේ දැනට පුද්ගලික ආයතනයකින් කරගෙන යනවා. එතුමන්ලට පහර ගැසීමක් නොවෙයි. අපට පුලුවන් අයුරින් සභාවට ආදායමක් ලැබෙන විදිහට ඒ කටයුතු කළා නම් ඉතාමත් වැදගත් වෙනවා. මොකද දුගඳ හමනවා කියන එකට අවශ්‍ය කරන විදිහට ක්‍රමවේද සකස් කරල ඒ ආයතනය විසින් කලමනාකරණය කරල තිබුන විදිහ අපි මැනවින් දැක්කා. අපි සියළු දෙනා සහෝදරත්වයෙන් යුතුව එම ගමනට සහභාගි වුනා. අපට ඒ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට මම ස්තූති වන්ත වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මාපලගම ජනිත් ස්ටෝර්ස් එක ළඟට වීථි ලාම්පුවක් සවි කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද උදේ 5.00 ට ගාල්ල ප්‍රදේශයේ පාසල්වලට යන ළමයින් සියළු දෙනා වාහනවලට සම්බන්ධ වෙන්නෙ මෙම ස්ථානයෙන්. ඒ නිසා එතනට වීථි ලාම්පුවක අවශ්‍යතාවය දැඩිව තියෙනවා. ඒ වගේම රාත්‍රි කාලයේදීත් විශාල මගීන් පිරිසක් සිටින නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරල ඉතාමත් ඉක්මනින් දැන් අලුතින් සවිකරන එලිය වැඩි ලාම්පුවක් සවි කරල දෙන්න. මොකද දැනට තියෙන ලාම්පුවත් අක්‍රිය වෙලා තියෙන්නෙ. ඒ පිළිබඳව අවදානය යොමු කරන්න කියල මම ඔබතුමාට කාරුණිකව සිහිපත් කරනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි පරණතානායම්ගොඩ සභාවෙන් පාලනය වන පෙර පාසලට මේ වියලි කාලගුණය හේතුවෙන් ජල හිඟයක් තියෙනවා. ඒ අසල තියෙන ළිදෙන් මෝටර් 4 ක් විතර සම්බන්ද කරගෙන ඒ අවට අය වතුර ගන්නවා. තේ තවන් හිමියෙක් තවන් සඳහා වතුර ගන්නවා. එහෙම ඔහු පෞද්ගලික තවාන්වලට වතුර ගන්න කොට පෙරපාසලටත් අනිත් අයටත් බීමටවත් ජලය නැතිවෙන තත්වයට පත්වෙනවා. මම පෙර පාසල් පාලිකාතුමියට කියලා ආව දැනුම් දීමක් කරන්න දෙමව්පියන් හරහා ඔහුගේ තවාන්වලට වතුර ගහන එක නවත්වන්න කියන්න කියලා. මේ වියලි කාලගුණයත් එක්ක අපේ ප්‍රදේශයත් ජල අපහසුතා තියෙන ප්‍රදේශයක් හැටියට තමයි හදුන්වන්න වෙන්නෙ. ඒ නිසා ඔබතුමාගේ අවදානය යොමු කරල ජල බවුසර් ලබා දීමේදී මූලිකත්වය ලබා දෙන්න කියන එකත් සිහිපත් කරනවා. අපට තියෙන්නෙ සීමිත බවුසර් ප්‍රමාණයක් ඒ සීමිත ප්‍රමාණයෙන් අපටත් අවශ්‍යතාවය අනුව ඔබතුමාගේ මැදිහත්වීම ලබා දීල ඒ වගේම පෙරපාසල පිළිබඳවත් සොයා බලල කටයුතු කරන්න කියලා මම ගරු සභාපතිතුමාට සිහිපත් කරනවා.

ඒ වගේම අතිගරු ජනාධිපතිතුමන්ගේ මැදිහත්වීම තුලින් සපිරි ගමක් වැඩසටහන යටතේ අපට, ගමට විශාල සංවර්ධනයක් ලබා දීලා තියෙනවා. යන්න බැරුව නිතරම කතාබහට ලක්වෙච්ච සංවර්ධන ගම්මානයට යන පාර අද දවසේ කොන්ක්‍රීට් කරන්න පටන් ගත්තා. යන්න අමාරුම ටික සංවර්ධනය කළා. මට මේ වෙන කොට පුලුවන් කම ලැබිල තියෙනවා. මගීන්ට යන්න පුලුවන් තත්වයට පත් කරන්න. තව සුලු කොටසයි අපට සංවර්ධනය කරන්න තියෙන්නෙ. ඒ වගේම මල්වත්තහේන පාර, හම්බුව පාර කුරුපනාව ෆැක්ටේරිය අසල සංවර්ධනය කල යුතු ස්ථාන මේ වන විට සංවර්ධනය කරලා අවසන්. විකල්ප මාර්ග පද්ධතියක් නොමැති නිසා හම්බුව පාර වැඩ නවත්වලා තියෙනවා. ඒකත් තව සතියකින් විතර වැඩ ආරම්භ කරන්න අපි සැලසුම් කරල තියෙනවා. උඩුමුල්ල ප්‍රදේශයට අරුක්ගොමුව ප්‍රදේශයට ලක්ෂ 10 බැගින් මාර්ග ප්‍රතිසංස්කරණයට මුදල් යොදවලා තියෙනවා. ඒ

වගේම ගරු සභාපතිතුමනි  අපි රජයේ සල්ලි ලැබෙනකම්ම ඉන්න ඕන නැහැ. මම ඊයෙ දවසෙ විශාල ශ්‍රමදානයක් කළා. ග්‍රාම සංවර්ධන සමිතිය අවුරුදු 14 පස්සෙ මම නැවත සක්‍රිය කරල මේ වන විට ගමේ ශ්‍රමදාන 2 ක් කළා. එක ශ්‍රමදානයකට 154 දෙනෙක් සම්බන්ධ වුනා. මාර්ග පද්ධති කිහිපයක් පිළිසකර කර ගැනීමට අපට හැකියාව ලැබුනා. ඊයෙ පෝය දවසේ මගේ පෞද්ගලික මුදල් වැය කරල මැෂින් යොදවලා පුස්සැල්ලකාර මාර්ගය සංවර්ධනය කළා. ගරු සභාපතිතුමනි, මාර්ග සංවර්ධනයට මුදල් යෙදවීමේදී ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න. පුස්සැල්ලකාර මාර්ගයේ තියෙනවා සුද්දගෙ කාලෙ හදපු බෝක්කුවක්. ඒකෙ යටින් හැරිලා ගල් ගැලවිලා තියෙනවා. ඉතාමත් භයානකයි කාර්මික නිලධාරියෙක් යොදවලා ඒ ගැන අධීක්ෂණය කරන්න. නැත්නම් මාර්ගය වහන්න. මොකද එතන යම් අනතුරක් වෙන්න පුළුවන්.  ඒ සම්බන්ධව ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි මුදල් වෙන් කිරීමක් මේ වෙන කොට සිදු කරල නැහැ. ඒ නිසා මම සිහිපත් කරනවා ඔබතුමාට පුලුවන්නම් ඒ මාර්ගයට තව රු. 50000.00 ක වත් මුදලක් ලබා දෙන්න. එහෙම වුනොත් යන්නම බැරි ස්ථාන සංවර්ධනය කර ගන්න පුලුවන්. මම මගේ පෞද්ගලික වියදමින් 15000 ක් විතර වැය කරලා මැෂින් එකක් දාල මිනිස්සුන්ගේ ශ්‍රම දායකත්වයෙන් දුෂ්කරම ස්ථාන සංවර්ධනය කළා. ඔබතුමාට පුලුවන්නම් අපට ක්ෂණිකව යම් මුදලක් ලබා දෙන්න. තව කිලෝමීටරයක් විතර තියෙනවා යන්න අපහසුම ස්ථාන. ඒ ස්ථාන සංවර්ධනය කර ගන්න පුලුවන්.

අතගරු ජනාධිපතිතුමාගේ පැමිණීම පිලිබඳව සමන් මන්ත්‍රීතුමා කතා කළා. ගරු සභාපතිතුමත් කරුණු පැහැදිලි කළා. මෙතෙක්කල් බලයට පත් වෙච්ච ජනාධිපතිවරු අතරින් අති විශිෂ්ඨම ජනාධිපතිවරයා. ඇත්තටම අපි ආඩම්බර වෙනවා. මීට පෙර ආපු ජනාධිපතිවරු උඩුගමට නෙවෙයි කොහේට ආවත් හැම තැනම  හමුදාව පුරවනවා. නමුත් ගෝඨාභය ජනාධිපතිතුමා එනකොට අපේ  ප්‍රදේශවල එක හමුදා නිලධාරියෙක්වත් රැකවල් දාගෙන හිටියෙ නැහැ.  හමුදා නිලධාරියෙක් හැටියට හිටපු එතුමා අද රටේ ජනාධිපති විදිහට ආරක්ෂාව පිළිබඳ යම් අවබෝධයක් තියෙන නිසා අනවශ්‍ය විදිහට යුධ හමුදා නිලධාරීන් අපහසුතාවයට පත් නොකර ඉතා සූක්ෂම විදිහට ඒ කටයුතු සැලසුම් කරලා  අපේ ප්‍රදේශයට ඉතා වටිනා දායාද කිහිපයක් ලබා දුන්නා. අපිවත් දැනගෙන හිටියෙ නැහැ. හෝමදොල ප්‍රදේශය මේ ලංකාවෙ දුප්පත්ම ග්‍රාම නිලධාරී වසම හැටියට තේරිල තියෙනවයි කියන එක. නමුත් එතුමාගේ අධීක්ෂණයට යොමු වීම ඒ වගේම දිස්ත්‍රික් සංවර්ධන කමිටුවක් එතනට යොමු කිරීම මගින් අපට ලොකු අර්ථයක් ලබා දුන්නා. එතුමාගේ ඒ පළමු පැමිණීමෙන්ම ඉදිරියෙදි අපි එතුමත් එක්ක එකතුවෙලා වැඩකටයුතු කරගෙන යන්න මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අපේ අනිත් මන්ත්‍රීවරුන්ටත් අපි අත්වැල් බැදගෙන එතුමාට ශක්තියක් වෙන්න කටයුතු කරමු කියන සිහිපත් කරමින් අද දවසේ මගේ කතාවට සවන් දුන් සියලු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි අපේ සමන් මන්ත්‍රීතුමා අද තමයි සභාපතිතුමා සමග සතුටු සාමීචියක යෙදුනෙ. නැත්නම් හැමදාම මොකක් හරි අරියාදුවක් තමයි. ඔබ තුමාගෙ කළ හොඳ වෙලාද දන්නෙ නැහැ. මමත් ඔබතුමාට දැන් ස්තූති දෙකක් කරන්න සූදානම් වෙලා ඉන්නෙ. එකක් තමයි තල්ගස්වල නගරයේ සහ මාපලගම නගරයේ කලින් තිබුන වීථි ලාම්පු ඉවත් කරල ඉතා පැහැදිලි එළියක් තියෙන වීථි ලාම්පු 08 ක් අලුතින් සවි කරල තියෙනවා. ඒ පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තූති වන්ත වෙනවා.

ඒ වගේම කලක පටන්ම මාපලගම බස් නැවතුම් පොල අසල ආසිරි ටයර් සර්විස් එක ඉදිරිපිට ආරච්චි දිගන ඇලියෙ තිබුන ප්‍රශ්නය විසඳීමට කටයුතු කරල තියෙනවා. දැන් සතියක විතර ඉදල වැඩ කටයුතු කෙරීගෙන යනවා. දැනුත් මේ වන විටත් එතන ආරවුලක් තියෙනවා. ඒ කටයුතු කරන්න ඉඩ දෙන්නෙ නැහැ. මේ ස්ථානය හැමදාම වැහි වතුරෙන් යටවෙනවා. අපේ ගරු සභාපතිතුමා මේ සම්බන්ධව විශාල

මහන්සියක් දරලා ප්‍රාදේශීය ලේකම් තුමිය, දකුණු පළාත් ඉංජිනේරුතුමා ඇතුලු නිලධාරි විශාල පිරිසක් මේ කටයුත්තට සම්බන්ධ කරල තියෙනවා. ඒ වගේම ග්‍රාම නිලධාරීවරු දෙදෙනාම පැමින විශාල සහයෝගයක් ලබා දුන්නා. මේ ඇලිය අසල නිවස හිමිකාරිය තමයි ප්‍රශ්න ඇති කරන්නෙ. මේ ඇලිය කාලාන්තරයක් තිස්සෙ තිබිල තියෙනවා. නිවස හදල තියෙන්නෙ පසුකාලීනව. නමුත් එයාල අපෙන් තමයි වගකීම ඉල්ලන්නෙ. එම ස්ථානයේ සුද්ද කිරීමෙදි උසස් නිලධාරීන් සියලු දෙනා අත හැරල මම සහ මනෝහර මහත්තයට විරුද්ධව ඔවුන් කටයුතු කරනවා. පළමුදා අපි දෙන්නා පොලීසියට ගෙන්වලා කට උත්තරයක් ගත්තා. මට පැවරුණ කාර්යය ස්ථානය පෙන්වා දීම. දැන් අදත් එතන ආරවුල් අදත් පොලීසියෙ පැමිණිල්ලක් දාල තියෙනවා. ප්‍රශ්නය විසදෙමින් යනවා. දැනුත් ග්‍රාම නිලධාරීතුමිය එතන ඉන්නවා. මේ මාර්ගය දෙපස එකතුවන ජලය බස්සන්න බරිවීම අවුරුදු ගණනක් ඇදිච්ච ප්‍රශ්නයක් මේ සම්බන්දව අවදානය යොමු කරලා ඒ පිළිබදව ඔබතුමා උනන්දු වෙලා සහයෝගය ලබා දුන්නා.විශේෂයෙන් ඒකට ස්තූති කරන්න ඕන. මම හිතනවා මේ කටයුත්ත අවසන් වෙතුරුම ඔබතුමා මේ ගැන අවදානයෙන් ඉන්නවා නම් හොදයි. මොකද ඒ ගල් බැම්මෙන් වැටුන ගල් සේරම අයින් කරන්න ඕන. අපි ඒ අයට සහයෝගය ලබා දීල තියෙනවා. ඒ නිසා කරුණාකර ඒ ගැන අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. සියලු දෙනාටම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි මගේ අලුත්වත්ත කොට්ඨාසයේ ප්‍රදේශ වාසීන්ට බලපාන කාරනාවක් යෝජනාවක් හැටියට ඔබට සිහිපත් කරනවා. පහුගිය දිනවල අපේ හිතවත් නිවසක අවමංගල අවස්ථාවක් යෙදුනා. ඒ වෙලාවෙ මම ඔබතුමා සමග කතබහ කළා. මොකද මේ දිනවල ඉතාම බරපතල ලෙස ජල ප්‍රශ්නය බලපානවා. ඒ නිසා ඒ අවස්ථාවෙ දැඩි අවශ්‍යතාවයක් තිබුනා. නමුත් අපට ඒ අවශ්‍යතාවය සලසා දෙන්න පුලුවන්කම ලැබුනෙ නැහැ. ඒ නිසා මම ඉතාම කණගාටුවට පත්වුනා. ඒ අවස්ථාව සලසා දෙන්න බැරිවීම පිළිබඳව. ඒ එක්කම විශේෂයෙන් සභාපතිතුමා ඒ අවස්ථාවට සම්බන්ද වුනාද මම දන්නෙ නැහැ. මොකද මේ අපේ ප්‍රදේශයේ සෑම අවස්තාවකටම සමබන්ද වෙන නිසා. ගියානම් මම හිතනවා ඒ අත්දැකීම ඔබතුමන්ට ලැබෙන්න ඇති. ඒ නිවසට වාහනයක්වත් බයිසිකලයක්වත් යන්න බැහැ. නිවෙස් කීපයක් ඒ ප්‍රදේශයේ තියෙනවා. මොනම විදිහකින්වත් ඒ මාර්ගයේ යන්න බැහැ. ඒ නිසා මම හිතනවා අපිට වගකීමක් තියෙනවා. අඩුම තරමින් යතුරු පැදියක්වත් යන්න පුලුවන් මට්ටමට ඒ පාර පත්කර දීම දැඩි අවශ්‍යතාවයක් හැටියට මම යෝජනා කරනවා. ඔබතුමා කාර්මික නිලධාරීතුමා යොමු කරලා ඇස්තමේන්තුවක් කරලා මහ විශාල ප්‍රමාණයෙන් නෙවෙයි යතුරු පැදියක් යන්න පුලුවන් මට්ටමට සහාව මැදිහත් වෙලා ඒ කටයුත්ත ඉටු කරල දෙන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාට යෝජනා කරනවා.

ඒ එක්කම සභාපතිතුමනි උඩුගම ඉහලගම ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ නිලධාරීන් ඔබතුමත් සමග සාකච්ඡා කරලත් තිබුනා. ඒ ප්‍ර දේශයේත් ඒ වගේම ඉතාම දුෂ්කර මාර්ගයක් ඒ මාර්ගය ශ්‍රමදාන මට්ටමෙන් සකස් කර ගත්තා. නමුත් ඒ කොපමන සකස් කළත් එක වැස්සක් ආව ගමන් විනාශ වෙලා යනවා. එතනට අත්‍යවශ්‍යම සිලින්ඩරයක් ලබා ගැනීම සඳහා ඔබතුමාගෙ අවදානය යොමු කරන්න කියන ඉල්ලීම මේ වෙලාවෙ කරනවා.

ඒ එක්කම තවත් පුංචි සිහිපත් කිරීමක් කරනවා. මම මේ කාරණය අපේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත් ඉදිරිපත් කළා. නමුත් මේ කාරණයට දැන් අවුරුද්දකටත් වැඩි කාලයක ඉදලා මමත් මැදිහත් වීමක් වෙනවා. ප්‍රාදේශීය ලේකම් තුමිය ග්‍රාම නිලධාරි තුමන්ලා තමියන්ලා වන සංරක්ෂණ නිලධාරි තුමන්ලා තමියන්ලා ඒ වගේම වටවල වතු සමාගම මේ සියලු දෙනාම මේ කාරණයට සම්බන්ධයි. උඩුගම ඉහලගම ප්‍රදේශයේ විශාල ප්‍රමාණයක් ජලය පරිහරණය කරන මගේ නිවස අවට ප්‍රදේශය. එතන වන භූමියක් හැටියට ජල රක්ෂිතයක් හැටියට අතහැරපු ප්‍රදේශයක් කැලෑවක්

තියෙනවා. ඒ කැලෑ ප්‍රදේශය මැදි කරලා ඒ ප්‍රදේශයේ කෙනෙක් කොටසක් එලිකරගෙන තියෙනවා. ඒ ජල මූලාශ්‍රය නැත්නම් ඒ ජලය ගන්න දොලේ ඉහල කෙළවරේ. ඒ කියන්නෙ උල්පත් ටික සම්පූර්ණයෙන්ම තියෙන ප්‍රදේශයේ. කාලයක ඉඳල මේක සිදුවෙනවා. මේක නතර කර ගන්න විවිධ ආයතන සම්බන්ධ කරගෙන මමත් ලොකු උත්සාහයක් ගත්තා. නමුත් මේ වනතුරු නතර කර ගන්න පුලුවන් කමක් ලැබිල නැහැ. මීට පෙර මගේ දැනුම්දීම මත පොලිස් ස්ථානයටත් ගෙන්වලා නතර කරන්න කිව්වා. නමුත් ටික දවසක් ගිහිල්ලා නැවත ඒ පුද්ගලයා ගිහිල්ලා මේක සුද්ද පවිත්‍ර කරනවා. ඒ නිසා මේක ඒ ප්‍රදේශයේ ජල ප්‍රශ්නයට මහ විශාල බලපෑමක් වෙලා තියෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීම කරන්නෙ මට දැනට දැනගන්න තියෙන විදිහට ප්‍රාදේශීය ලේකම් තුමියට තමයි සම්පූර්ණ බලතල පැවරෙන්නෙ මේක නතර කරන්න. අද රක්ෂිතයක කෝටුවක් කැපුවත් දඩ ගහන යුගයක රජයේ නිලධාරීන් මෙච්චර ප්‍රමාණයක් ඉදිද්දි මේ වගේ භූමියක් ඉදිකරගෙන වගා දිගා කරගෙන කටයුතු කරන්නට ඉඩ සැලසීම බරපතල ගැටලුවක්. ඒ නිසා ප්‍රදේශවාසීන් හැටියට අපි සියලු දෙනා ගියා ඒ ස්ථානය බලන්න. අක්කර ¼ කට ආසන්න ප්‍රදේශයක් එලි කරගෙන කටයුතු කරනවා. ඒ නිසා එය වලක්වා දෙන්න සභාව මගින් ඉල්ලීමක් කරන්න කියන යෝජනාව කරනවා. ප්‍රාදේශීය ලේකම් තුමියට මේකට වහාම ක්ෂණික මැදිහත් වීමක් වෙලා එය තහනම් කරලා අපට නැවත ඒ එලි කරපු කොටසේ වන වගාවක් ඇති කර ගැනීම සඳහා අවශ්‍ය අවසරය ලබා දෙන්න කියන ඉල්ලීම මම මේ වෙලාවෙ කරනවා.

එතනට කියන්නෙ ගරුකන්ද වත්ත අසල ඉඩම ජල පෝශිත ප්‍රදේශයක් ඒක විශේෂයෙන් ක්ෂණිකවම ඉටුවිය යුතු කාරණයක් හැටියට ප්‍රාදේශීය ලේකම් හරහා එ් කටයුත්ත ඉටු කර දෙන්න කියන ඉල්ලීම කරනවා. පොලීසියෙන් දැන ගන්න ලැබුනෙ ඒ කරන කෙනා මානසික ආබාධයක් තියෙන කෙනෙක් කියලා. හැබැයි එතනට ගියාම තේරෙනවා එහෙම කිසිම ආබාධයක් නැහැ. මේ වන විට නිවසක් හදන්න ගෙපලක් සුද්ද කරගෙන යනවා. එහෙම මානසික ආබාධයක් පේන්න නැහැ. එහෙම වුනත් මම හිතනවා ඒකට නියමිත පියවරක් ගතයුතු වෙනවා. ඒ නිසා මේ වෙලාවෙ ඔබතුමාගෙන් ඉතාම කාරුණිව ඒ ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි අපේ කියමනක් තියෙනවා. කාලය රන් හා සමානයි කියලා. නමුත් ගරු සභාපතිතුමනි මේ න්‍යාය පත්‍රයට අනුව අද සභාව පටන් ගත්තෙ දහයට කාලක් තියෙද්දි ඇත්තටම අපි නවය වෙන කොට මෙතනට එනවා. ඒ පිළිබඳව ඔබතුමා සියලු දෙනා නිසියාකාරව දැනුවත් කරන්න. නැත්නම් න්‍යාය පත්‍රයේ ඒ වෙලාව දාල අපට එවන්න කියලා මම මුලින්ම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පුස්තකාල කමිටුවෙ සාකච්ඡා වුන දේවල් අපි බොහෝ අගය කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, අපේ පුස්තකාලයට තවම පරිගණකයක් ලබා දීල නැහැ. ඇත්තටම පරිගණකයක් ලබා දෙනවා නම් හොඳයි. මොකද පුස්තකාලයෙන් අබලි ද්‍රව්‍ය ලෙස ඉවත් කරන පොත් පත් වෙනත් උපකරණ විනාශ කළාද එහෙම නැත්නම් අලෙවි කළාද, වෙනත් භාහිර ආයතනයකට ලබා දුන්නාද යන වග පරිගණක ගත කර තබා ගන්න පුලුවන්. ගරු සභාපතිතුමනි ඒ සඳහා ඔබතුමාගෙ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, වැලි කැණීමක් සම්බන්ධව දැන් කතා කළා. ඇත්තටම වැලි ගොඩ දාන්නත් ඕන. නමුත් එතන වෙලා තියෙන්නෙ අපේ පාසලේ ඉඩම මායිමේ තමයි වැලි ගොඩ දැමීමට තීරණය වෙලා තියෙන්නෙ. එමගින් පාසලට පාසලේ දරු දැරියන්ට අනාරක්ෂිත බවක් තියෙන බව තමයි ඒ ලිපියෙන් අපට හැඟුනෙ. එහෙම වුනොත් මේ සියලු මන්ත්‍රීවරු ඒකට කැමති වෙන එකක් නැහැයි කියල මම බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔබතුමාල කිව්වා සියලුම වැඩකටයුතු කරනවා කියලා. නමුත් පාසල් ළමුන්ගේ සුරක්ෂා රක්ෂණය දැන් කපා හැරලා තියෙනවා. ඊට අමතරව පෝෂණ මල්ල නැති වෙලා තියෙනවා. නමුත් ගරු සභාපතිතුමනි අපේ බල ප්‍රදේශය ගත්තම මත් ද්‍රව්‍යලින් පිරිලා. එක පැත්තකින් කසිප්පු ජාවාරම සීග්‍රයෙන් වැඩි වෙලා තියෙනවා. අනිත් පැත්තෙන් ගංජා, කුඩු සියලුම දේ වැඩි වෙලා තියෙනවා. අන්න ඒ වගේ තත්වයක් තියෙන්නෙ. ඔබතුමාගෙන් අපි ඉතා කාරුණිකව ඉල්ලන්නෙ මේ සම්බන්දව නිසි බලධාරීන්ට යොමු කරන්න. ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මේ තියෙන අධික නියගය නිසා හැම ප්‍රදේශයකටම ජලය නැහැ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගිය වාරෙ වගේ ජල ටැංකියක් ලබා දීලා ඒ අවශ්‍ය පහසුකම ලබා දෙන්න කියලා. මේ සභාවෙ තිබුන ජල ටැංකි ටිකත් නැති බව අපි දන්නවා. ජල ටැංකි 16කින් 02 යි දැනට තියෙන්නෙ. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ පියල් මන්ත්‍රීතුමාගෙ බල ප්‍රදේශයේ නොම්මර 20 ප්‍රදේශයේ විදුලිය නැති ගෙදරක් තියෙනවා. අම්මයි පුතයි ඉන්නෙ. ඒ ගෙදරට පුලුවන්නම් විදුලිය ලබා දෙන්න. නැත්නම් එතන පාරෙ වංගුවට වීපී ලාම්පුවක් හරි දාල දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට පුරං කුඹුරු අස්වැද්දීම සඳහා අපි වැඩපිළිවෙලක් සකස් කරගෙන යනවා. ගනේවත්ත මන්ත්‍රීතුමනි ඔබතුමා නාගොඩ ගොවිජන සේවා සංවර්ධන කමිටුවෙ සභාපති හැටියට අපි ගරු කරනවා. නමුත් ඒ සම්බන්දව අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙදිත්, ගොවිජන මධ්‍යස්ථානයෙදිත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙදිත් කතා බහට ලක් වුනා. නමුත් අපි පුරං කුඹුරු අස්වද්දමු කිව්වට අපට පොහොර ටික, බිත්තර වී ටික ගැනීමට මුදලක්වත් නැහැ. ඒ ගැන අපි කණගාටු වෙනවා. ඇත්තටම පුරං කුඹුරු අස්වද්දන්න අපිත් ආසයි. නමුත් දැන් එක අත්තමක් රුපියල් 1500 ක් වෙනවා. කොහොමද කුඹුරු කරන්නෙ කියන ගැටලුවක අපි ඉන්නෙ. අන්න ඒ නිසා එයටත් ඔබතුමාලගෙ වගකීම බලාපොරොත්තු වෙනවා. ඒ සියලු දේ නිරාකරණය කර දෙන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරමින් ඔබ සියලු දෙනාට ඉදිරියට වසනාවන්ත ගමනක් යන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මම පොඩි යෝජනාවක් කරන්නයි නැගී සිටියේ. ගෝනදෙනිය පාසල අසල පාර දෙපසට බම්පර් දෙකක් ඉදිකිරීම සුදුසුයැයි කියල මම යෝජනා කරනවා. එම ස්ථානයේ බම්පර් දෙකක් යෙදීම සඳහා RDA එකට මම ලිපියක් යොමු කරල තියෙනවා. එය සභාවේ යෝජනාවක් ලෙස තල්ගස්වල RDA කාර්යාලය දැනුවත් කරන ලෙස ඔබතුමා ගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි අපේ සභාවට බැකෝ යන්ත්‍රක් තිබුනනම් සංවර්ධන කටයුතුවලට පහසු වෙනවා. ඒ නිසා මම වෙනත් පක්ෂයක මන්ත්‍රීවරියක් වුනත් ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරල තියෙනවා. ඒක නිසා ඒක සභා ගත කරල සභාවේ යෝජනාවක් ලෙස අපේ සභාවට බැකෝ යන්ත්‍රක් ලබා දෙන මෙන් ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි අපේ ලේකම් තුමියටත් දැනුම් දෙන්න කැමතියි. අපේ ප්‍රදේශයේ කාන්තාවක් එයාගෙ ප්‍රශ්නයක් තිබිල සභාවට යොමු කරල තියෙනවා. එයාගෙ නිවසට අල්ලපු නිවසෙ ගඩොල් මැෂිමක් යොදාගෙන නිෂ්පාදනයක් කරනවලු. ඒ නිෂ්පාදනය නිසා ඒ කාන්තාවට ඇයගේ නිවසේ ජීවත් වීමට අපහසු තාවයක් තියෙනවලු. ඒ ගෙදර බිත්ති දෙදරන නිසා පුපුරා ගිහිල්ල තියෙනවා. ඒ ගෙදර මේ අවුරුද්දෙ අගෝස්තුවල විභාගය ලියන ළමයෙක් ඉන්නවා. ඒ ළමයට පාඩම්

කරන්න අපහසුලු. මම ස්ථානීය පරීක්ෂණයකුත් කළා. ගිය මාසෙ 19 වෙනිදා මෙහේට දැනුම් දීල තියෙනවා. මෙතෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. අද උදෙත් එතුමිය ඒ පිළිබඳව මට දැනුම් දුන්නා. එතුමිය මගේ ඥාති වරියකුත් වෙනවා. ඥාති වරියක් නොවුනත් එතුමියට අසාධාරණයක් වෙච්ච බව හොඳටම පේනවා. මගේ කොට්ඨාසෙ ධනංජය මන්ත්‍රීතුමත් ඒ පිළිබඳව දැනුවත් ඇති. මේ සමබන්දව යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට කල් දැමීම සුදුසු දෙයක් නෙවෙයි. අපි කාර්යක්ෂමව එයට පිළිතුරක් ලබා දිය යුතුයි. අපි මෙතනට ඇවිල්ල නිලධාරින්ට නිතරම කියන්නෙ කාර්යක්ෂම සේවයක් ලබා දෙන්න කියලා. ඉතිං අපේ නිලධාරින්ම ඔවුන්ට කාර්යක්ෂම සේවයක් ලබා දෙන්නෙ නැත්නම් අපි මෙතන සිටීම කිසිම තේරුමක් නැහැ. අද උදෙත් එතුමිය ආවා. අද සභාව දවස සභාව දවසටවත් නිලධාරීන් කාර්යාලයට නියමිත වෙලාවට පැමිණිය යුතුයි. අද සභාව පටන් ගන්න කොටත් නවය පහුවෙලා ඒ වෙන කොටත් මේ කරණය දැන ගැනීම සඳහා අදාල නිලධාරි තුමිය පැමිණිලා හිටියෙ නැහැ. මම ඉල්ලා සිටින්නෙ සභාව දවසටවත් නියමිත වෙලාවට වැඩට පැමිණිලා නියමිත රාජකාරිය කරන්න කියලා. ගරු සභාපතිතුමා ඒ පිළිබඳව අවදානය යොමු කරන්න.

ඒ වගේම යම් කෙනෙක් සේවයක් ඉල්ලගෙන පැමිනියා නම් අපේ ප්‍රඥප්තියෙ ප්‍රධානවම දාල තියෙන්නෙ. පැය 24 ඇතුලත අපේ සේවය ඉටු කරනවයි කියලා. නමුත් මේ කාන්තාවට මාස ගණනක් ගත වෙලත් සේවය ඉටු වෙලා නැහැ. මම කියන්නෙ එතුමියගෙ වියසනයට ඉතා ඉක්මනින් පිළිතුරක් ලබා දෙන්න කියලා. අද එතුමියට නිවසට යන්න කියලා තියෙනවා. කිසිම පිළිතුරක් ලබා නොදී තමයි යන්න කියලා තියෙන්නෙ. මම ඉල්ලා සිටිනවා එයට ඉක්මන් පිළිතුරක් ලබා දෙන්න කියලා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ල මනත්‍රීතුමියන්ලගෙන් අවසරයි. ඌරල කොට්ඨාසය තුල මේ දිනවල පවතින දැඩි නියං තත්වයත් සමග ඌරල මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ පවුල් 15 ක් 20 ක් පමණ පානීය ජල ප්‍රශ්නයකට මුහුන දීල තියෙනවා. ඒ වගේම ඌරල උතුර නිලධාරී වසමේ පවුල් 85 ක පමණ පිරිසක් උග්‍ර ජල හිගයකට මුහුන පාල ඉන්නවා පානීය ජලය මෙන්ම අනිකුත් අවශ්‍යාතා සදහාත් ජලය නැහැ. අඩි 40 හේ ලිං පවා මේ වන විට සිදී ගොස් තියෙනවා. මම පසුගිය පළවෙනිදා සභාපතිතුමාට දුරකතනයෙන් දැනුම් දීමක් කළා. මට ජල බවුසරයක් ලබා දෙන්න කියලා. නමුත් එදින ලබා දුන්නෙ නැහැ. පසුගිය හය වැනිදා ජල බවුසරයක් ලබා දෙන්නම් කියලා සදහන් කළා. නමුත් මේ විශාල බවුසරය ඒ ස්ථානය කරා ගමන් කිරීමේ ලොකු අපහසු තාවයක් තියෙන බැවින් මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පොඩි ටැක්ටර් බවුසරය අපට දින දෙකකට සැරයක් හෝ ලබා දෙන්න. මොකද අපට ඒ සඳහා ස්ටොක් කරගන්න ලීටර් 1000 සේ හෝ ටැංකි දෙකකුත් ලබා දෙන්න. අපි මේ වෙලාවෙ මේ ජනතාවට උදවු කරන්න ඕන. මොකද අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලත් තියෙනවා. මේ ප්‍රාදේශීය සභාව උපතේ සිට මරණය දක්වා මිනිසුන්ට උපකාර කිරීමට බැදී සිටින නිසා මෙන්න මේක තමයි අවස්තාව මේ ජනතාවට සහන සලසන්න. ඒ මිනිස්සු රැකියාක් හෝ වෙන දෙයක් ඉල්ලන්නෙ නැහැ. ඉල්ලන්නෙ පානීය ජලය ඒ අවශ්‍යාතාවය සභාපතිතුමනි සපුරා දෙන්න කියල මම ඉල්ලීම කරනවා. මොකද වැසි කවදා ලැබේද දන්නෙ නැහැ. වැසි අද හෙට ලැබුනත් සතියක් දෙකක් විතර යනකම් මේ ජල ප්‍රශ්නය විසදෙන්නෙ නැහැ. ඒ නිසා ඔබතුමාගෙ අවදානය යොමු කරන්න කියනවා. මම මගේ ලොරි රථයෙන් ලීටර් 500 යෙ ටැංකි තුනක් තියාගෙන දින දෙදක් ජලය ලබා දීල තියෙනවා. මටත් හැමදාම මේක කරන්න බැහැ. ඒ ස්ථාන දෙකට ජලය ලබා දීමට පැය හයක විතර කාලයක් ගත වෙනවා. ඒ නිසා ඔබතුමාගේ දැඩි අවදානය යොමු කරලා ඒ සඳහා පිළියමක් යොදන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි ඌරල පොදු නාන ලිද පිළිබඳව මම පසුගිය 2019 වසරෙ නව වැනි මාසෙත් මේ සභාවෙ කතා කළා. ආපසු දොලොස්වැනි මාසෙ කතා කළා. මාපලගම ප්‍රදේශයේ අබේසේකර

කියල වෙළඳ ව්‍යාපාරයක් කරන තැනැත්තෙක් විසින් ඒ ලිද කැඩුවා. මම ලිද කඩපු දිනයෙදිම සභාපතිතුමාට දැනුම් දීමක් කරල තියෙනවා. නව වැනි මාසෙ සභාවාරෙදි සභාවට ප්‍රකාශ කරල තියෙනවා. තව වෙනතුරු ඒ ලිදට කරපු හානිය බලන්න. මම දැනුවත්ව කිසිදු නිලධාරියෙක් ගිහිල්ල නැහැ. මේ දිනවල පවතින නියගයත් එක්ක මිනිසුන්ට දිය නෑමේ අපහසුතාවයකුත් තියෙනවා. ඌරල දකුණ සහ මධ්‍යම ග්‍රාම නිලධාරී වසම්වල අයට මේ ලිද හදල දෙන්න. මොකද ඇලත් සිදිල නිසා ඒ ලිද ප්‍රතිසංස්කරණය කරල දෙන්නවත් ඔබතුමා ඒ පිළිබඳ විමර්ශනයක් කළාද කියලා මම දැනගන්න කැමතියි. මොකද මම දැනුවත්ව කිසිදු විමර්ශනයක් කරල නැහැ. ගිය සතියෙ සිදුවුනාද කියලා මම දන්නෙ නැහැ. විශාල ලෙස ඒ ලිදට අලාභ හානි කරල තියෙනවා. ඇත්තටම පොදු දේපොලක් මේ විදිහට විනාශ කරල තියෙන්නෙ. මම නවවැනි මාසෙ ඉදලා ඔබතුමා දැනුවත් කරල තියෙනවා මේ වනතුරු කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මොකද ගමේ ජනතාව අපට තමයි ඒ පිළිබඳව චෝදනාව එල්ල කරන්නෙ. අපි ගමේ නියෝජිතයන් දෙදෙනෙක් ඉන්නවා. සහබන්දු මැතිතුමත් මමත් නමුත් මේ වනතුරු ක්‍රියාමාර්ගයක් නොගත්ත එක පිළිබඳව අපේ දැඩි විරෝදය සභාපතිතුමාට ප්‍රකාශ කරනවා.

ඒ වගේම සභාපතිතුමනි අලුත් වීථි ලාම්පු නගර කිහිපයකට සවි කරයි කියලා කිව්වා. අපට ඌරලටත් කටඹුරාව ඇතුලුව ප්‍රධාන හන්දි දෙකටවත් වීථි ලාම්පු ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. සභාපතිතුමනි මගේ කාරනා දෙක සම්බන්දව ඔබතුමාගෙ දැඩි අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම සභාපතිතුමාට විතරක් වරද පටවන්නෙ නැහැ. මෙතන මේ ක්‍රියාව කරවන්න නිලධාරී තුමියක් ඉන්නවා. ලේකම් තුමිය දැනගන්න ඕන. නිලධාරීන් යවල මේ දේවල් නිසියා කාරව ක්‍රියා කරන්න. කිසිම දෙයක් වෙලා නැහැ. දැනුම් දීමක් කරල නැහැ. අටවැනි මාසෙ මේ පොදු ලිද කැඩුවෙ. මම දන්නෙ නැහැ මොන මතිමතාන්තර තියෙනවද කියලා. මම කැඩුව වෙලාවෙම සභාපතිතුමාට දැනුම් දුන්නා. මෙතුමත් ස්ථානීය පරීක්ෂණයක් කළා. ගරු සභාපතිතුමනි ඉක්මනින් කුමන හෝ ක්‍රමයකට මේ ලිද ප්‍රතිසංස්කරණය කරල දෙන්න.මොකද නියගයනේ ඇති වචේව පීඩාවට මිනිස්සුන්ට ඇග නිවා ගන්න. දිය නාගන්න තියෙන්නෙ මේ පොදු ලිද. ඒ නිසා ඒ පිළිබඳව කාරුණික අවදානය යොමු කරන්න කියලා මේ තුන්වැනි වතාවට මේ සභාවෙ කියන්නෙ. සියලු දෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි සියලුම මනත්‍රීතුමන්ල මනත්‍රීතුමියන්ලගෙන් අවසරයි. ලේකම්තුමිය ප්‍රධාන සභාවේ කාර්යය මණ්ඩලයෙන් හා මාධ්‍යවේදී හේමපාල මැතිතුමාගෙන් අවසරයි. සභාපතිතුමනි අද දවසේ මම මුලින්ම කතා කරන්න ඕන. මාපලගම නගරයේ අලුතින් වීථි ලාම්පු සවිකරගෙන යනවා. මම සභාපතිතුමාගෙන් දැනුවත් වෙන්න කැමතියි මාපලගම ආයුර්වේදය ඉදිරිපිටටත් වීථි ලාම්පුවක් සවිකරනවද කියලා. මොකද අපේ ධර්මසිරි මන්ත්‍රීතුමන් කිව්ව වගේ මාපලගම ජනිත් ස්ටෝර්ස් එක ලගට වගේම ආයුර්වේදය ලගටත් වීථි ලාම්පුවක් අවශ්‍යයි. මොකද අපේ සභාවේ ආයතනයක් නිසා වීථි ලාම්පුවක් ලබා දෙනවානම් හොදයි. ඒ පිළිබඳ ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාපලගම බස් නැවතුම් පොල පිළිබඳව අපේ පියල් මන්ත්‍රීතුමත් කතා කළා. දැන් රාත්‍රියට රජයේ බස් සියල්ල මාපලගම බස් නැවතුම් පොලේ නතර කරන්නෙ. ඒ නිසා බස්රථවල රියදුරු ,කොන්දොස්තර මහත්වරු එයාලට අවශ්‍ය පහසුකම් නොමැති වීම නිසා දැඩි දුෂ්කරතාවකට පත්වෙලා ඉන්නවා. වැසිකිලි කැසිකිලි පහසුකම් නොමැතිවීම තමයි ලොකුම ගැටලුව. ඒ නිසා මේ පිළිබඳව සොයා බලන්න. රාත්‍රියට බස්රථ පාරවල් අයින්වල නතර කරල තියනවට වඩා බස් නැවතුම් පොලේ නතර කරල තියෙන එක හොදයි. ජනතාවටත් ඒක ලොකු පහසුවක් වෙනවා. ඒ නිසා ඒ අයගෙ පහසුකම් පිළිබඳව සභාව හැටියට නිතර සොයා බලනවනම් හොදයි.

ඒ වගේම මේ දිනවල පවතින දැඩි නියගය පිළිබඳ අපේ පතිනායක මන්ත්‍රීතුමත් කතා කළා. අපේ ප්‍රදේශවලත් ජනතාව දැඩි අපහසුතාවයට පත්වෙලා තියෙනවා. ගනේවත්ත මන්ත්‍රීතුමන් සඳහන් කළා වගේ දැනට මුලන මල්වත්ත හේන ප්‍රදේශය ආදී ස්ථානවල ජනතාව අපහසුතාවයට පත්වෙලා තියෙනවා. ඒ වගේම පියසෙන් ජල ව්‍යාපෘතියෙත් ජලය ලබා දෙන්නෙ පැයක් වගේ කාලයක් විතරයි. ජල උල්පත් සිදීයාම නිසා ජනතාව අපහසුතාවයට පත්වෙලා තියෙනවා. සභාව හැටියට මේ වෙලාවෙ ඔබතුමාල අවදානය යොමු කරල ජලය නොමැති ප්‍රදේශවලට ජලය ලබා දෙන්න වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ පැවිල්ල නිමාවට පත්වෙන බවක් පේන්න නැහැ. ඒ නිසා දැන්ම වැඩපිළිවෙලක් සකස් කරගෙන ජනතාවට බීමට ගන්නා ජලයවත් ලබා දෙන්න පියවර ගන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම පසුගිය රජය කාලෙ කළ සංවර්ධන ව්‍යාපෘතිවලට මුදල් නොගෙවීම නිසා ඒ කොන්ත්‍රාත් කරුවන් දැඩි ලෙස අපහසු තාවයට පත්වෙලා තියෙනවා. ඔබතුමන්ලා බලයට පත්වෙලා දැන් මාස හතරක් වෙනවා. මේ වෙලාවෙ ඔබතුමාල සපිරිගමක් වැඩසටහන යටතේ අලුත් ව්‍යාපෘති ආරම්භ කරල පාරවල් කොන්ක්‍රීට් කරමින් පවතිනවා. පහුගිය කාල වකවානුව තුල කොන්ත්‍රාත් කළ කොන්ත්‍රාත් කරුවන්ට ලක්ෂ 50 හ 60 ට ගෙවන්න තියෙනවා. ඒ කොන්ත්‍රාත් කරුවන්ට මුදල් ලබා නොදී ඔබතුමාල අලුතින් සංවර්ධන ව්‍යාපෘති සිදුකරන එක සුදුසු නැහැ. ඕනම රජයක් සිදුකරන ලද සංවර්ධන කටයුතුවලට මුදල් ගෙවල තමයි ඊලඟ සංවර්ධන කටයුතු ආරම්භ කරන්නෙ. නමුත් මේ අය පහුගිය අපේ රජය කාලෙ කළ සංවර්ධන කටයුතුවලට මුදල් ගෙවීම අතපසු කරල අලුතින් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරල තියෙනවා. අපි කරපු සෑම සංවර්ධන ව්‍යාපෘතියකටම මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එන විදිහට තමයි අපි වැඩ කළේ. තමුන්නාන්සෙලගෙ ආණ්ඩුව ආවට පස්සෙ මේ සියල්ල මහා භාණ්ඩාගාරයට ඇදල ආණ්ඩුවේ විය හියදම් වලට යටත් කරගත්තා. ඒක නිසා තමයි මේ කොන්ත්‍රාත්කරුවන් අපහසුතාවයට පත්වෙලා තියෙන්නෙ. දැන් ඉදිරි මහ මැතිවරණය බලාගෙන සපිරිගමක් කියල ව්‍යාපෘති කරල ජනතාව තව පාරක් නොමග යවලා. ජනතාවගෙ ඡන්දය රවටා ගන්න හදනවා නම් ජනතාව ඉදිරියෙදි ඒවට උත්තර දේවි.

ඒ වගේම සභාපතිතුමනි අද රටේ පරිපාලන ව්‍යුහය දිහා බලනකොට අපට යම් මට්ටමකින් පෙනෙනවා. ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් රාජ්‍ය පරිපාලනයට යම් අන්දමකින් මැදිහත්වෙලා මේ රට හමුදා පාලනයකට නතු වෙන බවක් පෙනෙන්නට තියෙනවා. පහුගිය දිනවල මම දැක්කා මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැකියා දෙන වැඩසටහන්වල ඉන්ටර්වීව් මෙහෙයවුවෙ හමුදාවෙ උසස් නිලධාරීන් ඇවිල්ලා. ඒ වගේම රජයේ අමාත්‍යාංශවල ඉහල පුටුවල ඉන්නෙ මේ හමුදාවෙ උසස් නිලධාරීන්. ගොඨාභය ජනාධිපතිවරයා මොන අදහසක් ඇතිව මේ කටයුතු කරනවද කියල මම දන්නෙ නැහැ. මේ රටේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ උගත් බුද්ධිමතුන් සිටිද්දි හමුදාවෙ උසස් නිලධාරීන් දාල රටේ පාලනය ඒ අය හරහා කරන්න කටයුතු කරන බවක් පේන්න තියෙනවා. මේ නිසා ජනතාව යම් කුතුහලයකට ලක්වෙලා තියෙනවා. අද වත්මන් රජයේ ක්‍රියා කලාපය පිළිබඳව ජනතාව දැඩිලෙස කලකිරීමට ලක්වෙලා තියෙනවා. මේ අය බලයට එන කොට විවිධ දේවල් දෙනවයි කියලා ජනතාව මුලා කළා. දැන් ජයවීර මන්ත්‍රීතුමා කිව්ව වගේ කලින් ජනතාවට දීපු සහනත් කප්පාදු කරල තියෙනවා. දැන් නැවතත් මේ අය මහ මැතිවරණයකට ගමන් කරන්න ජනතාව මුලා කරන්න යම් යම් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. නමුත් ජනතාව ඒ කටයුතු පිළිබඳව වැඩි පැහැදීමක් නැහැ.

අවසාන වශයෙන් සභාපතිතුමනි අපි පහුගිය දවස්වල අධ්‍යන චාරිකාවක නියලුනා. සහභාගිවුන සියලුදෙනා ඒ කටයුත්තට සතුටින් සහභාගිවුනා. අපි ගියපු ආයතනවල කටයුතු දිහා බලන කොට ඒ ආයතනවල දියුනුව දිහා බැලුවම අපේ සභාවෙ පරිපාලන ව්‍යුහයත් එක්ක සංසංධනය කරල බැලුවම අපි කොතනද ඉන්නෙ කියල වැටහීමක් ඇති වුනා. මේ වෙලාවෙ ඔබතුමන්ල එක්ක ඉන්න ඔබතුමන්ලගෙ මන්ත්‍රීවරුත් මේ සභාවෙ පරිපාලන ව්‍යුහය පිළිබඳ විවිධ විවේචන ඉදිරිපත් කරන

කොට මේ පිළිබඳ අපි නැවතත් අධ්‍යනය කළයුතු කාලය ලංවෙලාය කියන එක මම සිහිපත් කරනවා. මේ ඉදිරි කාලය තුල තමුන්නාන්සෙල ජනතාවට ලබා දීපු පොරොන්දු ඉටු කරන ක්‍රමවේදය පිළිබඳව අපි අපේ නෙත යොමුකරගෙන සිටින බව සිහිපත් කරමින් මම නිහඩ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි අවසරයි. පවතින දැඩි නියං තත්වය පිළිබඳව අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම සඳහන් කළා. විශේෂයෙන්ම අපේ කැප්පිටියාගොඩ ප්‍රදේශය ගඟ ආශ්‍රිත ප්‍රදේශයක් නිසා ඒ ප්‍රදේශයේ මේ වනවිටත් ගිංගඟේ ජලය හොඳින් ගලා බසිනවා. නමුත් ගරු සභාපතිතුමනි තොටුපොලවල් ටික අහිමි වීම නිසා අපට අවාසනාවන්ත විදිහට ගිංගඟේ ජලයෙන් ප්‍රයෝජන ගන්න බැරිවෙලා තියෙනවා. කෙසේ වෙතත් ඔබතුමාගේ නිර්දේශය මත එක තොටුපොලක සංවර්ධන කටයුතු සිදු කර ගන්න හැකියාව ලැබුනා. ඒ පිළිබඳව මගේ ස්තූතිය මේ වෙලාවෙ පිරිනමනවා. ඒත් එක්කම තව තොටුපොලවල් කීපයක් සුද්ද කරන්න තියෙනවා වගේම ගරු සභාපතිතුමනි ගම්මැද්දෙගොඩ,වැලිවිටිය ආදී අසල්වැසි ප්‍රදේශවල තියෙන තොටුපොලවල් සුද්ද කරනවානම් ගඟ තුල නිදහසේ ගලාගෙන යන ජලයෙන් ජනතාවට ප්‍රයොජනයක් ගත හැකි බව මේ වෙලාවෙ සඳහන් කරන්න ඕන. පසුගිය කාලයේ තිබුන අයහපත් කාලගුණ තත්වය නිසා තොටුපොලවල් සංවර්ධනය කිරීම සඳහා අපට අනුමත වෙලා තිබුන මුදල් අහිමි වෙලා ගියා. තොටුපොලවල් සංවර්ධනය කිරීම පිළිබඳව ඔබතුමා අවදානය යොමුකර ඒ කටයුතු කරන්න සූදානම් වුනත් අයහපත් කාලගුණ තත්වය නිසා ඒ කටයුතු කරගන්න බැරි වුනා.

ඒ වගේම ගරු සභාපතිතුමනි පසුගියදා අපි ගියපු අධ්‍යන චාරිකාව සමබන්දව වචනයක් කතා කරන්න ඕන. ඒ සඳහා සහභාගිවුන සියලු දෙනාම එම අධ්‍යන චාරිකාව ඉතාම සාර්ථකව නිමා කළා. ගරු සභාපතිතුමා හා උප සභාපතිතුමා සියලු දෙනාගේ සියලුම පහසුකම් සහ ආරක්‍ෂාව සමබන්දව ඔබ දෙපොල දැක්වූ අනුග්‍රහය පිළිබඳව විශේෂයෙන්ම අපේ ස්තූතිය පුදකරමින් සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. මමත් නැගීසිටියේ මේ දිනවල නියගය නිසාම ජල ප්‍රශ්නයක් පවතින ප්‍රදේශයක් ගැන කියන්න නෙවෙයි. උවැලිවිටිය බටහිර පදිංචි පිරිසකට හැමදාම ජලය නැති ප්‍රශ්නයක් කියනවා. උඩවැලිවිටිය ප්‍රදේශයේ අපේ සහබන්දු මහත්මයගෙ කාලෙ පටන් ගනිපු ජල ටැංකියක් තියෙනවා. ඒ ජල ටැංකියෙන් කොටසකට ජලය ලැබෙන බවත් කොටසකට නොලැබෙන බවත් ඔවුන් හැමදාම පවසනවා. මේ දිනවල ඒ තත්වය උග්‍ර වෙලා තියෙනවා. ඔවුන් කියනවා ඔවුන් ලග ඒ ජල ටැංකියේ ඉඳලා ජලය ගෙනියන්න බට පවා තියෙනවා. ඒක දාගන්න පුලුවන් විදිහක් හදල දෙන්න කියලා. ඉතිං මම ඔබතුමාට කියනවා. ඒ අයගෙ ජල අවශ්‍යතාවය සපුරන්න සොයා බලල ඒකට දෙන්න පුලුවන් සහයෝයක් දෙන්න කියලා.

අනිත් කරුණ තමයි උඩවැලිවිටියෙ තියෙන ප්‍රජාශාලාවෙ විදුලි බිල පිළිබඳව තවම ගැටලුව තියෙනවා. මම මීට ඉහත දිනයකදිත් ඇහුවා. ඒ ප්‍රජාශාලාව සභාවට පවරතෙන තියෙනවද කියලා. ඒකෙ යතුර තියෙන්නෙ ග්‍රාම නිලධාරීතුමා ලග නෙවෙයි. සමෘද්ධි නියාමක මහත්මය ලග. සමෘද්ධි නියාමක මහත්මය කියනවා. සභාවට අයිතිය කියලා. දෙපැත්තකට බෙදිල විදුලි බිල පිළිබඳව ඔවුන් කතබහට ලක්වෙනවා. ඒ විදුලි බිල එන්න එන්න වැඩිවෙනවා. මේ වන විට දොලොස් දහස් ගණනක විදුලි බිලක් තියෙන බව ඔවුන් පැවසුවා. ඒක සභාවට පවරගෙන තියෙනවා නම් ඒ ගැන නීතිමය පියවරක්

අරගන්න. සමෘද්ධි නිලධාරි මහත්මා කියන්නෙ සමෘද්ධි සමිතියෙන් ඒ බිල ගෙවනවා කියලා. ඒක නීතිමය වශයෙන් සභාවට පවරගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අනිත් එක තමයි ඊයෙ ප්‍රවෘත්ති ප්‍රකාශක් අතරතුර මට ඇහුනා. වසර 30 කට පස්සෙ බොර තෙල් බැරලයක මිල අඩුවෙලාය කියලා. ඒකෙ සහනයත් මහජනතාවට ලැබේවායි කියල ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා ස්තූතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් එඬේර ආරච්චි මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුලු සමස් මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. දීර්ග කාලීන නිහැඬියාවකින් කතා නොකර හිටියත් හේතු කාරණා ගොඩක් තියෙන නිසා. මට හිතුනා අද පොඩ්ඩක් කතා කරන්න ඕන කියලා. ගරුසභාපතිතුමනි මම මීට කලින් යතා පරිදි කල් දී ඇති යෝනා වෙනුවෙන් මම යෝජනාවක් දැම්මා. උඩුගම උප මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම පිළිබඳව කේ. ඩී. ඒ. වීරසිංහ සමාගමත් සමග මම හා ගමේ ක්‍රීඩා සමාජ සම්බන්ධ වෙලා. එතුමලාගෙ සංවර්ධන ක්‍රියාවලියෙදි  අපේ ප්‍රාදේශීය සභා භූමිකාව තුල අපට කරන්න පුලුවන්, අපට ඔවුන්ගෙන් ලබාගත හැකි ප්‍රයෝජන මොනවද කියන එක සම්බන්දව අපි එතුමලත් එක්ක සාකච්ඡාවක් ගත්තා. එතනදි අපි කිව්වා උඩුගම උප මහජන ක්‍රීඩාංගනය අඩුම තරමින් පාර මට්ටම දක්වාවත් පහත් කරලා ඒ පැත්තට යන මිනිස්සුන්ට යන්න පුලුන් විදිහට පාරවල් ටික හදල දීල  ඒ සම්බන්ධව ක්‍රියා කරන්න කියලා. ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ලැබෙනවා නම් යම්කිසි නෛතික පදනමක් මත ලියවිල්ලක් මත මේ ක්‍රීඩාංගනය සංවර්ධනය කරල දෙනවා කියලා. එතුමන්ලගෙ සියලු දෙනාගෙ එකඟතාවය අපට ලැබුනා. මම හිතනවා සභාපතිතුමනි උඩුගම ප්‍රදේශයට ක්‍රීඩාංගන ගොඩක් තියෙනවා. එකම ක්‍රීඩාංගනයකටවත් අද ඒ අත්‍යවශ්‍ය පහසුකම් ඉඩකඩ කොහෙද තියෙන්නෙ කියලා මම අහනවා. පහුගිය කාලය පුරාම සෑම සභාපතිවරයෙක්ම උත්සාහ කළා. මේ ක්‍රීඩාංගන සංවර්ධනය කරන්න. අද උඩුගම ප්‍රදේශයේ ක්‍රීඩාංගන තිබුනත් එක පැත්තටයි ක්‍රිකට් ගහන්න පුලුවන්. ඒ සමබන්ධව ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි කණගාටු වෙන්න ඕන. උඩුගම මහජන ක්‍රීඩාංගනයක් කියල තියෙනවා. හැමදාම මොකක් හරි සංවර්ධනයක් කරනවා. අද අඩුම ගානෙ උඩුගම මහජන ක්‍රීඩාංගනයට තියෙන පහසුකම් මොනවද කියල අහනවා. අද උඩුගම මහජන ක්‍රීඩාංගනයේ  ක්‍රීඩා  කරන්න බැරි තත්වයක් උද්ගත වෙලා තියෙවා. ක්‍රීඩාවට අතහිත දෙන්න දායකත්වය දක්වන්න අපට අයිතියක් තියෙනවා. මම හිතනවා ඒක ප්‍රාදේශීය සභාවක් සතු යුතුකමක් හා වගකීමක් වෙනවා. ඉදිරියෙදි උඩුගම උඩුගම මහජන ක්‍රීඩාංගනය හරි මොකක් හරි එක මහජන ක්‍රීඩාංගනයක් තෝරගෙන ඒක අංග සම්පූර්ණ ක්‍රීඩාංගනයක් බවට පත් කිරීම ඔබතුමා සතු යුතුකමක් හා වගකීමක් වෙනවා.

ඊලගට උඩුගම සති පොල ගැන, මම කතා කරන්න කැමතිම නැති මාතෘකාවක්. අවුරුදු දෙකක් පුරා මම සති පොල වෙනුවෙන් මහ ගොඩක් මහන්සි වෙලා අන්තිමට නඩුවකුත් පටලවා ගත්තා. ඔබතුමා තල්ගස්වල පොලට ලක්ෂ 10 ක් වෙන් කර ගන්න කොට,මම මෙච්චර කාලයක් උඩුගම පොල සම්බන්දව කටයුතු කරල දක්වපු දායකත්වයට ඔබතුමා කිසිම දායකත්වයක් දැක්කුවෙ නැහැ කියල මට හිතුනා. මොකද හේතුව ඔබතුමා හොදාකාරවම දන්නවා. මේ සභාවෙ සියලු දෙනාම දන්නවා. එක්කෝටි විසිපන් ලක්ෂයකට වැඩිය වියදමක් දරලා. අවුරුදු හතරහමාරක් වැනි කාලයක් ජරා ජීර්ණයට පත්වෙලා කිසිදු පල ප්‍රයෝජයක් ගන්නෙ නැතිව. අද මිනිස්සුන්ගෙන් ඈත් වෙච්ච පොල භූමියක් බවට පත්වෙලා. හැම සදුදාවකම ජරා ජීර්ණ වෙච්ච පොලක තෙමි තෙමී මඩේ එරි එරී මිනිස්සු බඩු අරගෙන යනවා. මේ සමබන්දව ඔබ සියලු දෙනාම දන්නවා. මම හැමදාමත් කතා කළා. නමුත් අද වෙනතුරු ප්‍රතිඵලයක් ආවෙ නැහැ. මේ සම්බන්දව මම දින ගණනක් කිව්වත්, මෙතන අපේ මාධ්‍යවේදී මහත්වරු සිටියත්, උඩුගම පොල සම්බන්ධව කවදාවත් පත්තරේ ලියවිල නැහැ. මාධ්‍යවේදී මහත්වරුනේ වැසි දවසක ගිහින් බලන්න. පින්තූර ගන්න නාගොඩ ප්‍රාදේශීය සභාවට

අයත් උඩුගම පොල භූමිය වැහි දවසට කොහොමද කියලා. මෙතනත් ඉදගෙන අවුරුදු දෙකක් පත්තරේට ලියනවා. මම අහන්නෙ මේ අඩු පාඩු කියන ඒව කොහේද ලියල තියෙන්නෙ කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමගෙ පදවි ප්‍රාප්තියත් එක්ක සපිරි ගමක් වැඩසටහන යටතේ උඩුගම 218 ගමට ආපු ලක්ෂ 20 න් ලක්ෂ 10 ක් මම පොල සංවර්ධනය කරන්න දැම්මා. ඒකෙ ලියුම ආවෙ ප්‍රාදේශීය සභාවට පෙබරවාරි 07 වෙනිදා. ගිවිසුම් අත්සන් කළේ ජනවාරි 15 වෙනිදා. නමුත් මේ මාර්තු මාසෙ 07 වෙනිද වෙනකම් මේ ප්‍රාදේශිය සභාවෙ නිලධාරීන්ට ප්ලෑන් එකක් ඇදලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යවන්න බැරි වුනා. මාසයක් පුරා නිලධාරීන් මොකක්ද කරන්නෙ. සභාපතිතුමා වැඩක් කරනවානම් සල්ලි වෙන්කරල තියෙනවානම් ඇයි නිලධාරීන්ට බැරි? ඒ සමබන්දව වගකීමෙන් වැඩ කරන්න. ඔබතුමා නායකත්වය ගන්න පරිපාලනය සම්බන්දයෙන් මේ ලිහිල් ක්‍රියාපටිපාටි අනුගමනය කරන්න එපා. එහෙම ලිහිල් ක්‍රියාපටිපාටි අනුගමනය කළාම මේව අයාලේ යන දෙවල් බවට පත්වෙනවා. මේවයින් සේවයක් සලස ගන්න නම් අපි පරිපාලනය පිළිබඳව ක්‍රියාපටිපාටි ශක්තිමත් කරන්න ඕන. සභාපතිතුමනි ඒ සම්බන්ධව කණගාටු දායක තත්වයක් තියෙන්නෙ. අනිත් එක සියලු ෆොටෝ සමග මම ආණ්ඩුකාරතුමාට මේ සම්බන්ධව ලිඛිතව පැමිණිලි කළා. එතුමා පළාත් පාලන කොමසාරිස් තුමාට නියෝගයක් දුන්නා ඉතාම ඉක්මනින් මේ සමබන්ධව පියවර ගන්න කියලා. මේව මහජන මුදල් මහජන දේපොල මේව නාස්ති කරන්න දෙන්න එපා කියලා. නමුත් එහෙම තියෙද්දිත් තල්ගස්වල පොලට ලක්ෂ 10 ක් දාපු එකට මගේ කණගාටුවක් නැහැ. මම කියන්නෙ ඔබතුමා මේක දැන දැනත් මේ කරුණු කාරනා වාර්තා කරලා. මේ සමබන්ධව ක්‍රියාමාර්ගයක් නොගැනීමයි මට තියෙන කණගාටුව. ඒ නිසා සභාපතිතුමා මේ සමබන්ධයෙන් මම ලක්ෂ 10 දාලා කරන්න පුලුවන් උපරිම දෙයක් පොල වෙනුවෙන් කරන්නම්. යමකිසි මුදලක් මේකෙන් ඉතුරු වුනොත් ඒ මුදල යොදවල ඒ කාර්යය කරල අවසන් කරන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මම හිතන්නෙ නැහැ. ඒ ලක්ෂ 10 න් ඉතුරු කඩ කාමර ටික හදල ඉවර කරන්න පුලුවන් කියලා. නමුත් ඒ ලක්ෂ 10 නුත් කරල මගදි නතර වුනොත් එහෙම අසාර්ථක භාවයට පත්වෙන හින්ද තමයි මම ඔබතුමාට කිව්වෙ ආණ්ඩුකාරතුමා,පළාත් පාලන කොමසාරිස්තුමා මේ සමබන්ධව දැනුවත් වෙලා ඉන්නෙ. ඉතිරි වැඩ කොටස ඔබතුමාගෙ අතේ තියෙන්නෙ. ඔබතුමාගෙ අයිතිය සතු දේපොල මේ තියෙන්නෙ. මෙව දියුනු කරල ගත්තම ඔබතුමා නායකත්වය දරන සභාවක් තුල ඔබතුමාටයි ගෞරවය හිමි වෙන්නෙ. ඒ නිසා සභාපතිතුමනි මේ පිළිබඳව ඉතාමත් කැපවීමෙන් වැඩකරන්න.

අනිත් කරුණය ප්ලෑන් එකක් පාස් කරන්න මෙහේට ආවට පස්සෙ සති තුනක් මාසයක් යනවා.ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දැනුම් දුන්නා. දවස් තුනක් හතරක් යන කොට අවශ්‍ය සැලසුම් අනුමත කරල දෙන්න වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න කියලා. මම අහනවා ගරු සභාපතිතුමනි අද සියලු දෙනා බැංකු ණය මත තමන්ගෙ දේපොල බැංකුවට තියලා. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ගන්න ගොඩක් කල් යනවා කියල මේ හැමෝම දන්නවා. ඒක නිසා ගරු සභාපතිතුනි මේ සභාව ඒ වගේ සැලසුම් අනුමත කිරීමේදී ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගත්තද? ඒ ක්‍රියාමාර්ග මොනවද කියලත් මම ගරු සභාවෙන් දැන ගන්න කැමතියි. මොකද දිදෙන් දින මා හට පැමිණිලි රාශියක් එනවා. මොකද හේතුව අද ආවහම එකක් කියනවලු. හෙට ආවහම එකක් කියනවලු. ගිහිල්ල බැලුවම තව එකක් කියනවලු. මේකෙ එහෙම ක්‍රමවේද ක්‍රියාත්මක වෙන්න බැහැ.

අනිත් එක තමයි සභාපතිතුමා මේකෙ ඉන්නවා අනියම් ආදේශක කොන්ත්‍රාත්ද මම දන්නෙ නැහැ. ඒ මිනිස්සුන්ට පත්වීමක් තියෙනවා. දැන් අවුරුදු ගණනක් වෙනවා. අවුරුදු හතරහමාරක් පහක් වෙනවා. ඒ මිනිස්සු රුපියල් 750 ට 850 ට අදත් වැඩ කරනවා. ඒ මිනිස්සු කරන සේවය පිළිබඳව සභාවෙ සියලු දෙනා ඇගයීමකට ලක්කරනවා. නමුත් රුපියල් 850 කින් මේ මිනිස්සු ජීවත් වෙන්නෙ කොහොමද කියල කල්පනා කරන්න ඕන. පහුගිය දවස්වල එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ දින 180 ට වැඩි

සියලු සේවකයන් ස්ථිර කරන්න චක්‍ර ලේඛයක් ආවා. නමුත් ඒ මිනිස්සුන්ට ඒ චක්‍ර ලේඛය තුල තමන්ගෙ රැකියාවෙ ස්ථිර භාවය සනාථ කරගන්න අවස්ථාවක් ලැබුනෙ නැහැ. නමුත් මේ අවස්ථාවෙදිත් චක්‍ර ලේඛයක් ආවා. දින 180 ට වැඩි සියලු සේවකයන් ස්ථිර කරන. නමුත් ඒ මිනිස්සුත් මේ සභාවෙ ඉන්න සේවකයො. අවුරුදු පහක් හයක් මේකෙ කඹුරල ඒ මිනිස්සුන්ටත් මේ සභවෙ අයිතිවාසිකම් ලබා දෙන්න ඕන. ඒ නිසා ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ අය ස්ථිර කරන්න කටයුතු කරන්න කියලා. එහෙම නැත්නම් ඒ කටයුතු කෙරෙනකම් ඒ අයට කීයක්හරි වැඩිපුර ගෙවන්න. මම මේ සභාවෙ මන්ත්‍රීතුමන්ලගෙන් මන්ත්‍රීතුමියන්ලගෙන් ඉල්ලා සිටිනවා.කීයක්හරි වැඩිකරල දෙන්න. වැඩ කරන මිනිස්සු ටිකක් ඉන්නෙ.

ගරු සභාපතිතුමනි මම ඔබතුමාගෙන් නැවත වාරයක් ඉල්ලන්නෙ කේ. ඩී. ඩබ්ලිව්. ආයතනය සමග සම්බන්ධතාවය ගොඩනගාගෙන. ඉතාම ඉක්මනින් ඒ නෛතික ලියවිල්ල කොන්දේසිවලට යටත්වෙලා. අවශ්‍ය කරන සහයෝගය ඉතාම ඉක්මනින් ලබා දෙන්න කියලා. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම උඩුගම පොල වෙනුවෙන් සපිරි ගමක් යටතේ දාපු. ලක්ෂ 10 යේ මුදලින් ඒ වැඩකොටස ඉවර කරගෙන ඒ පොල භූමියට නැවතත් අපට ගාල් වෙන්න බැරිවුනොත් ඒ වැඩ කොටස නිම කරගන්න අවශ්‍ය කරන පහසුකම දායකත්වය මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි අවස්ථාව ලබා දුන්නාට බොහොමත්ම ස්තූතියි. මේ දේවල් ඉතාම ඉක්මනින් නිවැරදි කිරීම් බලාපොරොත්තු වෙන බවත් මම ඉතාම ගෞරවයෙන් මතක්කර සිටිනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරුසභාපතිතුමනි දීර්ග වශයෙන් කරුණු දැක්වුවා. එවන් මොහොතක මැතිවරණයක් අතලඟ තියාගෙන විනෝද ගමන් ගිහිල්ලා. හෙට අනිද්ද වෙනකොට ඒ විනෝද ගමන ගියාවගේ විනෝදෙන්ම මේ මැතිවරණයටත් මුහුණ දෙන්න ලැබේවා කියල මම පළමුවෙන්ම ප්‍රාර්ථනා කරනවා. ඊලඟ සභාව එන්නෙ 14 වෙනිදට එදාට සිංහල අලුත් අවුරුද්ද ඒක නිසා මම හිතන විදිහට ඊලඟ සභාව අවුරුද්දට ඉස්සරවෙලා පළවෙනි අගහරුවාදා තියා ගත්තොත් හොඳයි. නැත්නම් තියන්න වෙන්නෙ නැහැ. ඊලඟට 25 මැතිවරණය තියෙනවා. ඔබතුමාල අධ්‍යාපන චාරිකාව යනකොට ඒ සභාවල මන්ත්‍රීවරුන්ගෙ අතේ දින පොතක් තිබුනද? නාගොඩ සභාවෙ මන්ත්‍රීවරුන්ගෙ අතේ දින පොතක් තියෙනවද? මගේ අතේ නම් 2019 දින පොත තියෙනවා. මේ දින පොත අපි එලියට අල්ලගෙන යන කොට නිකන් කඩෙන් ගනාපු දින පොතක් වගේ නෙවෙයි. ප්‍රධාන අමාත්‍යාංශය දකුණු පළාත කියල දැක්කම පළාත් සභාවෙ කෙනෙක් තමයි කියල නොදන්න මිනිහා හිතනවා. අන්න ඒ වගේ අඩුම ගානෙ නාගොඩ ප්‍රාදේශිය සභාව කියල ගහල මේ 27 දෙනාට දින පොත් ලබා දෙන්න කියල මම යෝජනා කරනවා.

ඒ වගේම දීර්ග වශයෙන් කරුණු දක්වපු වෙලාවක අර උඩුගම ක්‍රීඩා පිටිය සංවර්ධනය කරන්න ඉල්ලුවනම් ඉල්ලුවෙ මට දැනෙන විදිහට ආදරයටමත් නෙවෙයි. ඒක කෙරෙනවා නම් පස්ටික එයාල ගනීවි. එහෙමනම් පස්ටිකට අපි මුදල් අය කරන්න ඕන. අපේ ප්‍රදේශවල දැන් දිගටම පස් කියුබ් එකක් රුපියල් දහස් ගණන්වලට කපනවා. ඒ මිල ගණන් අනුව සොයා බලල සුදුසුනම් ලබා දෙන්න. එහෙම දෙනවානම් අපේ සම්පත් දීල ආදායමක් ගන්න.

ඊලග කාරණය අපි සභාවෙ යම් යම් දේවල් යෝජනා කරනවා. මේ යෝජනා කරන දේවල් පිළිබඳව පසු විපරමක් කරනවද කියලා මට පුංචි සැකයක් තියෙනවා. අවුරුදු දෙකක් තමුන්නාන්සෙල අපි යෝජනා කළා. පසු විපරමක් වෙනවානම් අපේ පතිනායක මන්ත්‍රීතුමා කිව්ව වගේ ඊලග සභාවෙ මෙන්න ඔබ කරපු යෝජනාවට ප්‍රතිඵලය කියල මේ වනතෙක් අපට ඇහිල නැහැ. මම ගිය සභාවාරේ පැහැදිලිවම පරිසරය පිළිබඳව,වාහනවලට ලාම්පුතෙල් ගහන එක පිළිවඳව කිව්වා. අඩුම ගානෙ වෙන

මොකුත් ඕන නැහැ. ඒක අදාල තැනට යොමු කළයි කියලා. ඒකෙ පිටපතක් ආවනම් පුංචි සතුටක් තියෙනවා. මාසෙකට දවසක් අපි මෙතනට ඇවිල්ලා කියපු කාරනේ මොනව හරි සිද්ධියක් වෙලයි කියලා. ඒක සාමාන්‍ය දෙයක් හැටියට හිතන්න එපා. විශාල පරිසර විනාශක් පිළිබඳ යෝජනාවක් ගෙනාවම ඒකෙ ප්‍රතිඵලය කුමක්ද? කියල දැනගන්න අපි කැමතියි. සභාවෙන් මෙන්න මේ යෝජනාව ආව කියලා අඩුම ගානෙ පරිසර ඇමතිතුමාවත් දැනුවත් කරන්න. මොනවාහරි ප්‍රශ්නයක් වුනොත් අපට කතා කරන්න පුලුවන් අපි මීට කලින් මේ සම්බන්ධව දැනුවත් කරල තියෙනවයි කියලා.

ඒ වගේම නිලධාරියෙක් ගියෙ නැතෙයි කිව්වා ඌරල පොදු ලිදට කරපු හානිය බලන්න. මමත් කල්පනා කළා මේ ලිද ඇත්තටම දැන් පරිහරණය කරන්න බැරි තත්වයක තියෙන්නෙ. ඇස්තමේන්තු සකස් කරල ඒක සභාවෙන් කළත් වරදක් නැහැ. අද වතුර පිපාසෙන් සතා සිව්පාව විතරක් නෙවෙයි මනුස්සය පවා දුවනවා. එවැනි යුගයක් ඒ නිසා ඒ පිළිබඳව සැලකිල්මත් වෙන්න. මට මතක් වෙනවා. මට හිනහත් යනවා. ටැංකි 16 ක් 17 ක් තිබ්බ්ච සභවේ ටැංකි දෙකයි තියෙන්නෙ. මම එදා වැලිවිටියෙ සවිකරපු ටැංකිය තියෙනවා. අදත් ඒකෙන් වතුර බොනවා. ඒක එතන සවි කළේ නැත්නම් අද ඒකත් නැහැ. මොන පාර්ශවයෙන් මේව පාලනය වුනත් අද ඒ ටැංකි තිබුනනම් හැම හන්දියක් ගානෙම තියන්න තිබුනා. අද ඒවා විනාශ කරපු එකේ ප්‍රතිපල භුක්ති විදිනවා. ඒ නිසා අපි කරන හැම කටයුත්තකදිම ඒ පිළිබඳව දැඩි අවදානය යොමු කරන්න ඕන.

ඒ වගේම තොටුපොලවල් හදල ඉල්ලුවා. ඔය තොටුපොලවල්වලට ඉතිහාසයක් තියෙනවා. අපිට මතකයි මේ තොටුපොලවල් විනාශ කළෙත් අපේ මිනිස්සුමයි. මීට යුග කිහිපයකට උඩදි සිදු වෙච්ච සිදු වීම් නිසා තමයි අද ගඟ විනාශ වෙලා තියෙන්නෙ. ඉස්සර ඔය ගග ලස්සනට තිබුනා. මිනිස්සු ගගෙන් වතුර බිව්වා වතුර නා ගත්තා. අපිත් නාල තියෙනවා. එදා මාපලගම්න් ගත්ත වතුර කලය අද වක්වැල්ලට ගිහිල්ල සල්ලි වලට ගේනවා. මේ පරිසරය විනාශ කළේ අපිමයි. අන්න එ්ක නිසා අපි පරිසරය පිළිබඳව කතා කරන කොට ඒ පිළිබඳ සැලකිලිමත් වෙන්න. තව අවුරුදු 10 කින් අපි නැතිවෙන්න පුලුවන්. අපි ඔය ලාම්පු තෙල් කතාව කියන කොට ලෙඩ්ඩු පෝලිමේ යන කොට හදවත් සැත්කම් කරන කොට වෛද්‍ය වාර්තාව දේවි මෙන්න මේව තමයි හේතුව වෙලා තියෙන්නෙ කියලා. එන්න එන්න ලාම්පු තෙල් වලින් දුවන බස් වැඩිවෙනවා. මේ වගේ කටයුතුවලදි මේ පුංචි ප්‍රාදේශීය සභාවෙන් ඒක පෙන්නල දුන්නට පස්සෙ ඒක තමයි මේ රටටම මුලු ලොවටම පනිවිඩයක් වෙන්නෙ. නමුත් එකෙක් දෙන්නෙක් මැරුණට පස්සෙ ලාම්පුතෙල් විස වෙලා හෘද රෝගයක් වැලදිලා අකාලයේ මැරුණයි කියලා දේශපාලඥයො ඇවිල්ල කතා කරල ලකුණුත් දා ගනීවි. ඒක තමයි අද සිදු වෙන්නෙ. ඒ නිසා ඒ ලකුණ කරා නෙවෙයි යන්න ඕන. මේව අපට නතර කරන්න පුලුවන් තවම. මේවට මේ රටෙ නිලධාරි නැද්ද මේව අල්ලන්න බැරිද ඒනිසා මම නැවත මතක් කරනවා. කරුණාකරල අදාල ආයතනවලට යොමු කරන්න.

ඒ වගේම තමුන්නාන්සෙල සස්ශ්‍රීක රටක් ගැන කතා කළා. අත්තටම සතුටුයි. එහෙම වෙනවනම් හොඳයි. නමුත් මේ මොහොත වෙන කොට එහෙම වෙලා නැහැ. මේ මොහොත වෙන කොට ජීවත් වෙන්න බැරි රටක් නිර්මාණය වෙලා තියෙන්නෙ. අද බලන්න ආර්ථිකය එදා ආණ්ඩුවෙන් රපියල් 10000 වැඩි කළේ නැත්නම් අද බඩු මල්ල අරගෙන එන්න බරි තත්වෙට පත්වෙලා තියෙනවා. තවම හාල් කිලෝ එක රුපියල් 84 අඩු කරන්න බැරිවුනා. මම පෙරේද සතොසෙන් හාල් ගත්තා කිලෝ එක රුපියල් 84 යි අනූ ගණනට තව එකක් තිබුණා. සමූපකාරයට සතොසට යනකොට කීයක්හරි අඩු ඇතෙයි කියලා අපේ මතයක් තියෙනවා. ඒක නිසා මම එතනට ගියා. පරිප්පු 110 කාපු ඉතිහාසෙ අමතක කරල දැන් සස්ශ්‍රීක රටක් ගැන කතා කරනවා. ගෝඨාභය මහත්තය හොඳ වෙන්න පුලුවන් ආර්ථික සැලසුමක් නැහැ කියල මම කියනවා. මේව මෙතන සභාවෙ කතා කරල වැඩක් නැහැ. 100 ට 110 ට කාපු පරිප්පු කිලෝ එකක් අද 140 ට එහා. සීනි ටික මේ හැම දෙයක්ම මිල වෙලා. විශ්‍රාමිකයො අන්න ගාල්ලෙ ඉන්නවා වැඩිකරපු සොච්ම දෙන්න කියලා. එවැනි යුගයක් අද

තියෙන්නෙ. රෝහලට ගියාම හැම පෙත්තක්ම අද ෆාමසියෙන් ගන්න වෙලා තියෙන්නෙ. පිළිකා රෝගීන්ට පිටින් බෙහෙත් ගන්න ගියාම එක බෙහෙත එක් ලක්ෂ 50000 යි එක් ලක්ෂ 75000 යි. මේ සත්‍ය කතා කියන්නෙ. එදා ඒව නොමිලෙ දුන්නා දැන් අමතක ඇති. අපි කරපු වැඩටික යටපත්වෙලා යනවා. මිනිස්සුන්ටත් මතක නැහැ. එවැනි තත්වයක් අද තියෙන්නෙ. අපේ ගම්වල දරුවො සුරකෂා රක්ෂණයෙන් රුපියල් 50000 හ 75000 හ ගත්තා. අද සතපහක් ලැබෙන්නෙ නැහැ. පෝශන මල්ල, වැඩිවෙච්ච කිසිම දීමනාවක් ලැබෙන්නෙ නැහැ. ඔබතුමාල මොනවා කිව්වත් අද හරිම අමාරුවෙන් ජීවත් වෙන්නෙ. ඒ අස්සෙ පැවිල්ලත් ආවා. සිංහල අලුත් අවුරුද්ද කොහොමද කියලා බලාගන්න පුලුවන්. හෘද සැත්කම් තමුන්නාන්සෙල දන්නවා. මමත් අවුරුදු 10 ට 15 ට උඩදී ස්ටෙන්ස් තුනක් දාගෙන ඉන්නෙ. ඊට පස්සෙ අපේ පහුගිය ආණ්ඩුවෙන් නොමිලෙ දුන්නා. අද ආපහු මුදල් ගෙවන්න ඕන නොමිලෙ නැහැ. ඇස්වලට සිවිකාව නොමිලෙ දුන්නා. මොනවද මේ කතා කරන්නෙ කියලා මට පුදුමයි. හැබැයි හොඳ දේවලුත් ඒ අස්සෙ වෙනවා. අනාගතේදිවත් තමුන්නාන්සෙලට මෙවයින් අස් පැදිල ගමනක් යන්න ලැබේවායි කියල පාර්ථනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි වීපී ලාම්පු කටඹුරාව හන්දියට එකයි. ගල් කන්ද හංදියට එකයි. ඌරල සතොස ලගට එකයි. වශයෙන් වීපී ලාම්පු තුනක් ලබා දෙන්න කියලා මම විශේෂයෙන්ම මතක්කරනවා. සභපතිතුමනි අලුත් ලාම්පු සවිකරන කොට පැරණි ලාම්පුව ගලවගෙන අතුරු මාර්ගයකට සවිකරන්න. ඒවගේම අපේ වසන්ත මන්ත්‍රීතුමා සංවර්ධන මුදල් ලිළිබඳව කිව්වා. ඔබතුමාල ඒකට කිව්වා අපි ඒක පරාජය කළයි කියලා. පරාජය කරන්න හේතුව මේ යෝජනාවට අලුතෙන් වියදම් එකතු කළා. පාර්ලිමේන්තුවෙදි අපි අනවශ්‍ය විදම් අයින් කර ගන්න කියලා කිව්වා. ඒක වුනේ නැති නිසා තමයි පරාජය කලේ. කාටවුනත් අසාධාරණයක් වෙලා තියෙනවා. එක නිසා මේ වෙලාවෙ අපේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. මොකද මැතිවරණ කාලයක් නිසා මේක කාලයක් ප්‍රමාද වෙන්න තිබුනා. තමුන්නාන්සෙල පාලක පක්ෂය විදිහට සංවර්ධන කමිටුවලදි මේ යොජනාව දෙන්න පුලුවන්. ඒ නිසා මම හිතනවා ඒ කටයුත්ත සිදුවේය කියලා.

මම අද දවසේ මීට වැඩිය කාලය ගන්න යන්නෙ නැහැ. මොනවා කතා කළත් කතා කරල ගෙදර යන එක විතරයි. ඒක නිසා මේ කතා කරන දෙයින් තමුන්නාන්සෙලවත් ප්‍රයෝජනයක් ගන්න. අපි යෝජනාවක් ගේන කොට යෝජනාවෙ හොඳ ටික ගන්න. අරගෙන ඒ යෝජනාව ඉටු කරන්න. දැන් අවුරුදු දෙකක් ගිහිල්ල ඉවරයි. තුන්වෙනි අවුරුද්දෙත් අපිට මේව කතා කරල වැඩක් නැහැ. ජනාධිපතිතුමා දූරින් ගහ ගාවට අපු නිසා දෙයියන්ගෙ පිහිටෙන් ඔබතුමා අද බේරුනා. කොහොම වුනත් අපේ මේ කෙරෙන කටයුතු වලදි අධ්‍යාපන චාරිකා දෙකක් ගියා. මම ඒකෙත් පොඩි අඩුපාඩුවක් පෙන්වනවා. ගිය එකේ වරදක් නැහැ. ඉස්රවෙලා ගියා සේවක අධ්‍යාපන හා විනෝද චාරිකාව. ඒකට සේවකයො ගිහිල්ල තියෙන්න පුලුවන් නමුත් විකල්පයක් තියෙන්න ඕන. මම තල්ගස්වල පැත්තට යන කොට මට චෝදනාවක් එනවා.ඒක බරපතල චෝදනාවක් ආයුර්වේදෙ බෙහෙත් කලවම් කරල තියෙන්නෙ මේකෙ කම්කරු මහත්මයෙක්. ඒ පැත්තෙ ඉන්න තමුන්නාන්සෙලට ආරංචි වුනාද දන්නෙ නැහැ. මම එතන එහා කඩේ ලග වාහනේ නැවැත්තුවම මටනම් කිව්වා. අද අලුත් එක්කෙනෙක් බෙහෙත් කවලම් කරනවයි කියලා. මේ චාරිකාවට අපි විරුද්ද නැහැ. පෞද්ගලිකව කරපු පුද්ගලයට මගේ චෝදනාවක් නැහැ. මෙතන ඉහල නිලධාරියෙක් සේවකයෙකුට යම්කිසි රාඩකාරියක් පැවරුවොත් ඒ සේවකයා බැදී සිටිනවා පවරන ලද රාජකාරිය ඉටු කරන්න. කරුමෙටවත් කවලම් කරපු බෙහෙත වැරදුනානම්,වෛද්‍ය වරියත් මීට වැඩිය හිතන්න ඕන. සුදුසුකම් නැති පුද්ගලයෙක්නම් එතනට යැව්වෙ ඔහු නැවත හරවා යවන්න වෛද්‍ය වරිය දැනගන්න ඕන. මේ වැඩේ මේ විදිහට දවස් තුනක් වෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි මේව ගැන දැඩි විමසිල්ලෙන් ඉන්න. අපේ ලේකම් තුමියටත් මම කියනවා. දැඩි විමසිල්ලෙන් ඉන්න. වැරදුනදාට අපි සියලු දෙනාට චෝදනාව ඒවි. ඒ නිසා දැඩි විමසිල්ලෙන් කටයුතු කරන්න කියලත් ඉල්ලා සිටිනවා. උඩුගම සමහර ආයතනවල මුරකාර

මහත්වරුත් ඉඳල නැහැ. අපි මේ චාරිකාව පිළිබඳව නෙවෙයි කතා කරන්නෙ. සියලු සේවකයින්ට ඒ අයිතිවාසිකම් තියෙනවා. සේවකයින් ඒ අයිතිවාසිකම් භුක්ති විඳින කොට මහජනයගෙ පැත්ත ඊට වැඩිය හිතන්න ඕන. මේක මහජනතාවත් එක්ක සම්බන්ධ වෙච්ච ආයතනයක් ආයුර්වේදයට බෙහෙත් ගන්න යන්නෙ සල්ලි නැති උදවිය. සල්ලි තියෙන උදවිය කරාපිටියට ගිහිල්ලා චැනල් එකක් දාල වෛද්‍ය වරයට පෙන්නලා එනවා. සල්ලි නැති උදවිය ආයුර්වේදයට යන්නෙ නොමිලේ බෙහෙත් ටික ගන්න. ඒක වැරදි විදිහට පෙච්චොත් සියලු දෙනා අමාරුවෙ වැටෙනවා. ඒ නිසා මම ඒ පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමාල දැනුවත් කළේ ලබන අවුරුද්දෙ මෙහෙම දෙයක් නොවේවා කියල ප්‍රාර්නා කරමින්, තමුන්නාන්සෙල ගියපු චාරිකාව පිළිබඳ වැරදි වැටහීමක් ඇතිකර ගන්න එපා. මට යන්න පුලුවන් වුනානම් මමත් යනවා. ඇත්තටම මම අසනීප තත්වෙන් සිටී නිසා සහභාගී නොවුනේ.

තමුන්නාන්සෙල දැන් අපේ ජනාධිපති කෙනෙක් ඉන්නවා. අපේ ආණ්ඩුවකුත් එයි කියලා සිිහින ලෝකෙක ඇත්තෙ නේද?. බය වෙන්න එපා අපි UNP ලකුණ අලියා. එකාට බැස්සත් එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහනය වෙනුවෙන් මේ සභාවෙත් පිටත් අපි වැඩ කරනවා. අපේ වචන දෙකක් නැහැ. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ අපි මනත්‍රීවරු 07 ක් ඉන්නවා. මුලු රටම ගියත් අපි එක්සත් ජාතික පක්ෂය දාල යන්නෙ නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් පිහිටවන්න මේ සැරේ බැරි වෙන්න පුලුවන්. පක්ෂෙය් ජයග්‍රහනය වෙනුවෙන් හා තමුන්නාන්සෙලගෙ සිහිනය බොඳ කරන්න කටයුතු කරනවා. අපේ මිනිස්සුන්ට පුරුදුවෙලා තියෙන්නෙ අලියට ගහන්න. දැන් තියෙන්නෙ මේ අලුත් දුරකතන. ජන්ද ලකුණ ඉස්සර තිබුන පැරණි දුරකතනය. වයසක උදවිය වතු ජනතාව ගිහිල්ල බලන්නෙ දැන් තියෙන දැකල පුරුදු දුරකතනය. ඒක නැති වුනාම උඩින්ම අලිය ඉන්නවා. අලියට ගහල ගෙදර යනවා. ඊලග සභාව වෙන කොට උනුසුම්ම වෙලාව වෙන්න පුලුවන්. අවසාන වශයෙන් මම කියන්නෙ. අපි සියලු දෙනා පහු ගිය මැතිවරණයට වගේ සතුටෙන් සාමයෙන් මුහුණ දීල මේ සභාවෙ කටයුතු තව දීර්ග කාලයක් අපට එකතුවෙලා කරන්න වෙනවා. ඒ කටයුතුත් සාර්ථක කරගන්න ලැබෙන්න කියලා පාර්ථනා කරනවා. තමුන්නාන්සෙලාට ජයග්‍රහනය දෙන්නෙත් නැහැ. අපි අන්තිමට එකතු වෙනවා. කඳවුරු දෙකකින් ඇවිල් තමුන්නාන්සෙලගෙ ඩිලාන් මන්ත්‍රීතුමා එදා කිව්වා වගේ අපි පත්මෙ වඩින්නෙ එකට. මොන මැතිවරනෙ ආවත් අපි සියලු දෙනාට සමගියෙන් සතුටින් ඉන්න ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මේ දිනවල තියෙන දැඩි නියං තත්වය නිසා හැම තැනටම වතුර ප්‍රශ්න තියෙනවා. මම මේ සභාවටත් ඔබතුමාටත් කිහිප වතිවක් දැනුම් දුන්නා. මට වතුර නෙවෙයි ඉල්ලුවෙ. ලිදක් තියෙනවා ඒක ඉහල ඒ ප්‍රදේශයේ ජනතාවට ජලය ලබා ගන්න අවස්ථාව දෙන්න කියලා. නමුත් අද වෙනතුරුත් ඒක කෙරුනෙ නැහැ. අද උදෙත් මම මේ ස්ථානයට පැමිනිල ඒ ගැන විමසුවා. කම්කරුවො නැතිලු වාහන නැතිලු මෝටර් කැඩිලලු නමුත් සභාපත්තුමා මෝටරයක් දැනටත් තියෙනවා. වාහනෙත් තියෙනවා. උඩුගම ප්‍රදේශයේ කම්කරුවො කිහිප දෙනෙක් මේ වෙලාවෙත් වැඩ කරනවා. නමුත් එතන ඒ අයට අත්‍යවශ්‍ය භාරදූර කාර්යයක් නෙවෙයි කෙරෙන්නෙ. පුලුවන්නම් මේ අසවස්ථාවෙ ඔබතුමාගෙ අවදානය යොමු කරල මට ඒ ලිද ඉහ ගන්න වතුර මෝටරය ලබා දීල අවශ්‍ය කටයුතු කරන්න කියල ඉතා ගෞරවයෙන් ඉල්ලනවා.

ඒ වගේම සභාපතිතුමනි සභාව පටන් ගන්න වෙලාවෙම වැලි පොලක් අලුතින් පටන් ගැනීම සම්බන්දව කතා කළා. ගරු සභාපතිතුමනි කැටගොඩ ප්‍රදේශයේ ඒ වැලිවල සම්බන්දයෙන් මටත් ඒ ප්‍රදේශවාසීන් විසින් දැනුම් දුන්නා. මම ඒ ගම්වාසීන්ට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේක ආරම්භයේදීම ඔය මට්ටමින් නතර කරගැනීම පිළිබඳව. මොකද මම ඔය වගේ වැලි පොලවල් දෙකක් නිසා ලොකු අසරන භාවයට පත්වුනා. ලොකු කරදරවලට මුහුණ පාන්න සිදුවුනා. සභාපතිතුමාට

දහපාලොස් වතාවකට වැඩිය ඒ ප්‍රදේශවලට යන්න සිදුවුනා. මම මේක අවස්ථාවක් කර ගන්නවා ඒ ප්‍රදේශයේ ජනතාවට මේක දුරදිග යන්න කලින් මේ වැලිපොල මෙතනින් නවත්වා ගැනීමට කටයුතු කිරීම පිළිබඳව ස්තූති කරන්න.

ඒ වගේම නැවත වරක් මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මට අර ලිදේ වතුර ටික ඉහල ප්‍රදේශවාසීන්ට, පවුල් කිහිපයකටම ඒ ලිදෙන් වතුර ලබා ගන්න පුලුවන් ඒ ගැන අවදානය යොමු කරල මේ වෙලාවෙම ඒකට උත්තරයක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මම දැනගන්න කැමතියි. ගරු සභාපතිතුමනි පහුගිය සම්බන්ධී කරණ කමිටුවෙදි යෝජනා දෙකක් මම ගෙනාවා. පළවෙනි එක ගෝනදෙනිය වී ගබඩාව රජයට පවරා ගැනීම සම්බන්දව. ඒ යෝජනාව පහුගිය සභාවට දැම්මෙ නැහැ. මේ සභාවාරෙට දානවා කිව්වා. මේ සභාවාරෙට දාලත් නැහැ.

ඉන් අනතුරුව හැමදාම කතා කළා වගේ සභාවෙත් කත කළා. ප්‍රාදේශීය සම්බන්ධී කරණ කමිටුවෙත් කතා කළා. ගොම ඇදීම සමබන්ධව ඒ සම්බන්ධව. ක්‍රියාත්මක වීමක් සිදු වෙලත් නැහැ. ඊට පස්සෙ ගරු සභාපතිතුමනි උඩුගම රෝහලේ ජල ප්‍රශ්නය පිළිබඳව කතා කළා. ඔබතුමා තමයි ඉස්සෙල්ලම මැදිහත් වුනේ. උඩුගම රෝහලට ජල බවුසරයක් ලබා දුන්නා. ඒ පිළිබඳව උඩුගම ජනතාව වශයෙන් ස්තූති වන්ත වෙන්න ඕන. ඒ වගේම ගරු සභාපතිතුමනි මතක් කරන්න ඕන. උඩුගම දකුණෙ ලිදක් තියෙනවා. ටැංකියක් තියෙනවා. වතුර මෝටරය සහ බට එලීම පමණයි තියෙන්නෙ. ඒකෙන් උඩුගම රෝහලට විතරක් නෙවෙයි. අහල පහල තියෙන ගෙවල් දෙතුන් සියයකට වතුර දීමේ හැකියාව තියෙනවා. එතකොට ගරු සභාපතිතුමනි එදා ජනාධිපතිතුමා ආපු වෙලාවෙ අපි ඉල්ලීම කළා. ඒ සඳහා ලක්ෂ 25 ක මුදලක් ලබා දෙන්න ජනාධිපතිතුමා එකගත්වය පළකළා. සභාපතිතුමනි අපි ඒ මුදල ඉල්ලුවෙ සභාවට ඒ මුදල ලබා ගන්න සභාපතිතුමා ක්‍රියාත්මක වෙන්න. ඒ සමබන්දව සොයා බලන්න කියල මම ඉල්ලා සිටිනවා. දිස්ත්‍රික් සම්බන්ධී කරණ කමිටුව මෙහෙයවන්නෙ දිස්ත්‍රික් ලේකම්තුමා නිසා ඔබතුමා එතුමත් එක්ක කතා කරල මේ මුදලට මොකක්ද වෙලා තියෙන්නෙ කියල හොයල බලල ඒ මුදල අපට ලබා ගන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මීට අමතරව මම විශේෂයෙන් ස්තූති වන්ත වෙනවා. අතිගරු ජනාධිපතිතුමා උඩුගම ප්‍රදේශයට සම්ප්‍රාප්ත වුනා. විශේෂයෙන් මගේ කොට්ඨාසෙ ගෝනදෙනිය පාසල පිළිබඳ විශේෂ අවදානය යොමු කරල තිබුනා. අපි විශේෂ දෙයක් දැක්කා ඒ දේ සඳහන් කරන්න ඕන. සාමාන්‍යයෙන් සම්ප්‍රදාය තමයි අපේ විපක්ෂ නායකයෙක් එනකොට අනිත් පක්ෂෙ ඉන්න අය සම්බන්ධ වෙන්නෙ නැහැ. නමුත් අපි දැක්ක ගෝනදෙනිය ප්‍රදේශයට එක්සත් ජාතික පක්ෂයේ බොහෝ පිරිසක් සම්බන්ධ වෙලා තිබුනා. අපිටත් වැඩිය ඉදිරියෙන් හිටියෙ ඒ අය. අපේ තරංග මන්ත්‍රීතුමත් හිටියා. ඇත්තටම ස්තූති වන්ත වෙනවා. එතුමගෙ මහත්මා දේශපාලනයට ගෞරව කරනවා. මේ අවස්ථාවට ප්‍රාදේශීය සභාවෙ සභාපතිවරයට විතරයි ආරාධනාව ලැබුනෙ. මම සම්බන්ධ වුනේ ගම් වැසියෙක් විදිහට කටුපොල් ප්‍රශ්නය ගැන කත කරන්න. මට කටුපොල් ප්‍රශ්නය ගැන කතා කරන්න අවස්තාවක් ලැබුනෙ නැහැ. ජනාධිපතිතුමා සම්පූර්ණ කටුපොල් ප්‍රශ්නය ගැන කතා කළා. කතා කළා විතරක් නෙවෙයි ඒකට විසඳුමත් ලබා දුන්නා. මම ප්‍රාදේශීය සභාවට ආපු දවසෙ ඉදල කතා කළේ කටුපොල් ප්‍රශ්නය පිළිබඳව. උඩුගම ප්‍රදේශයට අවිල්ල ඒ ලබා දීපු විසඳුම පිළිබඳත් ගරු ජනාධිපතිතුමාට ස්තූතිය පුද කරන්න ඕන.

ඒ වගේම ඉතාමත්ම අබලන්ව තියෙන ගෝනදෙනිය පාසල පිළිබඳ අවදානය යොමු කරල තිබුනා. ඊට පහුවෙනිදම ගෝනදෙනිය පාසල සංවර්ධනය කිරීමට ඇවිල්ල තිබුනා. ඒ පිළිබඳව මේ අවස්ථාවෙදි මතක් කරන්න ඕන. ඒ වගේම ලංකාව පුරා කුඩා පාරවල් ලක්ෂයක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපේ ගම් ප්‍රදේශයේ ගෝනදෙනිය දිසානායක මාවතේ කිලෝ මීටර් දෙකක් කාපට් අතුරා සංවර්ධනය කිරීමට ඉසුරු දොඩංගොඩ ගරු මන්ත්‍රීතුමා කටයුතු කරල තියෙනවා. එතුමාට මගේ ස්තූතිය මේ වෙලාවෙ පුද කරන්න ඕන. ඒ වගේම හගරංවල මාමන දොල මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමට කටයුතු කරන සම්පත් අතුකෝරල මැතිතුමාට මගේ ස්තූතිය මේ අවස්ථාවෙ පුද කරන්න ඕන. ඒ වගේම උඩලමත්ත හගරංවල සමබන්ධ කරන මාර්ගය අපේ උප සභාපතිතුමත් යෝජනාව දාල තිබුනා. නමුත් ඒ යෝනාව උප සභාපතිතුමා මාව දැනුවත් කරපු විදිහට නිශාන්ත මුතුහෙට්ටිගම හිටපු නියෝජ්‍ය ඇමතිතුමා ඒ යෝජනාව නැවත ලබා දීල තියෙනවා. ඒ මාර්ගයත් කාපට් වෙනවා. ඒ පිළිබඳවත් මගේ හෘදයාංගම ස්තූතිය ජනතාව වෙනුවෙන් එතුමන්ලාට පුද කරනවා.

ඒ වගේම මම මේ අවස්ථාවෙ විශේෂයෙන් මතක් කරන්න ඕන. අපි අධ්‍යන චාරිකාවට සම්බන්ධ වුනා. අධ්‍යන චාරිකාවෙදි අපි කසල කලමනා කරණය ගැන තමයි කතා කළේ. විශේෂයෙන් ජනාධිපතිතුමා සඳහන් කළ දෙයක් තමයි. ඝන අපද්‍රව්‍යය මේ රටේ දැවැන්ත ප්‍රශ්නයක් කියන එක. ඊලග කැබිනට් එකට කසල සම්බන්ධ ඇමතිවරයෙක් පවා පත්කිරීමට එතුමගෙ යෝජනාවක් වුනා. මම කියන්න කැමතියි. අපේ සභාවෙ කිසිම අවදානයක් යොමු නොවෙච්ච දෙයක් ගැන. ඇප්තොප් වත්තෙ අපේ කසල කලමනා කරණ මධ්‍යස්ථානයක් තියෙනවා. ඔබ සියලු දෙනා දන්නවා ඇති මේ දකුණු පළාතෙන්ම උඩුගම නගරෙ කසල ප්‍රතිචක්‍රීයකරන මධ්‍යස්ථානයක් තියෙන්නෙ. ඉතා අඩු පහසුකම් යටතේ තමයි ඒක ක්‍රියාත්මක වෙන්නෙ. අපි අම්පාරෙ ගිහිල්ල දැකපු දේ ඒ විදිහටම උඩුගම සිදු වෙනවා. මේ කසල කියන්නෙ මුදල් කසල හරියට කලමනා කරණය කර ගත්තොත් අපට විශාල අයෝජනයක්. ඒ නිසා උඩුගම කසලකලමනා කරණ පුද්ලගික මධ්‍යස්ථානයක් තියෙනවා., ගාල්ල දිස්ත්‍රික්කයේ සාර්ථකව ක්‍රියාත්මක වෙන බලපත්‍රය ලබාගෙ තියෙන එකම මධ්‍යස්ථානය. මම ඒක බලන්න ගියා. ඇත්තටම ඉතාම සාර්තක විදියට ක්‍රියාත්මක වෙනවා. අපි ප්‍රාදේශීය සභාව විදිහට එම ස්ථානය හා ඇප්තොප් වත්ත අනුබද්ද කරලා මම ගරු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. යම් කිසි ව්‍යාපෘයක් ආරම්භ කරන්න පුලුවන්නම් ගරු සභාපතිතුමනි රටක් මුහුන දෙන මේ ගැටලුවට ප්‍රාදේශීය සභාව විදිහට මේ ගටලුවට යම් කිසි විසඳුමක් ලබා දෙන්න පුලුවන්නම් ඒක ඔබතුමාට විශාල ගෞරවයක් වේවි.

උඩුගම රෝහල ගැන කතා කරද්දි උඩුගම රෝහල ගැන ජනාධිපතිවරයත් විශේෂයෙන්ම සඳහන් කළා. කසල ප්‍රතිචක්‍රී කරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබා දෙන පරිසර ආරක්ෂණ පලපත්‍රය ලබාගත් දකුණු පළාතෙ එකම රොහල විදිහට වාර්තාගත වුනා. රෝහල් අධ්‍යක්ෂවරයා රෝහල් සෙකවන්ගෙ ගෙදර තියෙන කුනුටික පවා රෝහලට ගෙනැල්ල ඒව ප්‍රතිචක්‍රීය කරණය කරලා මේ කසල කලමනා කරණය හොදින් සිදු කරනවා. අපේ අධ්‍යන චාරිකාවෙ විශේෂ අරමුණ වුනේ කසල කලමනාකරණය පිළිබද අවබෝදයක් ඇතිකර ගන්න. කසල කලමනාකරණය පිළිබද විශේෂ වැඩසටහනක් මේ වසරතුල ක්‍රියාත්මක කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ප්‍රාදේශීය සභාවක ඉන්න ජනතා නියෝජිතයො වශයෙන් අපේ ප්‍රධාන කාර්යය වෙන්න ඕන. එදිනෙදා ප්‍රශ්නවලට වඩා අනාගතයේදී මේ රටට ප්‍රදේශයට මුහුන දෙන්න වෙන ගැටලු හදුනාගෙන. ඒ සමබන්ධව ක්‍රියාත්මක වීමත් දිගු කාලීන සැලසුම් සකස් කිරීම පිළිබඳවත් අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ කසල කලමනා කරනය ගැන මම පෙන්වා දීපු කසල කලමනා කරණ මධ්‍යස්ථානය හා අපේ ඇප්තොප් වත්ත ඉඩම ආශ්‍රිතව විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරන්න. ඒ පිළිබඳ ඔබතුමාගෙ අවදානය දැඩිව යොමු කරන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ඒ වගේම දැඩි නියගය පිළිබඳව කතා කරන්න ඕන. දැඩි නියගයට එක හේතුවක් කටුපොල් වගාව කියන එක මේ වෙනකොට දැනිල ඇති. කටුපොල් වවපු ප්‍රදේශවල මේ වෙනකොට ඇල දෙ ාලවල් ඉතාම කුඩා දිය සීරා බවට පත්වෙලා තියෙනවා. වෙනදා මාසයක් දෙකක් පැච්චත් ලොකු ප්‍රශ්නයක් නොතිබුනත් කටුපොල් ආශ්‍රිතව සිදුවෙලා තියෙන ගැටලු දැඩි තර්ජනයක්. ජනාධිපතිතුමා පොරොන්දු වෙච්ච විදිහටම අපි බලාපොරොත්තු වෙනවා ක්‍රියාත්මක වෙයි කියලා. මම ජනාධිපතිවරය නියෝජනය කරන පක්ෂය නියෝජනය කළත් මට ජනාධිපතිවරයාගේ වචනය විශ්වාස නැහැ. විශ්වාස නැහැ කියන්නෙ මේක නීත්‍යානුකූල විය යුතුයි. ගැසට් පත්‍රයකින් මේක එලි දැක්විය යුතුයි. කට වචනයට දේවල් සිදු කරන්න බැහැ. අපි බලාපොරොත්තු වෙනවා. ජනාධිපතිවරයා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා. පැහැදිලි ස්ථාවරයක ඉන්නවා කටුපොල් තහනම් කරන්න. මම බලාපොරොත්තු වෙනවා ඉදිරියෙදි අනිවාර්යයෙන්ම කටුපොල් තහනම පිළිබඳ ගැසට් එක ජනතාව අතරට එයි කියලා. මේ සමබන්දව නීතිය ක්‍රියාත්මක කරන්න බැහැ. දැනටත් හොරාට කටුපොල් ඉන්දනවා. මේ පිළිබඳවත් අවදානය යොමු වේවි කියල මම හිතනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරු ඇතුලු සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නෙ. පරිසරය ගැන මීට වඩා අපි අවදානය යොමු කරමු. පරිසරය ආරක්‍ෂා කිරීම අපි සියලු දෙනාගේ වගකීම කර ගනිමු. සභාපතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා මේ සංවර්ධන යෝජනා අතරෙ පරිසරය සාහිත්‍යය කලාව පෝශනය කරන වැඩ මේ සභාව හරහා සිදු කරන්න ගරු සභාපතිතුමාගෙ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිනවා. ඒ වගේම පුස්තකාල පහසුකම් අධ්‍යාපන පහසුකම් වැඩි දියුනු කරන්න සභාව හරහා මුලික වෙන්න කියල ඉල්ලා සිටිමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා නියෝජ්‍ය සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මාධ්‍යවේදී මහත්මයාණනි ලේකම් තුමියනි, මේ අවස්ථාවෙදි මුලින්ම ස්තූති වන්ත වෙනවා. අපේ ගරු සභාපතිතුමා සහ මන්ත්‍රී මණ්ඩලය පසුගිය සභාවාරෙදි අපි එකග තාවයට පත්වුන පරිදි අම්පාර සහ ත්‍රිකුණාමල ප්‍රදේශයේ අධ්‍යාපන චාරිකාවකට සහභාගිවුනා. මම හිතන්නෙ ඉතිහාසෙ පළමු වතාවට එවැනි චාරිකාවක යෙදෙන්න අවස්ථාව ලැබුනා. ඒක සංවිධානය කරන්න අපේ සභාපතිතුමා ලක්රුවන් මන්ත්‍රීතුමා සුභාෂි මන්ත්‍රීතුමිය මූලිකත්වය ගෙන කටයුතු කළා. ඔවුන් සියලු දෙනාටම මුලින්ම ස්තූති වන්ත වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි අපේ විලේගේ මන්ත්‍රීතුමා ජනාධිපතිතුමාගේ උඩුගම සංචාරය ගැන දීර්ග ලෙස කරුණු පැහැදිලි කළා. අපි පහුගිය මැතිවරණයෙදි පක්ෂ දෙකක් විදිහට ජනාධිපතිවරණයට ඉදිරිපත් වුනත් අපේ අපේක්‍ෂකයා පැරදුනාම  රටේ මිනිස්සු වැඩියෙන්ම කැමති පුද්ගලයා විදිහට ගෝඨාභය මැතිතුමා ජනාධිතිවරයා විදිහට පත්කර ගත්තා. එතුමා ගෝනදෙනියට බහින වෙලාවෙ මම මග හිටියෙ. නමුත් එතුමා නැවත ගුවන්ගත වෙන වෙලාවෙ මගේ දරුවොත් එක්ක ඒ ගුවන් ගතවීම පෙන්වන්න මමත් ඒ ස්ථානයට පැමිනියා. මම දැක්කා පක්ෂ බෙදයකින් තොරව ගමේ අය විශාල ප්‍රමාණයක් ඇවිල්ල ඉන්නවා. ඒවගේ කෙනෙක් ගමට ආපු එක ගැන අපිට ඇත්තටම සතුටුයි. මට මේ සභාවෙදි පුංචි අමුත්තක් ඇතිවුනා. මොකද අපේ විලේගේ මනත්‍රීතුමා ගොඩක් ආඩම්බරයෙන් ජනාධිපතිතුමා ගැන කතා කරගෙන ගිහිල්ල ජනාධිපතිතුමා සැකයි කියල එතුමාම කියනවා. මම ඔබතුමාට වැරද්දක් කියනවා නෙවෙයි. මම වැදිනම් ඔබතුමා නිවැරදි කරන්න. මොකක්ද හේතුව කියල මට තේරෙන්නෙ නැහැ. ඔබතුමාල පත්කර ගත්ත ජනාධිපතිතුමා ගැන අපි මේච්චර ප්‍රසාදෙන් කතා කරන කොට ඔබතුමාලට සැකයක් ඇතිවෙලයි කියලා විශ්වාසයක් නැහැ කියලා එතුමාම කතා කළා. ඒ ගැන මම කුතුහලය පලකරනවා.

ගරු සභාපතිතුමනි අපි ජනාධිපතිතුමාගෙ සංචාරය ගැන කතා කළහම ඇත්තටම අපි සතුටට පත්වෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් අපේ සමන් මන්ත්‍රීතුමා නියෝජනය කරන හොමදොල වසමට ජනාධිපතිතුමා ඇවිල්ලා. වෙනද වායුසමනය කරන ලද කාමරයක කරන සංවර්ධන රැස්වීම. දුප්පත් ගම්මානයකට ගිහිල්ල කරන්න කටයුතු කරපු එක ගැන අපි ඉතාමත් සතුටට පත්වෙනවා. තව පැත්තකින් මම තවත් සතුටු වෙනවා. එතුමා ආපු පන්සලට හාමුදුරුවො ත්‍රීරෝද රථයක් ඉල්ලුවා. ඊලගට උඩුගම රෝහලට ජල බවුසරයක් ලැබුනා. ඒක අත්‍යාවශ්‍යම මේ කාලෙ හැටියට වටිනම කාරණයක්. විලේගේ මන්ත්‍රීතුමා කිව්ව වගේ ජනාධිපතිතුමා ගෝනදෙනිය පාසලට සංවර්ධන කටයුත්තක් කරන්න එතුමා දායකත්වය දෙන්නම් කිව්වා. නමුත් මේ වෙනකොට වැඩ ආරම්භ කරල නෙවෙයි මන්ත්‍රීතුමනි. ඊට දවස් දෙකකට පස්සෙ නාවික හමුදාවෙන් ඇවිල්ල බලල ගිහිල්ල තියෙනවා. ඒ ඇරෙන්න එතනින් එහා සාකච්ඡාවක් වෙලා නැහැ. ඔබතුමාල මැදිහත්වෙලා ඒක කරනවානම් අපිත් දෙන්න පුලුවන් හැම සහයෝගයක්ම දෙනවා. මොකද මාස හය හතකට කලින් අපේ පළාත් සභා මන්ත්‍රී කෙනෙක්ගෙන් ලැබිච්ච ලක්ෂ 10 ක ප්‍රතිපාදනයක් අපි ඒ පාසලට යොමු කළා. අපි ඒ කටයුතු ඒ ආකාරයෙන් සිදුවෙන එක ගැන සතුටු වෙනවා. නමුත් ඒ කටයුත්තට මීට වඩා මැදිහත් වෙන්න වේවි.

ඒ වගේම ඔබතුමා කිව්ව වගේ ත්‍රීරෝද රථය ගැන ඔබතුමා කියන හින්ද කතා කරන්න ඕන. මම දන්න තරමින් ඒ කොට්ඨාසෙ පදිංචි වෙලා ඉන්නවා. නිශාන්ත මුතුහෙට්ටිගම මහත්මයත් එක්ක තරග කරපු අපේක්ෂක මහත්මයෙක් රසික නිරෝෂ කියලා එතුමාගෙ ඥාතියෙක් පන්සලේ හාමුදුරුවො. ඒ රසික මහත්මයා ලියුමක් ලියල හාමුදුරුවන්ට දීල තියෙනවා. හාමුදුරුවනේ මේකවත් ඉල්ල ගන්න කියලා. ජනාධිපතිතුමා යන්න පිටත්වෙන කොට හාමුදුරුවො ගිහිල්ල කිව්වට පස්සෙ ඒක බලල මම තවත් උත්සවයකටත් යනවා හාමුදුරුවනේ මම මේක කරන්නම් කියල සාක්කුවෙ දාගෙන ගිහිල්ල තියෙනවා. ඒක ඒ වගේම ඉටු වුනා. කොහොම වුනත් ඒ වැඩේ හොදයි. ජනාධියතිතුමාගෙ පැමිණීමත් එක්ක කට වචනෙකට පොඩි ලියුමකට ඒ වගේ දෙයක් ගමට ලැබීම ගැන අපි සතුටු වෙනවා. සභාපතිතුමනි හැබැයි මේ පැමිණීමෙන් අපි කණගාටුවෙන්න ඕන කාරණයක් තියෙනවා. මොකද ගාල්ල දිස්ත්‍රික්කයේ දුප්පත්ම ග්‍රාම සේවා වසම තියෙන්නෙ අපේ බල ප්‍රදේශයේ. අපි ප්‍රාදේශීය සභාව විදිහට දුප්පත් තමයි. නමුත් මේ ගාල්ල දිස්ත්‍රික්කයේ තියෙන ප්‍රාදේශීය සභා අතරින් දුප්පත්ම ග්‍රාම සේවා වසම වගේම දුප්පත්ම ප්‍රාදේශීය සභාව අපේ ප්‍රාදේශීය සභාව කියන එක ගැන අපට යම් කණගාටුවක් ඇති වෙනවා. මොකද පහුගිය අපේ රජය කාලෙ ඊට කලින් යෝජනා කරපු අයි රෝඩ් යටතේ මාර්ගය කාපට් කළ සමාගම තහනම් කරපු නිසා ඒකෙ ගොඩක් අඩුපාඩු තිබුනා. නමුත් ඒකෙ යම් යම් නිවැරදි කිරීම් ටිකක් ක්ෂණිකව කිරීමේ හැකියාව ලැබුනා. අපේ දුප්පත්ම ප්‍රාදේශීය සභාවෙ ගාල්ල දිස්ත්‍රික්කයේ දුප්පත්ම ග්‍රාම සේවා වසම අපේ කොටසේ පිහිටීම ගැන උඩුගම කෙනෙක් හැටියට මම කණගාටු වෙනවා. අපිත් ලක්ෂ තිහ හතලිහක කරන්න පුලුවන් වැඩ ඒ ගමට කළා. අයි රෝඩ් එක නම් ලක්ෂ එක්දහස් ගණනක වැඩක් ඒකත් කාලයක් තිස්සෙ නොකෙරී තිබිල ආරම්භ කරන අවස්ථාවට මමත් සමන් මනත්‍රීතුමත් සහභාගිවුනා. ඒ සමන් මනත්‍රීතුමා ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නත් කලින් අපි දෙන්න තමයි ගිහිල්ල පාරෙ වැඩ පටන් ගත්තෙ.

ඒ වගේම ගරු සභාපතිතුමනි ඔබතුමා LED වීථි ලාම්පු සවි කරන්න යෝජනා ස්ථිර කරගෙන හිටියා. ජනාධිපතිතුමා එන සතියෙ තමයි උඩුගම වීථි ලාම්පු සවි කළේ. නමුත් මුහුණු පොත හරහා සමහර තරුණයන් කියනවා. ජනාධිපිතුමා මාස තුනකට සැරයක්වත් මේ පැත්තට එනවානම් හොඳයි. මොකද එතකොට තමයි ප්‍රාදේශීය සභාවට ඇහැ ඇරෙන්නෙ කියලා. නමුත් ඒක නෙවෙයි සිදු වුනේ. ඔබතුමාල වාසියට වුනත් ඒ කටයුත්ත හොදයි. ඒක ජනාධිපතිතුමා ආපු එකට නොවුනත් මිනිස්සු අතරට මතයක් ගියේ ජනාධිපතිතුමා එන නිසා මේක කරනවයි කියලා. නමුත් මේ දුප්පත් ප්‍රාදේශීය

සභාවෙ කාගෙත් එකගත්වයෙන් සිදූ වුන කටයුත්තක්. ඒක කොහෙවත් මම දැක්කෙ නැහැ නිවැරදි කිරීමක් කරල තියෙනවා.

ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම නියගය ගැන කියන්න ඕන. නියගය ගැන අපේ පතිනායක මන්ත්‍රීතුමා මුලින්ම සඳහන් කළා. අනිකුත් මන්ත්‍රීවරුත් සඳහන් කළා. අපි ප්‍රාදේශීය සභාවක් විදිහට මේ නියගයට මුහුණ දෙන්න වැඩපිළිවෙලක් යොදල තියෙනවද කියල දැනගන්න කැමතියි. මොකද අපි ගංවතුරක් එනකොට නම් බඩු ගන්න කැම දෙන්න සාකච්ඡා වෙනවා. ඒක ක්ෂණිකව එනකොට අපි කළාට මේකට අපිට කාලක් තිස්සෙ හොදට ඉඩ කඩ තියෙනවා. සැලසුමක් හදලා කටයුතු කරන්න. ගංවතුර ආව ගියා ඒකට අධාර හම්බ වුනා. පහුගිය රජය කාලෙ එකෙන් මිනිස්සු ලාභත් ගත්තා. මේ නියගය අපට ඊට වඩා බලපාල තියෙනවා. මේ නියගය සඳහා අපි ප්‍රාදේශීය සභාව විදිහට යම් වැඩපිළිවෙලක් කරන්න ඕන. මේක අපට විතරක් අදාල දෙයක් නෙවෙයි. මේ කාලය වනවිට රටේ බොහෝ ප්‍රදේශවලට බලපාපු නියගයක්. විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමන්ල කියනවා. මගේ ලිඳ සුද්ද කරල දෙන්න මට වතුර ටැංකි දෙකක් දෙන්න මට දවසක් හැර දවසක් බවුසරයක් එවන්න කියලා. ඒවත් කරන්න ඕන. ඊටත් වඩා අපි ප්‍රාදේශීය සභාවක් විදිහට ඔබතුමාල 15 දෙනා හරි එකතු වෙලා. යම් වැඩපිළිවෙලක් සකස් කරන්න. දැන් තේ මැරෙනවා. සමහර තේ කර්මාන්ත ශාලාවලින් දවසක් හැර දවසක් දලු ගන්නෙ. සමහර කර්මාන්ත ශාලා සති ගණන් වහල තියෙනවා. ගිය සතිය පුරාම මහ ලියැද්ද තේ කර්මාන්ත ශාලාව වහලා. දන් අපි නොහිතන තත්වයකට පත්වෙලා තියෙනවා. ඉදිරියෙ සිංහල අලුත් අවුරුද්ද එන කාලය වෙන කොට ආර්ථික වශයෙන් අපි කවුරුත් සෑහෙන්න පීඩාවට පත්වෙනවා. ඔබතුමාලට මේක මග හරින්න බැහැ. ප්‍රාදේශීය සභාව විදිහටත් යමක් කරන්න ඕන. ඔබතුමාලට උඩින් ආණ්ඩුකාරතුමා ඉන්නවා. ඒ වගේම ආණ්ඩුව තියෙනවා. ජනාධිපතිතුමා ඉන්නවා. අගමැතිතුමා ඉන්නවා. ඒ නිසා වෙනද කිව්ව වගේ මග අරින්න බැරි තත්වයක් තියෙවා. පාලන අධිකාරිය එක පැත්තක් වෙල ඉන්න කාලෙක ඔබතුමන්ල මීට වඩා මැදිහත් වෙලා ඒ කටයුතු මේ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරු වෙන් වෙන් වශයෙන් කතා කරන්න කලින් අඩුම තරමින් අපේ ප්‍රාදේශීය සභාවට අයිති ලිං ටිකවත් ඉහල මේ සඳහා දැන් ආරම්භයක් අරන් තියෙන්න ඕන. මේ මන්ත්‍රීවරු සභාවෙ කතා කරනව වගේ ගම්වල ජනතාවට පුද්ගලිකව ජල ප්‍රශ්නය තියෙනවා. මටත් අද එහෙම වුනා. මමත් අද උදේ 4.00 ඉදන් වෙරංග මන්ත්‍රීතුමා එන කොටත් අපේ ගෙදර වතුර මෝටරය හදනවා. නමුත් හදාගන්න බැරිවුනා. මම ගම්ටික සුද්ද කළේ සභාවට ඇවිල්ල අද වතුර නැති නිසා දරුවන් පාසල් යවන්නත් බැරිවුනා. මට ඒක හොදටම දැනුනා. ජල ප්‍රශ්නය තදින්ම තියෙනවා. ඒක නිසා ප්‍රාදේශීය සභාව විදිහට යම් වැඩපිළිවෙලක් කරන්න. දැන් ඒකට සුදුසුම කාලය ලබන සභාව වෙනකොට පැවිල්ල මෙහෙම තිබුනොත් අපට මේ විදිහට කතා කරන්න වෙන එකක් නැහැ. ඊට කලින් මහජනතාව සභාව වටකරයි. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාව සතු ජල බවුසර් කිහිපයක් තියෙනවා. උඩුගම උප කාර්යාලයේ ඒව ගාල් කරල තියෙනවා විතරයි. ඒවයින් ප්‍රයෝජනයක් ගන්නවා පේන්නෙ නැහැ. සභාපතිතුමනි ඒ ගැන ඔබතුමාල මීට වඩා අවදානය යොමු කළොත් මේ ගැටලුව එක එක පැතිවලට තියෙනවා. නාගොඩ මාපලගම විශේෂයෙන්ම ඌරල කොතේගොඩට පැත්තට ඉක්මනටම වතුර අවශ්‍ය වෙනවා. උඩුගම ප්‍රදේශයෙත් ඉස්සර නැතිවුනාට දැන් එහෙමයි. විලේගේ මන්ත්‍රීතුමා කිව්ව වගේ කටුපොල් නිසා ඔක්කොටම කලින් ලිං හිදෙනවා. අපේ ලිඳ කවදාවත් හිදිල තිබුනෙ නැහැ. අද වෙනකොට අපටත් වතුර නැතිවෙලා. ඉතිං ඒ ගැන අවදානයක් යොමු කරන්න හොදම කාලය මේක. ලබන සභාවට කලින් ඒ ගැන ඔබතුමාලගෙ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි අධිවේගී මාර්ගයෙන් පැමින මේ ප්‍රදේශයට ගමන් කරන අයට බද්දෙගම පිවිසුමෙන් එලියට ආවම එක පැත්තක් වදුරඹට එක පැත්තක් උඩුගමට කියල බෝඩ් දෙකක් තියෙනවා. පිට ප්‍රදේශයකින් නොදන්න කෙනෙක් කන්නැලියට හිනිදුම කල්වාරියට යන්න ආවොත්

උඩුගම හරහා යන්න ඕන බව කවුරුත් දන්නවා. නමුත් නාගොඩින් හැරෙන තැන තියෙන්නෙ ගෝනදෙනිය කියලා. ගෝනදෙනිය කියලා බෝඩ් එක තියෙන එක ගැන මම සතුටු වෙනවා. මමත් ගෝනදෙනියෙ ගම් වැසියෙක් නිසා. නමුත් එතන තියෙන්න ඕන උඩුගම කියලා. කුරුපනාව පාරෙන් හැරෙන කොට උඩුගම කියල තිබුනනම් බද්දෙගම ඉදල එන කෙනාට සොයා ගන්න පහසුයි. ඒක නිසා මාර්ග සංවර්ධන අධිකාරිය ලවා උඩුගමට නිමිත දුර සදහන් කරල ඒ බෝඩ් එක නිවැරදි කරල උඩුගම කියල යොදවනවානම් හොදයි. දැන් ගොඩක් අය හිතාගන්න බැරිව මාපලගමට යනවා. ගල්වාන පාරෙ යනවා. ඒ නිසා එතනට උඩුගම කියල බෝඩ් එක යොදන්න කියලා මාර්ග සංවර්ධන අධිකාරියට ලිපියක් යවල දැනුවත් කරන්න කියල මම ලේකම් තුමියගෙන් ඉල්ලා සිටිනවා. මොකද එන කෙනෙකුට කාගෙන්වත් අහන්නෙ නැතිව උඩුගමට යන්න පාර සොයා ගන්න පහසු වෙනවා. මම මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ඒ කියපු කාරණා ගැන ඔබගුමාගේ විශේෂ අවදානය යොමු කරලා ලබන සභා වාරයට පෙර මේ සදහා ගතහැකි සුදුසු පියවරක් ගන්න කියල ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි මට විනාඩියක් දෙන්න. අපේ ධනංජය මන්ත්‍රීතුමා කතා කළ මගේ කොට්ඨාසයට අදාල ප්‍රශ්නයක් නිසා ඊට පෙර අවස්ථාවක ඔබතුමා සභාවෙ අපෙන් ඉල්ලා සිටියා. ජල ව්‍යාපෘතියක් පිළිබඳ තොරතුරු ඒ නිසා මම ඒ වෙලාවෙ ඒ ප්‍රදේශයේ ඒ කියන ජල ව්‍යාපෘතිය පරීක්ෂා කරන පිරිස් එක්ක ගිහිල්ල හොයල බැලුවා. ඒකෙදි දැන ගන්න ලැබුනෙ ඒ ටැංකිය දැනට ජලය ගන්න බැරි මට්ටමට තියෙනවා. අනික් සියලු ඒ බට එහෙම ඉවත් වෙලා තියෙන්නෙ. ඒ නිසා මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා. ඒ විතරක් නෙවෙයි දැන් අද උදේ මම සභාවෙ ඉන්න වෙලාවෙත් කැකිල්ල කන්ද ප්‍රදේශයේ අයටත් මේ ජල ප්‍රශ්නය බරපතල ලෙස බලපාල තියෙනවා. ඒ ගොල්ලො දැන් මට කිව්වෙ සභාපතිතුමාට කියලා ලිදක් හාරල මෝටරයක් දාල වතුර ටිකක් ගස්සල දෙන්න කියල ඒ ප්‍රදේශයට ඒ නිසා තව ඉල්ලීම් දෙකක් ඒ ප්‍රදේශයෙන්ම ලැබිල තියෙනවා. ඒ නිසා මම හිතන්නෙ වෙනදා නැති මට්ටමට ඔබතුමාට සිදු වේවි හෙට අනිද්දා වෙන කොට ඒ ප්‍රදේශයටත් ජල බවුසර් කීපයක් යවන්න. ඒ නිසා  මම ඉල්ලීම කරනවා. අපේ හිටපු සභාපති අජිත් එඩේර ආරච්චි මන්ත්‍රීතුමා කරපු ඉල්ලීම වගේම ඔබතුමාට ජනාධිපතිතුමා දෙන්න පොරොන්දු වෙච්ච ඒ මුදලත් ලබාගෙන ඒ ප්‍රදේශයේ සියලු ජල අවශ්‍යතාවයන් සම්පූර්න වෙන පරිදි ඒ සියලු මුදල් වලින් ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්න කියන ඉල්ලීම කරනවා. මම ඒක ලබන සභාවට යෝජනාවක් හැටියට සභාවට ඉදිරිපත් කරන බවටත් පොරොන්දු වෙනවා. ඒ එක්කම ඉල්ලීමක් කරනවා ඒ සඳහන් කරපු දැනට තියෙන ජල ව්‍යාපෘය පිළිබඳ අපේ සභාවේ නිලධාරී මහත්මයෙක් යොමු කරලා සො◌ායල බැලුවොත් ඒක මොනවගේ මට්ටමකින් කරන්න පුලුවන්ද බැරිද කියන එක පිළිබඳව අවශ්‍ය විමර්ශනයක් කරලා ඒ වාර්තාවත් අරගෙනම ඒ කටයුත්තට එළඹෙන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවෙ ප්‍රදේශ වාසීන් වෙනුවෙන් සභාවට ඉදිරිපත් කරනවා ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි මේ වෙලාවෙ හැමෝම නියගය පිළිබඳව කතා කළා. මගේ කොට්ඨාසය විතරක් නෙවෙයි මම ගරු සභාපතිතුමාට යෝජනා කරනවා. මේ වෙලාවෙ ජලය පමණක් නෙවෙයි මේ නියගයෙන් අපට අහිමි වෙලා තියෙන්නෙ. මේ නිගය නිසා කුඩා තේ වතු හිමියන් ඉතාම අසරණ තත්වයට පත්වෙලා තියෙනවා. මේ පිළිබඳව අපට සභාවක් හැටියට රජයේ අවදානය යොමු කරන්න පුලුවන්කම තියෙනවනම් යම් වැඩපිළිවෙලක් සකස් කරන්න කියන ඉල්ලීම මම පළමුවෙන්ම ගරු සභාපතිතුමාට යෝජනා කරනවා. ඒත් එක්කම පහුගිය කාලෙ සභාපතිතුමාගෙ මැදිහත් වීමෙන් උඩවැලිවිටිය ප්‍රදේශයෙ පළාත් සභාවෙන්  හදල දුන්න ලිදේ ජලය මේ වන විට පානය කරන්න එපා

කියලා තියෙනවා. දැනට මිනිස්සු පිටතින් වතුර අරගෙන එන්නෙ. ඒ නිසා එම ළිඳ පිරිසිදු කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සූදානම් කරල දෙන්න කියල ඉල්ලා සිටිනව. විශේෂයෙන් PHI මහත්මයත් එතනට යොමු කළ යුතුයි මම හිතනවා. ජලය පරීක්‍ෂා කරල තමයි බොන්න එපා කියල තියෙන්නෙ. ඒ පිළිබඳව අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ගඟ ආශ්‍රිතව නිසා ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කිව්ව වගේ මිනිස්සුන්ට ලිදක් භාර ගැනීමට අපහසු තාවය තියෙන නිසා ජල ප්‍රශ්නයත් දීර්ග වශයෙන්ම තියෙනවා.

විශේෂයෙන්ම අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් රජය පැත්තට යම් යම් චෝදනා කිහිපයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම ආයුර්වේදයේ බෙහෙත් කවලම් කිරීම සම්බන්ධයෙන් අපේ සහබන්දු මන්ත්‍රීතුමා සඳහන් කළා. නිවාඩු යන කෙනා වෙනුවෙන් මේ ආයතනයෙන් ඒ සඳහා පුහුණු ලත් කෙනෙක් යොදවල තියෙනවා. ඊලගට ඒකෙ වගකීම සම්පූර්ණයෙන් වෛද්‍ය වරිය දැරිය යුතුයි. මොකද ඒ ආයතනයේ වගකීම ඒ ආයතනයේ ප්‍රධානියට පැවරෙනවා. ඒ නිසා වෛද්‍ය වරිය තමයි මේ සමබන්ධයෙන් වග කිව යුත්තේ. මොකද එයාගෙන් බෙහෙත් ගන්න එන අයගෙ ජීවිතවල වගකීමත් වෛද්‍යවරියට තියෙන්නෙ. ඒ වගේම වනමල් මන්ත්‍රීතුමා සඳහන් කළා. සංවර්ධන යෝජනා ක්‍රම දැන් ඉතාම සීග්‍රෙයන් අපි පටන්ගෙන ඒ වගේම ගිය වර්ෂයේ සංවර්ධන යෝජනා සදහා මුදල් ප්‍රතිපාදන ලබා දුන්නේ නැත කියලා. 2020 වර්ෂය අලුත් වර්ෂයක් පෙර වර්ෂයේ ඇතැම් සංවර්ධන යෝජනා සඳහා ගෙවීමට ප්‍රමාණවත් මුදලක් ප්‍රාදේශීය ලේකම්ට නොලැබුන බව තමයි සඳහන් වෙන්නෙ. නමුත් ඒ විසර්ජන ගිණුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ කොන්ත්‍රාත් කරුවන්ට මුදල් ගෙවන්න. ඒ විතරක් නෙවෙයි. ඒ හරහා දැන් කෙරෙන ව්‍යාපෘති සඳහාත් මුදල් වෙන් කර ගැනීම සඳහායි. නැත්නම් ඊලග වර්ෂයේ අයවැයක් ඉදිරිපත් කරල තමයි මුදල් ප්‍රතිපාදන ලබා ගන්න වෙන්නෙ.

ඒ වගේම අපි ජනාධිපතිවරයෙක් තෝරාපත්කර ගත්තට ඇත්තටම මේ වකවානුව තුලදී 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව සියලු කාර්යයන් පැවරෙන්නෙ පාර්ලිමේන්තුවට. මේ පාර්ලිමේන්තුවට පැවරෙන කාර්යයන් අපට එකවිට සියල්ල කරන්න බැහැ. දැනට පොහොර සහනාධාරය නවත්වලයි කියල සඳහන් කළා. මේ සියලු කටයුතු කිරීම සඳහා රජය මුදල් ප්‍රතිපාදන පාර්ලිමේන්තුව හරහා වෙන්කර ගත යුතුයි. පාර්ලිමේන්තුවෙන් තමයි මුදල්වලට වගකියන්නෙ. ඒ නිසා මේ සියලු කටයුතු ඉටු කරන්න. කවුරු ආණ්ඩු කළත් ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවට මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කරලා. අය වැයක් හෝ අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවෙන් මුදල් ප්‍රමාණයක් වෙන්කර ගන්න ඕන. 2015 වේ අපි ආණ්ඩුව පැරදුනු වෙලාවෙ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රට පාලනය කරද්දි. එදා සුලුතරයක් තිබුනට අයවැයක් ඉදිරිපත් කරන්න අපි අවස්ථාව ලබා දුන්නා. නමුත් අපේ රජයට අතුරු සම්මත ගිණුමක් පවා ඉදිරිපත් කරන්න සහයෝගය දැක්වුවෙ නැහැ. ඒ වගේ කුහකත්වයක් පැව නිසා අද රටේ මහජනතාවට ගොඩක් දේවල්වලට දුක් විදින්න සිදු වෙලා තියෙනවා.

ඒ වගේම ජනාධිපතිවරයා ජනාධිපතිකම ගත්තට පස්සෙ මේ වන විට අපට නොපෙනුනාට රටේ ලොකු වෙනස්කම් කිහිපයක් සිදු කරල තියෙනවා. රටේ අනවශ්‍ය වියදම් කපා හැරල තියෙනවා. ඒ වගේම සංස්ථා සභාපතිවරුන්ගෙ මණ්ඩලවලට පත්වෙන නිලධාරින්ගෙ වැටුප් යම් ප්‍රමාණයකට සංශෝදනය කරල රටේ මහජනයට ඔරොත්තු දෙන විදිහට පත්කරල තියෙනවා. ඒ වගේම මේ කාල වකවාන්ව තුලදි රජයේ වාහන සීමා කරල තියෙනවා. ඒ හා සමානව රාජ්‍ය පාලනය ඉදිරියෙදි නිවැරදි මාවතක යන්න අඩිතාලම දාල තියෙනවා. ඒ නිසා අපි සතුටු වෙනවා. අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට පැහැදිලි පාර්ලිමේන්තුවකුත් ලබා දීල එතුමා කවුරු මොනව කිව්වත් තව අවුරුදු පහක් මේ රට පාලනය කරනවා. එසේ පාලනය කිරීම සඳහා එතුමන්ට ශක්තිය ධෛර්යය ලබා දීම අපේ රටේ වැසියන්ගෙ වගකීම සහ යුතුකම වෙනවා. මොකද එතමා වැඩිම ප්‍රමාණයකින් පත්කර ගත්තා නම් එතුමට මේ රටේ පාලනය ගෙනයන්න ආණ්ඩු බලයත් ලබා දිය යුතුයි කියන මතයේ අපි ඉන්නවා.

ඒ වගේම තව සඳහන් කරන්න ඕන. අපේ වනමල් මන්ත්‍රීතුමා මේ අවස්ථාවෙ නොහිටියත් ඔහු සඳහන් කළා. හමුදා පාලනයකට මේ රට ගෙනියන්න හදනවයි කියලා. නමුත් හමුදාව කියන්නෙ මේ රටේ විතරක් නෙවෙයි. ලෝකයේ දියුනු වෙච්ච සෑම රටකම තමන්ගෙ හමුදාවෙ සොල්දාදුවන්ගෙන් වැඩ අරගෙන තමයි. ගොඩක් දේවල් සංවර්ධනය කරල තියෙන්නෙ. මොකද විශාල වැටුපක් ගෙවල යුද්ධයට බඳවාගත් තරුණ ශ්‍රමය විශාල ප්‍රමාණයක් හමුදාව අතේ තියෙන්නෙ. ඒක හරියට කළමනා කරණය කරල හමුදාවේ තියෙන ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යෙදෙව්වොත් අපි වගේ දුප්පත් රටකට මම හිතන්නෙ රට සංවර්ධනය කරන්න ඊට වැඩිය දෙයක් නැහැ. ඒ වගේම තීන්දු තීරණ ගන්න යම් අවස්ථාවලදි හමුදා නිලධාරීන් පත්කරල තියෙනවා. විනයකින් වැඩ කරන්න අවස්තාව ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ වගේම පොහොර සහනාධාරය ගොවිතැන් කටයුතු කිරීම පිළිබඳව අපි හැම වෙලාවෙම සඳහන් කරනවා. ඒ සියල්ල සඳහා මුදල් ප්‍රතිපාදන රජය වෙන්කරන්න අදහස් කළත් යෝජනා කළත් කවුරු මොනව කිව්වත් අයවැයක් ගෙනැල්ල ඒ කටයුතු කරනකම් අපට කිසි දෙයක් කරන්න ලැබෙන්නෙ නැහැ. ඒ නිසා හෙට වෙනකොට කණිජ තෙල් මිල පහල යාමේ වාසිය අපිට ලැබෙයි කියල විශ්වාස කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මගේ තව එක ඉල්ලීමක් තියෙනවා. නාගොඩ මංසන්දියේ සිට ඉදිගහවිලට ගමන් කරන මාර්ගයේ ප්‍රධාන පාලමේ රත්‍රී කාලයට වගේම වැසි කාලයට ඉතාම ලිස්සන සුලු ස්වභාවයක් තියෙනවා. දැනට කීපදෙනෙක් බයිසිකල් වලින් වැටිලත් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට කියලා එම පාලම උඩ කාපට් එකක් අතුරවන්නට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියන ගෞරවණීය ඉල්ලීම කරනවා. මොකද ඉතාම අවදානම් තත්වයක් තියෙන්නෙ පිනි බැවට පස්සෙ යකඩ තහඩුව ලිස්සනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒකෙ කාපට් එකක් අතුරවන්නට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියන ගෞරවණීය ඉල්ලීම කරනවා. ඒ වගේම අපේ සියලුම කොට්ඨාසවල බලපවත්නා නියගය පිළිබඳව අපට මොනවහරි සහනයක් සලසන්න පුලුවන්කම තියෙනවනම් ඒ පිළිබඳ විශේෂ අවදානයක් යොමු කරන්න කියන ගෞරවණීය ඉල්ලීම නැවතත් සිදුකරමින් මම නිහඩ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ අජිත් මන්ත්‍රීතුමා කියනවා. කතා කරන්න කියලා. ඒ හින්දා මේ නැගිට්ටෙ. අජිත් මන්ත්‍රීතුමා අපිත් එක්ක චාරිකාව යන්න ආවෙත් නැහැ. අපි හොඳ අධ්‍යාපන චාරිකාවක් ගියා. ඇත්තටම ගොඩක් දේවල් ඉගෙන ගත්තා. අපි ත්‍රිකුණාමලේ සභාවටත් ගියා. ත්‍රිකුණාමලේ සභාවෙ හැටි දැක්කහම අපේ මේක සභාවක්ද කියලා හිතුනා. මොකද බලන කොට මේක ලංකාවෙ තියෙන දුප්පත්ම සභාව වගේ. ඒ වගේ මම යෝජනාවක් ගේනවා. ඊලග අවුරුදු දෙකේදි හරි මොනව හරි සංවර්ධන සැලැස්මකට ඇමති මණ්ඩලේට හරි කියලා සභාවෙ ගොඩනැගිල්ල අලුතින් නවීකරණය කරලා. හොඳ සභාවක් හැටියට පවත්වාගෙන යන්න කියලා. මම අවංකවම හිතනවා මේ අපේ ගොඩනැගිල්ල හදා ගන්න. අපේ සභාපතිතුමා උනන්දු වෙයි කියලා. හැබැයි ගොඩක් ප්‍රශ්න තමයි තියෙන්නෙ. ගමවල තියෙන ප්‍රශ්න, යටලමත්තටනම් ඒ ප්‍රශ්න ටිකක් අඩුවෙලා තියෙනවා. මොකද සමහර විට අපි මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්න නිසා වෙන්න ඇති. යටලමත්තෙ ප්‍රශ්නයක් තිබුනත් අපි සභාවට ගේන්නෙ නැතිව එහේදිම කොහොම හරි ඒක විසඳ ගන්න බලනවා. යටලමත්තෙ හන්දියට ජල ප්‍රශ්නය තිබුනා. ඒ වෙලාවෙදි සභාව සතු පොදු ලිදක් තිබුනා. ඒ ලිද ඇත්තටම නැමට තමයි තිබුනෙ. ඒ ලිදේ නැම නතර කරල දැනට මෝටර් අටක් දාල වතුර ගන්නවා. ඒක නිසා යටලමත්ත මංසන්දියේ අවට ඉන්න අයට සහ යටලමත්ත හන්දියට ජල ප්‍රශ්නය නැතිවුනා. මම හිතන්නෙ එහෙම නොතිබුනානම් අද වෙන කොට මේ සභාපතිතුමාට හන්දියට යන්න හම්බ වෙන්නෙ නැහැ. මොකද යටලමත්ත හන්දියට ඉතාම තදින් ජල ප්‍රශ්නය බලපානවා.

ඒ වගේම අද උදේ එනකොට පාරෙ අලුත් වීපී පහන් සවි කරන්න ගිහින් තිබුනා. ඒ අයට අපි වීපී පහන් සවි කරන්න ඕන ස්ථාන තුනක් පෙන්නුවා. ඇත්තටම ඒකට ස්තූතිවන්ත වෙනවා. යටලමත්ත මංසන්දියෙ ජනතාව වෙනුවෙන් සේවය ඉටු කිරීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම ලබන මාසෙ මම හිතන්නෙ අටවෙනිද වගේ සභාව තියන්න කතා කළා. හත්වෙනිදා නිවාඩු දවසක් නිසා අටවෙනිද තියන්න කතා කළා. වර්ෂ දෙකක් හරියට අටවෙනිදා සම්පූර්ණ වෙනවා. මොකද මේ සභාව අපි 2018 වේ අප්‍රේල් අටවෙනිද පටන් ගත්තෙ. ඒක නිසා මම හොඳ සභාවාරයක් වේවායි කියල ප්‍රාර්ථනා කරනවා. සියලු දෙනාටම ලබන්නාවූ අවුරුද්ද හොඳට වර්ෂාව ලැබිල සාර්ථක ගමනක් යාමට හැකිවේවායි ප්‍රාර්ථනා කරනවා. ඇත්තටම ඉස්සර අපි මේ අධික නියංකාලයට මේ වෙනකොට ගම්වල ඔය එක එක දේවල් කළා. පිරිත් එහෙම කිව්වා. ඒවගේ දේවල් කරනවා. එතකොට ඇත්තටම ගොඩක් දුරට ස්වාභාවික දේවල් සිද්ද වීගෙන යනකොට ඒව නතර වෙනවා. යටලමත්තෙ නම් හෙට අනිද්ද වෙන කොට පිරිතක් කියනවා. හැත්තෑව කන්දෙ විහාරෙ තිබිල තියෙනවා. ඒක නිසා මම හිතන්නෙ දැන් ඇවිල්ල තියෙන කොරෝනා ප්‍රශ්නය වුනත් මේ අධික උෂ්ණත්වය නිසා තමයි අපේ මේ ලංකාවට ඒකෙ බලපෑම අඩුවෙලා තියෙන්නෙ. ඒ වගේම මම හිතන්නෙ අපි එච්චර අවාසනාවන්ත නැහැ. ඒකනිසා කිසි කෙනෙක් බය වෙන්න ඕන නැහැ. අපට ඔය ඩිංගක් පෑව්වයි කියල ඔයිට වැඩිය පායපු කාල තිබුනා. අපට වර්ෂා කාලෙ ලැබිල ගමට රටට හොඳ කාලයක් උදාවේය කියල බලාපොරොත්තු වෙමින් ලබන අටවෙනිදට සභාපතිතුමාගෙ අවුරුදු දෙකේ කාලය සම්පූර්ණ වෙන නිසා සභාවට හොඳ සංග්‍රහයක් එහෙම කරන්න ලැබේවායි කියල ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා. ඔබ සැමට ස්තූතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි ඔබතුමාට අද ඉතාම වැදගත් දවසක් අපේ මන්ත්‍රීතුමාල බොහොම වැදගත් යෝජනා අදහස් කතා කළා. වතුර ප්‍රශ්නය තමයි අපේ සියලු මන්ත්‍රීතුමන්ල කිව්වෙ. අර නෙලී මන්ත්‍රීතුමිය කිව්ව වගේ අපේ ගමේ ප්‍රශ්න වැඩිය සභාවට ගේන්නෙ නැතිව ඔබතුමාලට කරදරයක් නොවෙන්න අපි ගමේම විසඳ ගන්නවා. යටලමත්ත හන්දියේ ප්‍රශ්නය විසඳුනා වගේ තමයි. හැත්තෑව කන්ද ජල ව්‍යාපෘතියෙන් හා රුක්මල්ගොඩ ව්‍යාපෘතියෙන් ජලය ලැබෙනවා. හැබැයි මේ දවස්වල ඒ ව්‍යාපෘති එකක් නතර කරල තියෙන්නෙ. ඒ නිසා රුක්මල්ගොඩ ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ජනතාවට යම් ජල හිගයක් ආවොත් වතුර ටිකක් ලබා දෙන්න ඔබතුමා කටයුතු කරන්න. මම සණස සභාපතිතුමා කිව්වා ටැංකි ටිකක් පාරෙ තියන්න. අපි වතුර ගෙනැල්ල පරවන්නම් කියලා. අවශ්‍ය වුනොත් එහෙම හරි ක්‍රමයක් හදාගෙන ජලය ලබා දෙන්න වෙනවා. මම හිතන්නෙ අවශ්‍ය වෙන එකක් නැහැ තව දවස් දෙක තුනක් යන්න ඉස්සර වෙලා වැස්ස ලැබේවි.

ඒ වගේම මම ස්තූතිවන්ත වෙනවා. අපේ මන්ත්‍රීතුමාල අපි අධ්‍යන චාරිකාවකට සහභාගි වුනා. බොහොම විනෝදමත් ගමනක් ගියා. අපිට ඒ සඳහා ආශිර්වාද කළ අපිත් එක්ක එදා එකතුවෙන්න බැරි වුනත් සහයෝගය පළ කළ මන්ත්‍රීතුමාලට අපි ස්තූති වන්ත වෙනවා.

ඒ වගේම කටුපොල් ප්‍රශ්නය ගැන කතා කළ යුතු දෙයක් නෙවෙයි. ගරු සභාපතිතුමනි ඒ වුනත් පොඩ්ඩක් කතා කරන්න හිතුනා. ගරු සභාපතිතුමනි කටුපොල් ගැන කතා කරන්න දෙයක් නැහැ කියල හිතුනෙ අතිගරු ජනාධිපතිතුමා උඩුගමට ආවදවසෙ. එතනින් පස්සෙ අපට ඒක කතා කරන්න අවශ්‍යතාවයක් නැහැ .මොකද එතුමා වචනයක් කිව්වොත් ඒක ගලේ කෙටුව අකුරක් වගේ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ ඒ වචනෙ ආයෙ දෙදක් නැහැ. එතුමා කියපු වචනෙ අපට විශ්වාසයි. ගෝඨාභය නිකන්ම ගෝඨාභය නෙවෙයි. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එතුමා කියපු වචනෙ අපට දෙකක් නැහැ. ඒ ගැන විශ්වාසයක් තියෙනවා. ඒ නිසා කටුපොල් ප්‍රශ්නය ගැන අපි කතා කරන්න යන්නෙ නැහැ.

ඒ වගේම අපේ විපක්ෂ නායකතුමා කිව්වා ආර්ථික සැලසුමක් නැහැ කියලා. අපි තව මාස කිහිපයකින් නව රජය පත්වෙලා මාස තුන හතරක් යන කොට අපේ රජයේ ආර්ථික සැලසුම් ඔබතුමාලට දකින්න ලැබේවි. ඔබතුමාලත් එක්ක අද දැන් කරන රජයට ඔබතුමාලට පුලුවන් බාල්දි පෙරලන්න. ඒක හින්දා තමයි අපට අය වැය සම්මත කර ගන්න බැරි වුනේ. ඒ නිසා තමයි අපේ රජයට යම් යම් අපහසුතාවයන්ට පත් වෙන්න සිදු වුනේ. ඒ වගේම සෙල්ලම් බලන්න පුලුවන්, තවම දවල් හීන දකින්න පුලුවන්, මැතිවරණයක් තියෙන නිසා. ඔබතුමාල දවල් හීන බල බල ඉන්න. ඒ වගේම අපේ වසන්ත මන්ත්‍රීතුමා කිව්වා. මේ එන්නෙ මොකාටද කියලා. මොකාටද කියල තමයි අපටත් තියෙන ප්‍රශ්නෙ. දෙකට බෙදිල එන්නෙ මොකාටද කියන එක. මොකද පහුගිය දවස්වල ජනාධිපතිවරණයක් තිබුනා. ඒ ජනාධිපතිවරණයෙදි ඔබතුමාල දැක්කා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට පක්ෂ සමාජිකත්වයත් නැහැ. එතුමාට ඡන්දය ඉල්ලන්න කිව්වා ඉල්ලුවා. පක්ෂෙ නායකකම් තනතුරු ඉල්ලුවෙ නැහැ. දැන් ඔබතුමාලගෙ නායකය ගිය මහ මැතිවරණෙ ඉදල රනිල් වික්‍රම සිංහ මහත්මයගෙන් පක්ෂෙ නායකකම් තනතුරු සියල්ල ඉල්ලනවා. ඒ වගේ නායකයෙක් තමයි සජිත් ප්‍රේමදාස මැතිතුමා. එක්සත් ජාතික පක්ෂෙය් මන්ත්‍රීවරුන්ට ලැජ්ජයි අත්තටම විලි ලැජ්ජ නැතුව ඔබතුමාලගෙ නායකයො මේ ඉල්ලන ඉල්ලීම්වලට. දෙකට බෙදිල නෙවෙයි. එකට එකතුවෙලා ඕව කරන්න නෙවෙයි. හිතන්නවත් හම්බවෙන්නෙ නැහැ. එන මැතිවරණයෙදි අපි තුනෙන් දෙකේ බලය අරගන්වා. ඒ සඳහා අපේ මහ මොලකරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අවශ්‍ය කටයුතු කරමින් යනවා. ඒ නිසා ඒ ජයග්‍රහනය ලබාගෙන තුනෙන් දෙකක බලයක් සහිතව ආණ්ඩුවක් පත්කරන බව අපට විශ්වාසයි.

ඒ වගේම අපේ උපසභාපතිතුමා අපේ අජිත් මන්ත්‍රීතුමා ඉන්නවා කතා කරන්න. ඒ නිසා මම දීර්ගව කතා කරන්න අවශ්‍ය නැහැ. මන්ත්‍රීතුමාල වැදගත් අදහස් යෝජනා ප්‍රකාශ කළා. ඒ නිසා කාලය නාස්ති නොකරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා සියලු දෙනාටම ස්තූතියි. සුබ අනාගතයක්.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරුනි, සභාපතිතුමනි මම විශේෂයෙන්ම මේ අවස්ථාවෙ කතා කරන්න බලාපොරොත්තු වුනේ. අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළ පරිදිම උග්‍ර පානීය ජල ප්‍රශ්නයකට අපි සියලු දෙනා මුහුණ දීල තියෙනවා. ඒ නිසා දැන් මම විශ්වාස කරනවා. අපි දැනට මේකට සූදානමක් නොවුනොත් මේ නියං තත්වය අපේල් මැද දක්වා තියෙනවයි කියල කියනවා. සමහරවිට ඊටත් පහුවෙනකම් තියෙන්න පුලුවන්. සමහරවිට අපේ විජිත් මන්ත්‍රීතුමා කිව්ව විදිහට දවස් තුන හතරකින් වහින්නත් පුලුවන්. ඒ කෙසේද කියල අපට කියන්න බැහැ. හැබැයි තව සතියක් දෙකක් පැව්වොත් සභාව මොකක්ද මේ ජල ප්‍රශ්නයට කරන්නෙ කියල අපට මොනව හරි තීරණයක් කවුරුත් එක්ක සාකච්ඡා කරල ගතයුතුව තියෙනවා. ඒකට තවත් දින පහු කරන්නත් බැහැ. විශේෂ සභා කැඳවන්නත් බැහැ. ඇත්තටම මෙවැනි තත්වයක් මතු වුනොත් සභාවේ ඒ වෙනුවෙන් තියෙන සූදානම මොකක්ද? කියල කවුරුවත් ඇහුවොත් අපට දෙන්න උත්තරයක් නැහැ ඒ නිසා අපි ආර්ථික අතිනුත් අමාරු සභාවක් නිසා මොකක්ද කළ හැකි විකල්ප කියලා. මම හිතන්නෙ ආණ්ඩුකාරතුමා සමගත් සාකච්ඡා කරලා. මේ වෙලාවෙ තීරණයක් ගත්තොත් හොඳයි. ඒ මොකද උදාහරණයක් හැටියට අපේ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. කැකිල්ල කන්ද කියන ප්‍රදේශයට විශාල ජල අර්බුදයක් තියෙනවා. තව උඩුගම දකුණට මෙහා හූ හිස් කන්ද කියල තැනක් තියෙනවා. ඊලගට හොරගහ කන්ද කියල තැනක් තියෙනව. දැනට වතුර නැතිව දැඩි පීඩා විඳින ස්ථාන. ඊලගට දැන් අපිටත් නැහැ. මම ඉන්න ප්‍රදේශයටත් අද වෙනකොට නැහැ. තරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ මටත් අද වතුර නැහැ. ඒ තත්වය ඇතිවෙලා තියෙන්නෙ කඳු ප්‍රදේශ නිසා ඒ කියන්නෙ තව සතියක් ඔරොත්තු දෙන්න මොන විදිහකින්වත් බැහැ. මේකට මොකක්ද දෙන විසඳුම ඇත්තටම ටැංකි දෙන්නත් බැහැ. ටැංකි දුන්නහම අපේ මිනිස්සු පහලම ඉන්න කෙනත් ටැංකි ඉල්ලනවා. ජලය බෙදන්නෙ කොහොමද කියල

ප්‍රශ්නයකුත් බලපානවා. බවුසරයක් ගිහින් දෙනවනම් ඊලගට හෙට උදේටත් බලාපොරොත්තු වෙනවා. ඒක නොකඩවා කරන්න පුලුවන් වෙන්න ඕන. ඊලගට ඒ බවුසර්වලට ජලය ගන්නෙ කොතනින්ද කියන කාරණය තව කාරණයක්. අනිත් එක දැනට තියෙන තත්වය තුල අපට හිතෙන හිතෙන ලිංවලින් ජලය ලබා දෙන්නත් බැහැ. මෙහේට උපදෙස් තියෙනවා පිරිසිදු කරන ලද ජලය ලබා දෙන්න කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම හිතන්නෙ මේක කතාවකට සීමා වෙන්නෙ නැතුව මොකක්හරිම වැඩ පිළිවෙලක් තියෙන්න ඕන. දැන් ගාල්ලෙ හදිසි කැඳවීමකට හරි ඔබතුමා කැඳෙව්වොත් අහවි මේ සම්බන්ධයෙන් ඔය ගොල්ලන්ගේ සභාවෙ සූදානම මොකක්ද? අපිට අඩුගානෙ සූදානම පිළිබඳ වැඩපිළිවෙලක්වත් මේ වෙලාව වෙන කොට තියෙන්න ඕන. මුලු සභා බල ප්‍රදේශයේම කොට්ඨාස 15 වේම කඳු සහිත තැන්වල පදිංචි වෙච්ච ජනතාව ඇති. මේ අයට මොකක් හරි විසඳුමක් ලබා දීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම ඇත්තටම අත්‍යවශ්‍යයි. මම හිතන්නෙ දැන් අපි අප්‍රේල් අටවැනිදට සභාව දැම්මට එදා වෙනකම් නෙවෙයි ඊට කලින් මම හිතන්නෙ අදම පරක්කු වුනත් මොකක්ද ගතහැකි ක්‍රියාමාර්ගය කියල සාකච්ඡා කරන්න ඕන. මේක කාරක සභාවක් හැටියට කල්පනා කරල මොකක්ද දෙන්න තියන විසඳුම. බවුසර් වැඩි කරනවද? අපේ තියන දැඩි ප්‍රශ්නය ආණ්ඩුකාරතුමා එක්ක කතා කරන්න ඕන. ඒ නිසා සභාපතිතුමනි මේ පිළිබඳව වහාම කඩිනම් පියවරක් ගන්න කියල අපි ඉල්ලීමක් කරනවා.

ඒ සමගම මම විශේෂයෙන්ම මතක් කරන්න බලාපොරොත්තු වුනේ ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් අප සමග ප්‍රකාශ කළා. ගාලු දිස්ත්‍රික්කයේ තියෙන ජලයෙන් පිරිසිදු ජලය ලැබෙන්නෙ 42% ට ඒ කියන්නෙ 58% ට පිරිසිදු ජලය ලැබෙන්නෙ නැහැ. අපිරිසිදු ජලය දැනටත් පාවිච්චි කරන්න, ඒ අය කිව්වා අම්පාරෙ 92% ට පිරිසිදු ජලය අපට පුදුමයි හරියට ලිදක් ඇත්තෙ නැහැ. කිවුල් ජලය ඒ සියල්ලම තියෙද්දි අම්පාර දිස්ත්‍රික්කයේ 92% පිරිසිදු ජලය බොනවා. අපි පිරිසිදු ජලය කියල 58% අපිරිසිදු ජලය පාවිච්චි කරනවා. ඒ නිසා මේ දැන් ලිංවලින් ගන්න අපි ගෙවල්වලට ටැප්වලින් ගන්න සියලු ජලය ඒ අය සලකන්නෙ අපිරිසිදු ජලය හැටියට. ඒ සම්බන්ධයෙන් ඊලගට මම විශේෂයෙන් අපේ ගරු මන්ත්‍රීතුමාලට දැනුවත් වෙන්නත් එක්කයි මේ කාරණය මතක් කරන්න සූදානම් වුනේ. ඒ අය අපි සමග කිව්වා ආණ්ඩුවේ අවදානය සම්පූර්ණ යොමු වෙලා තියෙන්නෙ මේ නියගය හින්ද නෙවෙයි. රටේ 100% ක් විදුලි ප්‍රශ්නය අවසන් 100% කටම විදුලි ප්‍රශ්නය අවසන් කියල තමයි අය කිව්වෙ. මම දන්නෙ නැහැ 1% ක් 2% ක් ඇතිද කියලා. මාර්ග ප්‍රශ්නය 80% ට වැඩි ප්‍රමාණයකට අවසන් දැන් තියෙන සැලසුම් එක්ක ගොඩාක්ම අවසන්ය කිව්වා. දැන් රජයේ අවදානය යොමු වෙලා තියෙන්නෙ. ජල ප්‍රශ්නය සම්පූර්ණ ගම් නියංගම්වල අවසන් කරන්න. මුලු රටේම ජලය ප්‍රශ්න අවසන් කරන්න තමයි අවදානය යොමු වෙලා තියෙන්නෙ. ඒ නිසා ඒ වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් යොදවන්න ආණ්ඩුව සූදානම්. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාලටත් මම මතක් කරන්නෙ. මේ ගමේ මේ කැල්ල විතරයි මේ ඩිංගට වතුර දෙන්න පුලුවන් කියල කතාවක් නැහැ. හැම මන්ත්‍රීවරයෙකුටම පුලුවන්කමක් තියෙනවනම් කොට්ඨාසෙ ජලය තියෙන ස්ථාන පහක් හරි හයක් හරි අටක් හරි දෙන්න. ඒ සියල්ලටම ඒ අය ඇවිල්ලා අවශ්‍ය සැලසුම් සම්පාදනය කරල මුදල් වියදම් කරල ඒ කටයු කරන්න දැන් සූදානමක් තියෙනවා. පෙන්නන්නෙ කොතනද ඒ අය ඇවිල්ල නිකන්ම නෙවෙයි. සභාවටමත් එක්ක දැන් අපේ ගරු චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාටත් විශේෂයෙන් දැනගන්න මතක් කළේ. ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ කුඩා ජල දෙපාර්තමේන්තුව කියල තිනෙවා වෙනම දෙපාර්තමේන්තුවක්. ඒ දෙපාර්තමේන්තුව තමයි ඒ කටයුත්ත කරන්නෙ. ඒ අය හැබැයි අපි කියන විදිහට ලිදෙන් මෝටරයක් ගහල ටැංකියකට අරගෙන ටැංකියෙන් වතුර බෙදා හැරීම සිදු කරන්නෙ නැහැ. එතකොට ඒ අය ඉස්සෙලම කරන්නෙ තියෙන ලිදක්නම් ඒ ලිද සම්පූර්ණ ඉහිනවා. ඉහලා පළවෙනි පැයට පිරෙන වතුර ප්‍රමාණය. දෙවන පැයට පිරෙන වතුර ප්‍රමාණය. තුන්වන පැයට පිරෙන වතුර ප්‍රමාණයන් හා ඒකට යන කාලය ගන්නවා. වර්ග ප්‍රමාණය බලල ඒ අනුව තීරණය කරනවා. කොච්චර පවුල් ගණනකට දෙන්න පුලුවන්ද කියලා. දැන් උඩුගම දකුණ අත්කම් නිවාස ලිදේ පවුල්

85 ට තමයි සූදානම් වෙන්න කියලා කිව්වෙ. ඊලගට ජලය අරගෙන වක්වැල් ජල පිරිපහදු මධ්‍යස්ථානයට ගෙනිහිල්ල භාර දෙන්න ඕන. ඒ ජලයට මොන පිල්ටර්ද යෙදිය යුත්තේ කියල බලන්න. ඊලගට අර ටැංකියට අමතරව තව ටැකියක් ඒ අය ගහනවා. ස්ටොක් ටැංකියක් නෙවෙයි. අර ජලය පිරිසිදු කරල ගන්න ටැංකිය අන්න ඒ ටැංකියේ ඉදල තමයි ජලය බෙදන්නෙ. අපේ දැන් අත්කම් සිවාසෙ තියෙන ටැංකිය ඒ අය කිව්වා කොච්චර වතුර ලීක් තිබුනත් ප්‍රශ්නයක් නැහැ. ඒ අය තාක්‍ෂණයත් එක්ක ඉස්සෙල්ල වතුර පුරවනවා. වතුර පුරවලා ලීක් තියෙන බලල ඔක්කොම මාක් කරල කපනවයි කිව්වා. කපල ඉවරවෙලා ඒ අය අලුත් තාක්‍ෂණය යටතේ මුලු ටැංකියේ අවශ්‍ය සියලුම ස්ථාන පැච් කරනවයි කිව්ව. පැච් කරල ඉවරවෙලා ඒ ගොල්ලොන්ගෙ තීන්ත වර්ගයක් තියෙනවයි කිව්වා. කොඩ් තුනක් ගාන්න ඒ කෝඩ් තුන ගෑවයින් පස්සෙ ටැංකිය අවුරුදු 25 කට ගැරන්ටි ඒ නිසා ටැංකිය මුලුමනින්ම අයින් කරන්නෙ නැහැ. ඒ ටැංකියට පිරෙව්වම දෙවෙනි ටැංකියට අරගෙන තමයි ජලය බෙදා හරින්නෙ. මීටරයක් රුපියල් පන්දහස් ගණනෙයි කිව්වා මීටරයකුත් ලබා දෙනවා. දැන් අර කැප්පිටියගොඩ යෝජනා ක්‍රමයට වගේ නෙවෙයි ඊට වඩා පහසුකම් සලසනවා. ශ්‍රම දායකත්වය ගන්න බැරි නිසා. සියලුම පයිප්ප ලබා දෙනවා. මීටර් ලබා දෙනවා අවශ්‍යනම් ටැංකි ලබා දෙනවා. ඒ සියල්ල සිදු කරනවා.

ඊලග කාරණය තමයි ඕන තරම් දුරක සාමාන්‍යයෙන් කිලෝ මීටරයක් වුනත් දුරක නම් ජලය තියෙන තැන තියෙන්නෙ. එතන ඉදල කිලෝ මීටරය වුනත් ජලය අරගෙන ඇවිල්ල එතනින් පිරිපහදු කරල මෝටර් කරලා දෙන ක්‍රමයක් තියෙනවා. ඒකට ඕනම ගානක් ඒ අය වියදම් කරනවයි කිව්වා. ජලය තියෙන තැන විතරයි ඒ අයට ඕන. දැන් මේ ගමට දෙන්න මෙතනම පල්ලෙහා වතුර තියෙන්න ඕන කියල එකක් නැහැ. අන්න ඒ නිසා තියෙනවානම් ගාල්ල ලබුදූව අම්බලන්වත්ත පාරෙ කාර්යාලය තියෙන්නෙ. ඒ තියෙන ව්‍යාපෘතියක් තියෙනවනම් ඒ අයට ඉදිරිපත් කරන්න. ඒ අය ඇවිල්ල අර විදිහට පරික්‍ෂණ කරල ඒ කටයුත්තට සහයෝගය දුන්නහම ඒ ටික කරනවා. මොකද මේක මේ අවුරුද්දෙම කරන්න බැහැ. නමුත් මේ වැඩේට පොඩි කාලයක් යන නිසා අනුමත කරල ඒ ටික කරන්න ඕන. ඒ තියෙන ජල ව්‍යාපෘති තියෙන ඒවා හැම එකම ලබා දෙනවානම් ඉස්සරහට මේ ජල ප්‍රශ්නයට විසඳුමක් තියෙනවා. හැබැයි එක දෙයක් වෙනවා. මේකෙ තව සති දෙකකින් වැස්සොත් අපි කරන්නෙ මොකක්ද සියලුම දෙනා සමුපූර්ණම අත්හැරල දානවා. මේ ප්‍රශ්නය ගැන ආයෙත් කතා කරන්නෙවත් නැහැ. නැත්නම් ඇත්තටම නියගයන් තිබුනා. අපට හොඳටම තේරෙනවා පහුගිය තිබුන නියගයන් හැම එකටම වඩා මේක ප්‍රභලයි. ඒ හිදිච්ච නැති ලිං සියල්ල හිඳුනා. දැන් ටැප් ලයින්වලින් ආපු හැම තැනම වතුර නැවතුනා. ඒ නිසා මේක දැනට ලොකු අර්බුදයක් සභාපතිතුමනි මේකට පිළියමක් දෙන්න. අපි මහජන නියෝජිතයො හැටියට වර්ෂාව වැස්සත් මේ සැලසුම අත්හරින්නෙ නැතුව ක්‍රියාත්මක කරමු. මොකද රජය සල්ලි වියදම් කරන්න සූදානම් නම් ඒ වැඩේට ප්‍රමුඛත්වය දෙනවනම් අපි ඒකට කටයුතු කරමු කියල අපි යෝජනා කරනවා. දැන් සභාවට ලක්‍ෂ 25 ක් දෙන්න ධනංජය මන්ත්‍රීතුමා කිව්වා අතිගරු ජනාධිපතිතුමා පොරොන්දු වුනා කියලා. ඒ මුදලත් ගන්න ඒ මුදල අරගෙන පුලුවන්නම් ක්‍ෂණිකව ඒක කරනවනම් එහෙමත් කරන්න පුලුවන් නැත්නම් ඒ මුදල තව එතනම තියෙන ව්‍යාපෘතියකට වියදම් කරන්නත් පුලුවන් අතන මම හිතන්නෙ ලක්‍ෂ 25 න් අර ගොල්ලොන්ගෙ තියෙන විදිහට කරන්න බැහැ. ඒකට මදි ඒ නිසා අපට පුලුවන්නෙ සභාව හැටියට තීරණය කරල එතනට දෙනවනම් එතනම තව ව්‍යාපෘතියක් කරන්න පුලුවන්. ඉතිං ඕනම ව්‍යාපෘතියක් කරන්න දැන් ඉඩ තියෙනවා. ඒ වෙනුවෙන් සූදානම් වෙන්න කියන එක මොකද මටත් ඒ අයත් එක්ක නිකන් කතා කරනකොට දීපු උපදෙසුත් එක්ක තමයි මම ඔය කිව්වෙ. සියලු දෙනාටම දැනුවත් වෙන්නත් ඒ තියෙන තියෙන තැන් ඕන එහෙකට මුහුණ දෙන්නත් හැමෝටම පුලුවන්. ඒ නිසා මම ඊට වඩා ඒ සම්බන්දයෙන් කරුණු කාරණා සහිපත් කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. හැබැයි දැන් තියෙන ප්‍රශ්නෙට විසඳුමක්නම් ගත්තොත් හොඳයි කියන කාරණය අපි ඉතාම ඕනෑ කමින් මේ සභාවට යෝජනා කරනවා ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරුනි අපේ අජිත් එඩේර ආරච්චි මන්ත්‍රීතුමා කරනලද යෝජනාව පිළිබඳව අපේ ප්‍රසාදය සහ එම යෝජනාව අනුමත කිරීම මේ වෙලාවෙ සිදු කරනවා. එතුමත් එක්ක පුද්ගලිකවත් කතා කළා. දැන් ඇතිවෙච්ච ආපදා තත්වය පිළිබඳව. පානීය ජලය පිළිබඳව අපි දීර්ග වශයෙන් කතා කළා. ගංවතුර සහ වෙනත් ආපදා තත්වයක් වුනානම් මෙලහකටත් බලන්න තිබුනා. මේ කොට්ඨාසයේ තියෙන රජයේ කාර්යාලත් තවත් ආයතනත් පුද්ගලික සංවිධානත් කොයිතරම් උනන්දු වෙනවද කියල. ගංවතුර ගැලුවනම් මිනිස්සුන්ට වියලි සලාක පිසූ ආහාර ද්‍රව්‍ය ඇඳුම් පැලඳුම් ඉඳුම් හිටුම් කොට්ට මෙට්ට තාච්චියෙ උදැල්ලෙ ඉඳන් ගෘහ උපකරණ සියල්ල බෙදන්න විවිධ ආකාරයේ රජයේ ආයතන පුද්ගලික ආයතන උනන්දු වෙනවා. මේකෙ ගසා කෑම ටිකක් අඩු හින්ද මම හිතන්නෙ බොන්න වතුර ටික විතරයි. අරෙහෙම වුනාම ගොඩක් බෙහෙත් හේත් ඉදලම දෙනවා. නිදා ගන්න මෙට්ටෙ ඉඳන්ම දෙනවා. ඒක හින්ද තමයි මම හිතන්නෙ අපේ රාජ්‍ය යාන්ත්‍රනය මේකට නිසි පිළිතුරක් කරා ලගාවීමකට ඇවිල නැත්තෙ. ඒක නිසා මම විශේෂයෙන්ම අපේ කොට්ඨාසයේ හඳුනා ගත්ත ප්‍රදේශ කිහිපයක් තියෙනවා. පානීය ජල ප්‍රශ්න තියෙන. අපේ ගරු මන්ත්‍රීතුමාල කීප දෙනෙකුටම ඒ ප්‍රශ්නය තියෙනවා. දැන් උඩලමත්තෙ අවට නැතුවා නෙවෙයි. නමුත් ලොකු ප්‍රශ්නෙකට ඇවිල්ල නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි මම යෝනා කරනවා. මේ සභාව ඉවර වෙලා මේ ජල ගැටලු තියෙන මන්ත්‍රීවරුත් සමග ඒව විසඳීම සඳහා විශේෂ සාකච්ඡා වටයක් කාරක සභාවක් පවත්වන්න කියලා. සභාවේ මුදල් නොමැතිනම් ලක්ෂ පහක වගේ මුදලක් අඩු තරමෙ ලක්ෂ පහක මුදක් ඉල්ලුවොත් ලක්ෂ දෙකක් තුනක් වත් ආණ්ඩුකාරතුමාගෙන් හෝ නැත්නම් දිසාපතිතුමාගෙන් හෝ නැත්නම් ආපදා කලමනා කරණ ආයතනයකින් හෝ අපවෙත ලබාගෙන. ඒ සඳහා කොට්ඨාස 15 ව තුනකට බෙදල පහේ කොට්ඨාසයක් හදාගෙන. ඒ පහේ කොට්ඨාසයේ අදාල මන්ත්‍රීවරුත් එක්ක අපේ තියෙන බවුසර් අනිකුත් සම්පත් ඒවට යොදවලා. මුදල් ගෙවා වෙනත් පුද්ගලික අවශ්‍යතාවයන්ට කරන සියල්ල නතර කරලා. සමාජශීලීව මේක නොමිලේ ජලය ප්‍රවාහනය කරන්න පානීය ජලය ලබා දීමට කටයුතු කරන එක හොඳයි කියල මගේ අදහස. ඒ සඳහා අපි වෙනම සාකච්ඡාවක් මේ සභාව ඉවර වෙලා. ඒ අදාල මන්ත්‍රීවරු නවතීවි. ඔබතුමත් ඉන්නවා නිලධාරි මණ්ඩලයත් ඉන්නවා. ඒ සඳහා කටයුතු කරන්න කියලා මේ අවස්ථාවෙ යෝජනා කරනවා.

ඒ වගේම ඒ සඳහා අවශ්‍ය මුදලක් ලැබෙනවනම් අවශ්‍ය වතුර ටැංකි ස්ටෑන්ඩ් ඒව හදල පුද්ගලිකව ගෙවල්වලට ගෙනිහින් දෙන්න ගියහම අපහසු තාවයට පත්වෙනවා. උනන්විටිය ප්‍රදේශයේ කළා වගේ ප්‍රසිද්ධ ස්ථානවල ටැංකි තියලා. වතුර පුරවල දිවා රෑ නොබලා පැය 24 සේවයක් සපයන්න අපේ රිදුරු මහත්වරුන්ට හා සහායකයන්ට අතිකාල සහ අනිකුත් දීමනා ගෙවලා. මේක අපේ අජිත් මහත්මය කිව්ව වගේ තව සුමානෙකින් දවසකින් දෙකකින් නැති වෙන්නත් පුලුවන්. මාස ගණන් යන්නත් පුලුවන්. අපට තියෙන තත්වය අනුවනම් මම හිතන්නෙ අවුරුද්ද පහුවෙනකම් මේ අපහසුතාවය හැමෝටම විඳින්න වෙනවා. මේ පිළිබඳව විශේෂ රැස්වීමක් තියල සාකච්ඡා කරලා. මේ කටයුතු කරන්න කියල මම යෝජනා කරනවා.

ඊලගට විශේෂයෙන්ම දෙවෙනි කරුණ තමයි. මම අවුරුදු දෙකක් තිස්සෙම. මාර්ග කීපයක් පවරා ගන්න කියලා. න්‍යාය පත්‍රයට විධිමත්ව යොදවල යෝජනා කරල තියෙනවා. තවම බැරිවුනා අපට මේකෙ අයන්නෙ ඉඳන් පටන් ගන්න. මම මේ සභාපතිතුමාට ආමන්ත්‍රණය කරන්නෙ. මේකෙ වැඩ කටයුතු ආරම්භ කරන්න. අපේ ලේකම්තුමිය ඇතුලු නිලධාරී මණ්ඩලයට කිසිම ඕනකමක් නැහැ. මම ලේකම්තුමිය පුද්ගලිකවත් මුණගැහිල කිව්වා. සභාපතිතුමාගෙ කාර්යාලයට ගෙන්වලත් කිව්වා. මේ වෙනුවෙන් වෙනම නිලධාරියෙක් හෝ දෙන්නෙක් පත් කරගෙන පටන් ගන්න කියලා. දැන් අපට ගමට යන්න බැහැ. අපේ ගමේ මිනිස්සු අත්සන් යොදල ඉල්ලීම් කරල තියෙන්නෙ. ගමට යන්න බැහැ. ඇයි මහත්තයො තවම පාර ගැසට් කළේ නැද්ද පවර ගත්තෙ නැද්ද කියල අහනවා. න්‍යාය පත්‍රයට

යෝජනාවක් දාල සභාවෙ කතා කළහම එතනින් පැවරීම සිදු වෙලයි කියලා ඒ මිනිස්සු හිතාගෙන ඉන්නෙ. මම කිව්වහම ඕක දීර්ගකාලීන වැඩක් කියලා. ඇයි මහත්තයො ඕක ආරම්භ කරන්නෙවත් නැද්ද කියල අහනවා. දැන් සමහර ප්‍රදේශීය සභාවල පවරා ගැනීම් ආරහ කරල අවුරුදු දෙකක් වෙලත් තවමත් බැරිවුනා ඉවර කර ගන්න. අවුරුදු දෙකක් තුනක් යනකම් මිනුම් කටයුතු වන්දි ගෙවන ඒව තක්සේරු කටයුතු කරගන්න බැහැ. ඉතිං අපට මේක දැන්ම පටන් නොගත්තොත් අවුරුදු දෙකක් විතර යාවි ඉවරයක් කරගන්න. මම විශේෂයෙන්ම මගේ මාර්ග මම ඉල්ලීමක් කළේ මිනිස්සුන්ගෙන් ඉඩම් පවර ගන්න හිතාගෙන නෙවෙයි. අඩි අටට තියෙන පාර අඩි අටට පවර ගන්න කියලා. අඩි අටේ පාර අඩි 16 ට ගන්න ගියොත් තමයි මිනිස්සුන්ට ගෙවල අපි ගන්න ඕන. ඒ හින්ද අපි එහෙම ඉල්ලුවෙත් නැහැ. මොකද මම දන්නවා මේව පවර ගන්න කොට වන්දි ගෙවන්න මුදල් නැති බව. සභාවට මුදල් ඇත්තෙත් නැහැ. ඒ සඳහා අපට යොමු කරන්න පුලුවන් ආයතනයක් ඇත්තෙත් නැහැ. යොමු කරන්න පුලුවන් කෙනෙක් ඇත්තෙත් නැති නිසා අපි එහෙමයි යෝජනා දැම්මෙ. නමුත් ඒකවත් කරගන්න බැරි වුනා. අර ගොනදෙනිය පිට්ටනිය පිළිබඳ ප්‍රශ්නෙත් මම හිතන්නෙ තවම බැරි වුනා. විධිමත් යෝජනාවකට ගේන්න. මේව අපට තියෙන ලොකු ගැටලු. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා. මේ සභාවෙ හෙට ඉඳන් මේ වැඩේ ආරම්භ නොකළොත් මම ප්‍රාදේශීය සභා රැස්වීමට ඇවිල්ල මෙතනට එන්න ඕන හින්ද ඇවිල්ල අත්සන් කරල පිටවෙනවා මිසක් ඊට වැඩිය සේවයක් මම බලා පොරොත්තු වෙන්නෙ නැහැ. මට ලොකු ගැටලුවක් තියෙන්නෙ අර නයා මුල්ල කන්ද පාර ඒ වග්ම බීරිගෙ වත්තෙ පාරවල් ටික පවරල දෙන්නෙයි මහත්තයො කියනවා. ඉතිං අපි මිනිස්සු අතරට යන්නෙ කොහොමද? මේක පුලුවන් ආයතනයෙන් පුලුවන් දේ කරගන්න බැරිනම් ඒ සඳහා නියොජිතයෙක් ගමෙන් එවල තියෙනවනම් කොට්ඨාසෙන් එවල තියෙනවනම් අපි මේකට නායකත්වය දෙන්නෙ නැත්නම් මොකක්ද වෙන සේවය. ඒ නිසා ඒ පිළිබඳ දැඩි අප්‍රසාදය ගරු සභාතිතුමා ඇතුලු ඔබතුමා හරහා කාර්යාලයේ සියලු දෙනාට මගේ අප්‍රසාදය මම මේ අවස්ථාවෙ පිළිකුල් සහගතව ප්‍රකාශ කරනවා. මේක නොකෙරුනොත් මේක ආරහ නොකළොත් විශේෂයෙන් මම පුද්ගලිකව දැඩි පියවරකට එන බව මේ සභාව හමුවේ කියන්න කැමතියි.

මේ සභාවෙ කතා කරපු මාතෘකා පිළිබඳව ඉතාමත් කෙටියෙන් කියනවනම් සහබන්දු මන්ත්‍රීතුමා ඇතුලු ඒ කණ්ඩායම සහෝදරත්වයෙන් ඉදිරියටත් යාම පිළිබඳව අපි සතුටුයි. අපිත් කියන්නෙ නැහැ පක්ෂයක් කඩාගෙන යන්න ඕන කියල. පක්ෂයක් කැඩුවම වෙන ප්‍රතිඵලය අපිත් දන්නවා. නමුත් පක්ෂයක් කඩල රට හදන්න පුලුවන් නායකයො අපේ ලඟ හිටියට ඔබතුමාල ලඟ නායකයො නැහැ. රාජපක්ෂ කෙනෙක් හිටියනම් අද ඕනම පක්ෂයක් කඩන්නයි ගොඩනගන්නයි කිසි බයක් නැතුව ඉදිරිපත්වෙලා කරන්න පුලුවන්. නමුත් ඔබතුමාලගෙ පක්ෂෙ එහෙම කෙනෙක් නැහැ. ඊයෙ නාගොඩ කොට්ඨාස හතරක පහක අපේ රැස්වීම් මාලාවක් තිබුනා. හෝගාල එක්සත් ජාතික පාක්ෂිකයො කිසිම ආරාධනයක් නැතුව අපිත් එක්ක සම්බන්ද වුනා. බොරුනම් හොයල බලන්න ගයාන් මන්ත්‍රීතුමාගෙ එම් එම් මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසවල තිබුන රැස්වීවල කිසිම ආරාධනයක් නැතුව එක්සත් ජාතික පාක්ෂිකයො හෝගාල අපිත් එක්ක එකතු වුනා. ඒ නිසා කිසිදු සැකයක් නැතුව අපි ඊලග පාර්ලිමේන්තුවෙ තුනෙන් දෙකේ බලය ජනාධිපතිතුමාට දීල එතුමා ශක්තිමත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම විලේගේ ධනංජය මන්ත්‍රීතුමාගෙ යම් ප්‍රකාශයක් පිළිබඳව අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ සමස්ථ මන්ත්‍රීවරුන්ගෙ ප්‍රකාශය නෙවෙයි. එතුමාටත් තේරුම් යයි මම හිතන්නෙ ඒ ප්‍රකාශය අස්කර ගනීවි. ජනාධිපතිතුමා කෙරෙහි අපේ දැඩි විශ්වාසයක් තියෙනවා. එතුමා දිස්ත්‍රික් සංවර්ධ කමිටු රැස්වීමෙදි නියොග දෙන්න ගියේ නැහැ. ඒක එතුමගෙ වැදගත්කම. එතුමා නිලධාරින්ට කිව්ව මේ වැඩේ කෙරෙන්න ඕන කියලා. අපිදන්නවා කටුපොල් වගාව නීත්‍යානුකූලව නතර කරන්න නම් ගැසට් වෙලා, මම දන්නෙ නැහැ ගැසට් වෙන්න ඕනද කියල. ඒකට යම් කිසි ක්‍රමවේදයක් ඇති. ඒ සභාවෙ

කිසි කෙනෙක් හිටියෙ නැහැ. අපිත් එතනට ගියේ අනාරාධනයෙන් වගේ යන්න ඕන නිසා, ලැජ්ජාවට යන්න ඕන හින්ද අපිත් ගියේ. සහබන්දු මනත්‍රීතුමාට ඒ කණ්ඩායමට අපහසු තාවයක් ඇති වුනානම් අපිත් කණගාටු වෙනවා. ඔබතුමාලත් සමබන්ද වුනානම් ඇතටම වටිනා කමක් තියෙවනවා. එහෙම දෙයක් වුනේ නැහැ. දිස්ත්‍රික් සංවර්ධ කමිටු රැස්වීමට හැමෝටම යන්න බැරි හින්ද අපටත් අවස්ථාව දුන්නෙ නැහැ. කොහොම හරි මහන්සි වෙලා ගිය හින්ද රිංගල කොහොම හරි එතනට ගියා. අපි විශේෂයෙන්ම 2017 දි මට මතකයි කටුපොල් වගාව පිළිබඳව අධ්‍යන වාර්තාවක් කළා. ඒක විද්වත් මණ්ඩලයක් ඒ විෂය පිළිබඳ දැනුම තියෙන කමිටුවක්. ඒ අධ්‍යන වාර්තාවක් මගේ ලග තාමත් තියෙනවා. ඒ අධ්‍යන වාර්තාවෙ සදහන් වෙන්නෙ ලංකාවට සුදුසු බෝගයක් නෙවෙයි නුසුදුසු බොගයක් කියලා. මේක නතතර කරන්න ඕන කියන එක ඒ වාර්තාවෙ තියෙනවා. ඒ වෙලාවෙ කවුරු හරි නිලධාරියෙක් හිටියනම් දිස්ත්‍රික් සංවර්ධ කමිටුවෙ කියන්න තිබුනා. ජනාධිපතිතුමනි මේකෙ අධ්‍යන වාර්තාවක් තියෙනවා කියල. ජනාධිපතිතුමා කිව්වෙ අධ්‍යන වාර්තාවක් කරල වහාම මේක නතර කරන්න කියලා. අධ්‍යන වාර්තාවක් කරපු එකක් තියෙද්දි මොකටද තවත් එකකට යන්නෙ. ඕවට කමිටු හදාගෙන සංවිධාන හදාගෙන පඩිනඩි ගෙවල ඕක කරන්න ඕන නැහැ. ඒක කරන්නවත් අපට එතන අවස්ථාවක් තිබුනෙ නැහැ. ඒ නිසා ඒ පිළිබදව කණගාටුව ප්‍රකාශ කරනවා. මේ සභාව හමුවේ දැඩි විශ්වාසයක් දැඩි ප්‍රසාධයක් අතිගරු ජනාධිපතිතුමා පිළිබඳ තියෙන බව ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි මට විශේෂ අවස්ථාවක් ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා. මම කරන ලද ප්‍රකාශය සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න. විශේෂයෙන් ජනාධිපතිතුමා කටුපොල් සමබන්ධයෙන් කතා කරපු වචනය සම්බන්ධව මට කතා කරන්න අවශ්‍යයි. මට ඒ වෙලාවෙ අදහස් කරන්න අවශ්‍යතාවය තිබුනෙ. ජනාධිපතිතුමා විශ්වාස නැහැ කියන එක නෙවෙයි. ජනාධිපතිතුමාගේ වචනය නීත්‍යානුකූල වෙන්නෙ නැහැ. නීත්‍යානුකූල වෙන්නෙ එය නීත්‍යානුකූලව ගැසට් එකක් මගින් කටුපොල් තහනම් කියන එක ඉදිරිපත් වුනොත් පමණයි. මට අවශ්‍යතාවය තිබුනෙ ජනාධිපතිතුමා විශ්වාස නැහැ කියන එකවත් ජනාධිපතිතුමාගෙ ප්‍රතිපත්ති විශ්වාස නැහැ කියන එකවත් එහෙම නැත්නම් ජනාධිපතිතුමා කියපු දේ විශ්වාස නැහැ කියන එකවත් කියන්න නෙවෙයි. නීත්‍යානුකූලව ජනාධිපතිතුමාගේ වචනය ගැසට් වෙනතුරු අපි බලාගෙන ඉන්නවා කියන එක ප්‍රකාශ කිරීම බව ඉතාමත්ම වගකීමෙන් මම මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරන්න කැමතියි. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීතුමන්ල මන්ත්‍රීතුමියන්ලගෙන් අවසරයි. විශේෂයෙන් මේ අවස්ථාවෙ සියලුම මන්ත්‍රීතුමන්ලගෙන් ප්‍රකාශ වුන පරිදි. මුලු ලෝකයම මේ කාලගුණ විපර්යාසවලට ලක්වෙලා තියෙනවා. ලංකාවට මේ දේශගුණ වෙනස්වීම දැඩිව බලපානවා. තවම අපට ඇගට දැනුනෙ නැතිවුනාට ඔබතුමන්ල කියපු විදිහට ඉදිරියට අපහසු තාවයට පත් වෙන්න පුලුවන්. අපට මතකයි හම්බන්තොට අම්බලන්තොට මෙවැනි නියගයක් ඇතිවුන වෙලාවෙ අපි මෙහෙන් වතුර කෑම බීම ගෙනිහින් දුන්නා. ඒ වගේම අම්පාර දිස්ත්‍රික්කයේ මෙවැනි දුර්භික්ෂයක් ඇතිවුන වෙලාවෙ අපි වතුර ගෙන ගියා. නමුත් තවම අපට අපේ බල ප්‍රදේශයට මේ නියගය තදින් ඇගට දැනිල නැහැ. දැනට අඩුවක්ව පවතින්නෙ බීමට තියෙන ජලය පමණයි. මේ වෙන කොට අපි ක්‍රියාමාර්ග කීපයක් අරගෙන තියෙනවා. බීමට ගන්න ජලය අපට නිකන් ලිංවලින් දෙන්න බැහැ. තමන්ගෙ ගෙදර ලිදෙන් වතුර බිව්වට වගකීමක් ඇතුව ජලය ලබා දෙන කොට වගකීමක් ඇතුව ජලය ලබා ගන්න ඕන. ඒක නිසා අපි බද්දෙගම ජල සම්පාදන මණ්ඩලයට ලිපියකින් දැනුම්දීල තියෙනවා. අපට ජලය ණය පදනම මත ලබාදෙන්න කියලා. දැන් අපි හැමදාම බද්දෙගමින් ජලය ලබා ගන්නවා. උඩුගම තියෙන එකෙන්

බවුසර් පුරව ගන්න අපහසුයි. ඔබතුමන්ල දැනුවත් නැතුව ඇති බද්දෙගමින් ගෙනැල්ල තමයි දැන් ජලය බෙදා හරින්නෙ. මේ වෙනකොට මාපලගම නාගොඩ ජලය නැත කියල දැනුම් දුන්නම. ප්‍රාදේශීය ලේකම් කාර්යාලෙ තිබුන ජල ටැංකි අරගෙන ඇවිල්ල ඒවට ජලය පුරවල බෙදා හරිනවා. ඒ වගේම පහුගිය දවස්වල පාසල්වල ජලය නැතිවුනාම ජලය ලබා දුන්නා. මේ වෙන කොටත් පන්සල්වලට කෝවිල්වලට ජලය ලබා දෙනවා. ඊලගට හැම තැනින්ම ජලය ඉල්ලනකොට අපට ලබා දෙන්න අපහසුයි. බවුසර් තිබුනට ජලය නැහැ. ඒ නිසා තමයි එදා අපේ වනිගරත්න මන්ත්‍රීතුමා කතා කරන කොට මම කිව්වෙ වතුර ගැනනම් කතා කරන්න එපා කියලා. එතකොටත් බවුසර් එක එක තැන්වල මම කෙහොම දෙන්නද?

ඒ එක්කම මම මේ අවස්ථාවෙ විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරනවා. අධික නියගය හේතුවෙන් ඇතිවී තිබෙන පානීය ජලය හා අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා වූ ජල ගැටලුවලින් පීඩාවට පත්වී ඇති බල ප්‍රදේශයේ මහජනතාව එකී පීඩාවන්ගෙන් මුදවාගෙන ජනතාවගේ සුබ සිද්ධිය සැලසීම සඳහාත් හදිසි අවශ්‍යතාවයන් සඳහාත් සභා අරමුදලින් රුපියල් ලක්ෂ දෙකක ප්‍රතිපාදන වෙන් කිරීමට. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොට්ඨාස 15 ම මන්ත්‍රීවරු ඉන්න නිසා මම මේ අවස්ථාවෙ කියනවා. තමන්ගෙ බල ප්‍රදේශයේ බීමට ගන්න පුලුවන් ජලය තියෙන ලිදක් තියෙනවා නම්, ඒක ශ්‍රමදාන මට්ටමින් හෝ වෙනත් ක්‍රමයකින් ඉහලා පිරිසිදු කරලා, පාවිච්චියට ගන්න කටයුතු කරන්න. ඒක ලිඛිතව අපට දැනුම් දෙන්න. මොකද සභාවෙ ඉන්න සේවකයො තුන් හතරදෙනා යොදවල ඒ කටයුතු කරන්න අපහසුයි. ඒ නිසා මහජන නියෝජිතයො හැටියට තමන්ගෙ බල ප්‍රදේශයේ බීමට ගන්න පුලුවන් ජලය තියෙන ලිදක් තියෙනවා නම් ඒක පිරිසිදු කරල ගන්න. ඒකට යන වියදම සභාවෙන් ගෙවන්න මම යෝජනා කරනවා. මම ඒ සඳහා ආණ්ඩුකාරතුමාගෙන් අවසර ලබා ගන්නම්. සභාවෙ කම්කරුවනුත් යොදවල හරි කරන්න එහෙම ස්ථාන තිනෙවනම් දැනුම් දෙන්න. නැත්නම් ජල ප්‍රශ්නය උග්‍ර වුනාම මට තමයි දෝෂාරෝපනය එන්නෙ. දැනට අපට ගන්න පුලුවන් ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා. අපේ මන්ත්‍රීවරු සමහර වෙලාවට ජල බවුසර් ඉල්ලවා. නමුත් දීගන්න අපහසුයි. මොකද මුදල් ගෙවල ඉල්ලන ඒවටත් අපට දෙන්න වෙනවා. මගුල් ගෙවල් මළ ගෙවල්වලට ඉල්ලුවම මේ අවස්ථාවෙ දෙන්න වෙනවා. මේ අවස්ථාවෙ සඳහන් කරන්න ඕන. ලොකු ජල බවුසරය ගේනකොට සුදු අලියෙක් කියල හිතුනට දැන් ඒකෙ වටිනාකම දැනෙනවා. අපේ ඉල්ලීම පිට උඩුගම රෝහලට දෙන්න ජනාධිපතිතුමා ඒ අවස්ථාවේදීම ක්‍රියාත්මක වී උඩුගම රෝහලට ජල බවුසරයක් ලබා දීමට කටයුතු කළේ. මොකද අතිගරු ජනාධිපතිතුමා රැස්වීමෙ ඉන්න අවස්ථාවෙදිම රෝහලට අපෙන් වතුර ඉල්ලුවා. රෝහලට වතුර නැතිවුනාම මම තවලමින් පවා වතුර ගෙනත් දුන්නා. පහුගිය දවස්වල දුරකතනයෙන් කතා කරල ගාල්ලෙ MOH ඔෆිස් එකටත් මෙහෙන් වතුර ඉල්ලුවා. එච්චරටම ජල ප්‍රශ්නය තියෙනවා. ඒ වගේම දැන් ඇති වී තිබෙන ලෝක වෛරස් වසංගතය පිළිබඳව අපි දැඩි සැළකිල්ලක් දක්වා ඒ පිලිබඳව දැඩි අවධානයෙන් සිටිය යුතු බවද මේ අවස්ථාවේ මතක් කරනවා.

ඊලගට ජනාධිපතිතුමාගෙ පැමිණීම පිළිබඳව කතා කළා. ජනාධිපතිතුමාගෙ වචනය විශ්වාස නැතුව නෙවෙයි. ඒක ගලේ කොටපු අකුරක් වගේ දැඩි විශ්වාසයි. මොකද එතුමා කිව්වොත් කිව්ව දේ කරනවා. එවැනි නායකයෙක්. විලේගේ මන්ත්‍රීතුමා අදහස් කළේ කටුපොල් තහනම නීත්‍යානුකූල භාවයට යන්න ඕන කියන එක. ජනාධිපතිතුමාගෙ වචනයත් කතාවත් නීත්‍යානුකූලයි. ඒ නිසා ඒකෙ කිසි ප්‍රශ්නයක් නැහැ. විලේගේ මන්ත්‍රීතුමා ඒක නිවැරදි කර ගත්තා. ඒ පිළිබඳව මම සතුටු වෙනවා. ජනාධිපතිතුමා ඇත්තටම එදා ආවෙ දේශපාලන රැස්වීමකට නෙවෙයි. ගාලු දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම තියන්න. ඒ අනුව ඒ කමිටුවට කැඳවන්නෙ නිලධාරීන්, ප්‍රාදේශීය සභා සභාපතිවරු, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරු ඇතුලු රාජ්‍ය නිලධාරි පිරිස් පමණයි. නමුත් අපට ජනාධිපතිතුමා ගෝනදෙනියට එන වෙලාවෙ හරි සම්බන්ධ වෙන්න හැකියාව තිබුනනම් වටිනවා. නමුත් අපට එතුමාගේ ක්ෂණික පැමිණීම නිසා ඒක කරගන්න අපහසු වුනා. මොකද එතුමාගේ ක්‍රියාදාමය වෙනස්.

එතුමා හොමදොලට 11.00 විතර ඇවිල්ලා 3.00 විතර වෙනකම් එක දිගට බොහොම සාවධානව ප්‍රශ්නවලට ඇහුම් කන් දීලා. ක්ෂණිකව දෙන්න පුලුවන් පිළිතුරු එවලෙම දුන්නා. විසඳුම් ලබා දීමට දිගු කාලයක් ගතවෙන ප්‍රශ්න සම්බන්ධව එතුමා අවධානය යොමු කරල කටයුතු කළා. විශේෂයෙන්ම ජල ප්‍රශ්නය පිළිබඳව එතුමාගෙ දැඩි අවධානයක් තියෙනවා. විශේෂයෙන්ම අජිත් මන්ත්‍රීතුමා කිව්ව වගේ මාර්ග සංවර්ධනයට වඩා වර්ථමාන රජය ජල ප්‍රශ්නය සම්බන්ධව උනන්දුවක් දක්වනවා. උග්‍ර ජල ප්‍රශ්නයක් ඉදිරියෙදි එන බව දන්නවා. ඒක නිසා ගාල්ල වක්වැල්ලෙ තියෙන ජල ව්‍යාපෘතිය තව කෝටි ගණනක මුදල් වැය කරල ඒක වැඩි දියුනු කරනවා. ඊලගට බලපිටිය ප්‍රදේශයේ අලුත්ගමටත් ඇල්පිටියෙ ජල පොම්පා ගාරයෙන් වතුර දෙනවා කිව්වා. එවලෙ අපි උඩුගම ජල ව්‍යාපෘතිය පිළිබඳවත් මතක් කළා. විශේෂයෙන්ම කියන්න ඕන. කවුරු කිව්වත් මේ ප්‍රජා ජල ව්‍යාපෘති අසාර්ථකයි. පහුගිය රජයෙන් කැප්පිටියගොඩ ජල ව්‍යාපෘතිය කරද්දි ඒක අසාර්ථක බව මම කිව්වා. ඒක අද ඔප්පු වෙලා ඉවරයි. අඩු වියදමින් කරන්න පුලුවන් හින්ද තමයි ප්‍රජා ජල ව්‍යාපෘති කරන්නෙ. මොකද ඒ ව්‍යාපෘතිවල ජලය පිරිපහදු කිරීමට අවශ්‍ය නොවන නිසා ඒක ලාභ වැඩක්. නමුත් ගඟෙන් අරගෙන කරන්න ගියාම මැෂින්වලට දැඩි වියදමක් යන නිසා ඒකට නොයා මේ භූගත ජලය අරගෙන කරන්න යන්නෙ. කැප්පිටියගොඩ කන්දක ඇති ජල පාරකින් ජලය ගන්නෙ. දැන් ජලය නැහැ. අද ඒකට වග කියන්න කෙනෙක් නැහැ. ප්‍රාදේශීය සභාවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් මේ ප්‍රජා ජල ව්‍යාපෘතියට සම්බන්ධ නැහැ. මම ඒක එදා ඇමතිතුමාට කිව්වා. සභාව සම්බන්ධ කරගන්නෙ පාරෙ කානු කපන්න අවසර ගන්න පමණයි. අන්තිමට අද ඒක මග නැවතිල තියෙනවා. අජිත් මන්ත්‍රීතුමා කියපු උඩුගම ජල ව්‍යාපෘතිය සම්බන්ධව අපි දැනුවත් නැහැ. ඉතිං ඒ වගේ කවුරුවත් වගකිවයුතු පුද්ලගයෙක් නැහැ. වගකිවයුතු පුද්ලගයෙක් නැතිවුනාම අසාර්ථකයි. කැප්පිටියගොඩ ව්‍යාපෘතියෙන් රුපියල් 1000 බැගින් මුදල් එකතු කරනවා. අන්තිමට ඒ මිනිස්සු අපට කියනවා. අනේ අපට වතුරත් නැත, සල්ලිත් නැත කියලා. ගිහින් බලන කොට මේ සඳහා ගෙනාපු ස්ලෝන් බටත් තැන් තැන්වල දාලා. හැම ව්‍යාපෘතියකම එහෙමයි. යටලමත්තෙත් එහෙමයි. මාපලගම පියල් මන්ත්‍රීතුමාලගෙ එකක් තිබුනා දැන් ඒකත් නැහැ. නාගොඩ ඉහල එකක් තිබුනා ඒකත් නැහැ. මම ඊයෙ පෙරේද දැක්කා මේ ව්‍යාපෘති අසාර්ථක බව පත්තරෙත් පලවෙලා තිබුනා. නමුත් මෙවැනි සමහර ව්‍යාපෘතිවල ඒ මිනිස්සු ලක්ෂ ගණන් ණය දෙන වැඩසටහනකුත් කරනවා. ඒ ව්‍යාපෘතියෙන් අක්කර 100 ක 200 ක වගාවත් කරනවා. ඒ ව්‍යාපෘතිය සාර්ථකයි. ගොඩක් ව්‍යාපෘති අසාර්ථකයි. ප්‍රජා ජල ව්‍යාපෘති එකේ අධ්‍යක්ෂ ජෙනරාල් හොඳ දක්ෂ නිලධාරී තුමෙක් ඉන්නෙ. ඒ නිසා අපිට ඒ පිළිබඳව සාකච්ඡා කොට අතරමඟ නැවතී ඇති එම ව්‍යාපෘති සාර්ථක කරගන්න පුළුවන් වේවි. මේ සම්බන්ධව අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමා අපට ඒ පිළිබඳව විශේෂිත කැඳවීමක් කොට ඉදිරියේදී ගන්න ක්‍රියාමාර්ගයන් පිළිබඳව දැනුවත් කළා.

ඒ වගේම තමයි පළමුවෙන්ම අපේ ලේකම් තුමියට කියන්න ඕන. අද මේ මන්ත්‍රීතුමන්ල මන්ත්‍රීතුමියන්ලගෙන් දොස් අහන්නෙ අද සභාවෙත් වතුර නැති නිසා. ඔබතුමිය ඒකට වගකියන්න ඕන. ඊලගට නිලධාරීන් නැහැ ඒකට වග කියන්න ඕන. මට ඔය හැම එකක්ම හොයල බලන්න බැහැ. ඒ නිසා ඒ ගැන දැඩිව ක්‍රියා කරන්න. මොකද මන්ත්‍රීතුමන්ල මන්ත්‍රීතුමියන්ල සභාපති හැටියට මට දොස් කියන්නෙ.

ඒ වගේම තමයි පහුගිය දවස්වල සභාව මූලික වෙලා මනුසත් දෙරණ මගින් වෛද්‍ය සායනයක් කළා. මේ වෙනුවෙන් සභාවෙන් කිසියම් මූල්‍ය ප්‍රතිපාදනයක් ලබා ගත්තෙ නැහැ. නමුත් සභාවෙ නම ප්‍රසිද්ධ වුනා. වෛද්‍ය සායනය හොඳට කෙරුනා. එක්දස් පන්සියයක් දෙදහසක් විතර ඒකෙන් ප්‍රයෝජන ගත්තා. ගම්මැද්දෙගොඩ, මලාමුර, කුරුපනාව, යන පාසල් තුනේ ළමයි 50 කට රුපියල් 3000 පමණ වටිනාකමක් ඇති බෑග් එකක් සමඟ පොත් පත් රුපියල් 1000 ක වවුචරයක් දුන්නා. පවුල් සෞඛ්‍ය සේවිකාවන් විසින් තොරා දුන් ගැබිණි මාතාවන් 50 කට රු. 5000.00 ක පමණ පෝෂණ මල්ලක් ලබා

දුන්නා. ඒ 50 දෙනාට අමතරව වැඩිපුර 10 දෙනෙක් ඇවිත් හිටියා. ඒ අයටත් එවලෙම පෝෂණ මල්ලක් ලබා දෙන්න කටයුතු කළා. ඇස් කණ්ණාඩි 600 ක් ලබා දුන්නා. නවසිය ගණනකගෙ වකුගඩු පරීක්ෂා කළා. දෙරණ කළමනාකරණ අධ්‍යක්ෂ මාධව මහත්තයගෙ ඉල්ලීම් උඩ සමිතිවලට ජෙනරේටර් 07 ක් ලබා දුන්නා. ගෙවල් 06 කට සූර්යය කෝෂ විදුලිය ලබා දුන්නා. සූර්යය කෝෂ 10 ක් දෙන්න තිබුනා. නමුත් දෙන්න ගෙවල් සොයා ගන්න බැරිවුනා. පස්සෙ තව දෙන්නෙක් ඉදිරිපත් වෙලා තියෙනවා. පසුව ඒක ලබා දීමට කටයුතු කරනවා. මේ වෛද්‍ය සායනය සඳහා රුපියල් 51000 ක් විතර අපටත් වියදම් වුනා. ඒ මුදලින් කේ. ඩී. වීරසිංහ අයතනය රුපියල් 20000 කුත් නාකිය දෙනියෙ වතු සමාගමෙන් රුපියල් 20000 කුත් අපට ලබා දෙන්න පොරොන්දු වුනා. ඉතිරි 11000 මගේ අතින් යොදනවා. මෙම සෞඛ්‍යය සායනය පවත්වා අප බල ප්‍රදේශයේ ජනතාවට කල උදාර සත්කාර්යය වෙනුවෙන් දෙරණ ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ මාධව මඩවල මැතිතුමා ඇතුළු සියළුම කාර්යය මණ්ඩලය සඳහා මී අවස්ථාවේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා.

ඊලගට වීථි ලාම්පු සවි කිරීම පිළිබඳව කතා කළා. නගරවලට දාන්න අලුත් වීථි ලාම්පු 50 ක් ගෙනාවා. හැම නගරයකම හැම මන්ත්‍රී කෙනෙක්ගෙම හැම ප්‍ර දේශයකම අවශ්‍යතාවය අනුව වීථි ලාම්පු ඉදිරියෙදි සවි කරගෙන යනවා. පළමුවෙන්ම උඩුගම සවි කළා. ඊලගට තල්ගස්වල දැන් මාපලගම සවි කරගෙන එනවා. යටලමත්තෙත් සවි කරගෙන යනවා. ඒ අනුව මන්ත්‍රීවරුන්ට පුලුවන් අලුත් වීථි ලාම්පු සවි කරන්න සුදුසු ස්ථාන පෙන්වා දෙන්න. ඒක සුදුසු ස්ථානයක් නම් සවි කර ගන්න පුලුවන්. ගම්වල උදවිය ගෙවල් ඉස්සරහටත් ඉල්ලනවා. එය ඉටු කිරීම අපහසුයි.

ඊලගට පතිනායන මන්ත්‍රීතුමා කියපු ඌරල ලිද පරීක්ෂා කරල බලන්න මම නිලධාරි යැව්වා. ඒ අදාල පුද්ගලයා ඒක හදල දෙන්න කැමැත්ත ප්‍රකාශ කළා. දැන් අපට මතක් වෙන්නෙ මේ පායන කාලෙ නිසා. මම අදාල පුද්ගලයට ඒක සකස් කරන්න කියලා පනිවිඩය යැව්වා. ඊලගට අපේ මන්ත්‍රීවරයෙක් ඇහුවා ගොනැගිලි සැලසුම් අනුමත කරන්න ප්‍රමාද වෙන්නෙ ඇයි කියලා. ඒක සභාවෙවත් සභාවෙ නිලධාරීන්ගෙ ප්‍රමාදයක්වත් නිසා නෙවෙයි ප්‍රමාද වෙන්නෙ. ඒ සඳහා අවශ්‍ය MBRO වාර්තා එන්න ප්‍රමාද වෙනවා. MBRO වාර්තාවක් එන්න සති තුනක් හෝ මාසයක් විතරයනවා. අන්න ඒ නිසයි ගොනැගිලි සැලසුම් අනුමත කරන්න ප්‍රමාද වෙන්නෙ.

ඒ වගේම අපේ ගරු මන්ත්‍රීතුමා කිව්ව වගේ උඩුගම පිට්ටනි පිළිබඳවත් ළල පිළිබඳවත් ඔබතුමන්ල අපට විතරක් ඒ දෝශාරෝපනය කරන්න එන්න එපා. මොකද උඩුගම මේ ඊයෙ පෙරේද වෙනකම් ඇමතිවරුත් හිටියා. සභාපතිවරුත් හිටියා. දැන් අපට විතරක් ඇගිල්ල දික් කරන්න එපා. අපි තවම සභාව පිහිටුවලා අවුරුදු දෙකයි. මෙච්චර කල් ඉදල දැන්ද පහසුකම් සහිත ක්‍රීඩාංගන නැතෙයි කියල තේරෙන්නෙ. අපේ පැත්තට බෝලෙ පාස් කරන්නෙ නැතුව. මන්ත්‍රීවරු ඒකත් පොඩ්ඩක් කල්පනා කරන්න ඕන. ගරු මන්ත්‍රීවරුනි මට පහුගිය දවස්වල ඔබතුමාල සඳහන් කල උඩුගම ඩිපෝ එක ලග ඇති පිට්ටනියෙන් පස් කියුබ් එක රුපියල් 200 ගානෙ සභාවට දෙන්න පුලුවන් කියලා. වීරසිංහ කොන්ත්‍රාත් සමාගමේ උප කොන්ත්‍රාත්කරුවකු කතා කළා. මම කිව්වා එහෙම දෙන්න බැහැ. තාක්ෂණ නිලධාරී යවල නීත්‍යානුකූලව කටයුතු කරන්නම් කියලා. ගෝනදෙනිය පිට්ටනියෙ ප්‍රශ්නයක් ඇති වුනා. ඊලගට සඳ රුස්ගම පිට්ටනියෙ ප්‍රශ්නයක් ආවා. ඉතිං ඕව දෙන්න ගියාම ප්‍රශ්න ඇති වෙනවා. ඊට පස්සෙ මට උඩුගම ත්‍රීවිල් සංගමයේ කෙනෙකුත් කතා කළා. අපට පිට්ටනිය පහත් කරල දෙන්න සභාපතිතුමා එතකොට මේ පසුත් දෙන්න පුලුවන් කියලා. ඊලගට අපේ හිටපු ඇමතිතුමා නිශාන්ත මහත්මයත් කතා කළා. මම කිව්වා ඇමතිතුමා සභාවට දාල සභවෙ අනුමැතිය අරගෙන තාක්ෂණ නිලධාරි යවල කර්මාන්තය ඒ විදිහට කරන්නම් කියලා. වෙරංග මන්ත්‍රීතුමත් කතා කළාට පස්සෙ මම කිව්වා එහෙනම් ලිඛිත ඉල්ලීමක් කරන්න කියලා. එතකොට සභාවට දාල අපට කටයුතු කරන්න පුලුවන් කියලා. ඒ අනුව තමයි වෙරංග මන්ත්‍රීතුමා අද ලිඛිතව මේක අපට ඉදිරිපත් කළේ. ඒ පිට්ටනිය පහත් කරන කොට වටපිටාවට හානි දායකද කියලා. තාක්ෂණ නිලධාරී යවල වාර්තාවක් ගන්න ඕන.

උපසභාපතිතුමා කිව්ව වගේ අපි ඇග්‍රිමන්ට් එකකට යන්න ඕන. හදිසියෙ පිට්ටනිය පහත් කරන කොට ගලක් මතු වුනොත් අපට දැන් තියෙන තත්වෙන් භාවිතා කරන්නත් බැරි වෙනවා. ඒක යම් ක්‍රමවේදයකට සාකච්ඡා කරල කරන්න ඕන. නමුත් පිට්ටනිය සංවර්ධනය කරන කොට එතන තත්වය මොකක්ද කියල බලන්න ඕන. කේ. ඩී. වීරසිංහලා තවම මගෙන් ඇහුවෙ නැහැ. ඒ අයගේ උප කොන්ත්‍රාත්කරුවකු තමයි රුපියල් 200 යෙ කතාව කිව්වෙ.

ඊලගට මාපලගම ආසිරි සර්විස් එක ලග වතුර බැස නොයන තැන කානුව සුද්ද කරද්දි පසුගිය දවසක අපේ පියල් මන්ත්‍රීතුමාට පොලීසි යන්නත් සිදු වුනා. ඒකට අපි මැදිහත් වුනා. ප්‍රාදේශීය ලේකම්, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු මහත්තය, ග්‍රාම නිලධාරී සමග ඔක්කොම එකතුවෙලා එතනට ගියා. ගිහිල්ල කානුව සුද්ද කරන්න ඉඩ නොදුන්නම මම මගේ සභාපති බලතල පාවිච්චි කරල මම කිව්වා කානුව කපන්න කියලා. නමුත් මේ වෙන කොට අද කානුව කපන්න ඉඩ දීල නැහැ. මම ඒ අදාල ආයතනයට කිව්වා පොලිසියෙ පැමිණිල්ලක් දාන්න කියලා.

ගරු මන්ත්‍රීවරුනි අපේ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුනා. අතිගරු ජනාධිපතිතුමා බලයට පත්වෙලා මොනවද කළේ කියලා. 50000 කට අධික උපාධි ධාරීන්ට රැකියා ලබා දුන්නා. මැතිවරණ කොමසාරිස්තුමාගෙ ඉල්ලීම අනුව පුහුණු වීම පමණක් මේ වෙන කොට නතර කරල තියෙන්නෙ. වැටුප් ගෙවනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. පක්ෂ පාට බැලුවෙ නැහැ. ඒ සම්බන්ධයෙන් අපේ ජනාධිපතිතුමාට ගෞරවණීය ස්තූතිය පුදකරනවා. ඊලගට ලක්ෂයකට රැකියා ලබාදීම. ඇත්තටම අපේ ගෝඨාභය මහත්තයගෙ ප්‍රතිපත්තිය තමයි. උගත් නූගත් සියලු දෙනාටම රටේ පුරවැසියන් හැටියට රැකියා අවස්ථාව ලබා දීම. ඒ පිළිබඳව අපි ඇත්තටම ගෞරව කරනවා ස්තූති කරනවා. සපිරිගමක් යටතේ මේ වෙන කොට ගමේ අවශ්‍ය පාරවල් සංවර්ධනය කරන්න කටයුතු සකස් කරල තියෙනවා. ඒ වගේම පහුගිය රජයෙන් දේශපාලන වුවමනාවට අවිධිමත් ලෙස රැකියා ලබා දී දැනට රැකියා අහිමි වී සිටින අයටත් යතා කාලෙදි රැකියා ලබා දෙන බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් පොරොන්දු වෙලා තියෙනවා.

විශේෂයෙන්ම මම ගරු මන්ත්‍රීවරුන්ට කියන්න කැමතියි. අද පරක්කු වෙලා සභාව පටන් ගත්තෙ. කරුණා කරල ගරු මන්ත්‍රීවරු නියම වෙලාවට එන්න. ඊලගට ගරු මන්ත්‍රීවරු බහැරව යනවනම් අවසර අරගෙන බැහැර යන්න කාරුණික වෙන්න. ලගදි එන මැතිවරණෙන් පස්සෙ පත්වෙන අපේ ආණ්ඩුව බොහොම ප්‍රගතිශීලී විදිහට අපි ගැන හිතයි කියල අපි හිතනවා. එහෙනම් අප්‍රේල් සභා වාරය 06 වැනිදා පැවැත්වෙනවා. ඉදිරියෙදි පැවැත්වෙන ඡන්දයෙදි අපි සියලු දෙනාම බොහොම එකමුතුව සහයෝගෙන් කටයුතු කරමු. ඒ වගේම මට අමතක වීමක් වුනා. පසුගියදා අපි ගිය අධ්‍යන චාරිකාව සියලුම මන්ත්‍රීතුමන්ල මන්ත්‍රීතුමියන්ල සහභාගි වුනානම් ඇත්තටම හොදයි. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා සාක්ෂි දරාවි බොහොම ප්‍රගතිශීලීව බොහොම සතුටෙන් බොහොම විනෝදකාමීව ගියා. අපේ පියල් මන්ත්‍රීතමා අපට බොහොම විනෝදාස්වාදය ලබා දුන්නා. විශේෂයෙන්ම කියන්න ඕන. අපේ උප සභාපතිතුමාට හොඳට සින්දු කියන්න පුලුවන්. ඒ අධ්‍යන චාරිකාව සංවිධානය කළ අපේ ලක්රුවන් මන්ත්‍රීතුමයි සුභාෂි මන්ත්‍රීතුමියයි ලස්සනට ඒක සංවිධානය කරල තිබුනා. අපේ රියදුරු මහත්තය වසන්ත ඒකට බොහොම සහය දැක්වුවා.සියලුම දෙනා සහභාගි වෙයි කියල බලාපොරොත්තු වුනත් සහභාගි වුනේ නැහැ. අම්පාර නගරාධිපතිතුමාට අපි විශේෂ ස්තූතියක් පුද කරන්න ඕන. එතුමා අපට ශාලා පහසුකම් ලබා දුන්නා. නොමිලේ බෝට්ටු සවාරියක් එක්කරගෙන ගියා. ඉතිං අපි බොහොම සතුටු වුනා. අපට ලාහුගල හිටපු උපසභාපතිතුමා බොහොම උදවු කළා. ඒ වගේම මුහුදු මහා විහාරෙ අපේ ගමේ හාමුදුරු කෙනෙක් ඉන්නවා. අපි එතනටත් ගියා. ඒ ගැන සතුටු වෙනවා. ඊලග සැරෙත් මෙවැනි අධ්‍යන චාරිකාව යන්න අපි බලාපොරොත්තු වෙනවා. චාරිකාව සඳහා මූල්‍ය ප්‍රතිපාදන සභාවෙන් ලබා දීමට කටයුතු කළා. ඒ පිළිබඳවත් මතක් කරමින් අද දින සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. සියලුම දෙනාට ලබන්නාවූ අලුත් අවුරුද්ද යහපත් වේවා.

ඡන්දයට යහපත් අන්දමින් මුහුණ දීමට  සියලුම දෙනාටම ශක්තිය ලැබේවා. අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ට හොඳ ශක්තිමත් රජයක් බිහිකරන්න වාසනාව ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී	දිනය:- ..............................